සීමාසහිත ලංකා පොහොර සමාගම
வரையறுக்கப்பட்ட இலங்கை உரக்கம்பனி
CEYLON FERTILIZER COMPANY LTD

The Foundation of Sustainable Agriculture in Sri Lanka

ශ්‍රී ලංකාවේ තිරසර කෘෂිකර්මාන්තයේ පදනම

இலங்கையின் நிலையான விவசாயத்தின் அடித்தளம்

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
ANNUAL REPORT
2018

ශ්‍රී ලංකාවේ තිරසර කෘෂිකර්මාන්තයේ පදනම

කෘෂිකර්ම අමාත්‍යාංශය
288, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය,
ශ්‍රී ලංකාව

දු.ක. : +94 11 2 868 920 | ෆැක්ස් : +94 11 2 863 497
විද්‍යුත් තැපෑල : info@agrimin.gov.lk | වෙබ් අඩවිය : www.agrimin.gov.lk

පිටපත් රචනය, ජායාරූප,
පිටු සැකැස්ම සහ නිර්මාණය

කලාව

79, විජේරාම පාර, නුගේගොඩ, ශ්‍රී ලංකාව
+94 11 302 4950 | +94 71 224 11 00
kalawainfo@gmail.com

වාර්ෂික වාර්තාව 2018

සීමාසහිත ලංකා පොහොර සමාගම

ISO/IEC: 1705
TL 041-01

සීමාසහිත ලංකා පොහොර සමාගම
ලක් පොහොර ස්වර්ණ ජයන්ති මාවත, හුණුපිටිය, වත්තල, ශ්‍රී ලංකාව.
දුරකථන : 011-2 930 298 / 99 | ෆැක්ස් : 011-2 947 763
විද්‍යුත් තැපෑල : info@lakpohora.lk | වෙබ් අඩවිය : www.lakpohora.lk

සම්මාන



ISO 14001: 2004
පාරිසරික තත්ත්ව සහතිකය



වාර්ෂික වාර්තා සම්මාන 2014
අනුකූලතා සම්මානය



JASTECA CSR සම්මාන 2014
කුසලතා සම්මානය



CNCI ඇවිවර්ස් සම්මානය 2014
ජාතික මට්ටමේ කුසලතා සම්මානය



ජාතික කෘෂි ව්‍යාපාර සම්මාන 2014
රිදී සම්මානය

පටුන

වසර 54ක් පුරා දේශය සාරවත් කරමින්	06	සාමාන්‍යාධිකාරීතුමාගේ ප්‍රකාශය	22
ආයතනික තොරතුරු	08	අධ්‍යක්ෂ මණ්ඩලය	26
අප ආ ගමන් මගේ සංධිස්ථාන	12	ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම	34
දැක්ම හා මෙහෙවර	14	ආයතනයේ සංවිධාන ව්‍යුහය	36
මූල්‍යමය අවධාරණයන්	17	කළමනාකාරීත්ව විමසුම සහ විශ්ලේෂණය	40
පසුගිය වසර දහය සඳහා මූල්‍ය සාරාංශය	18	මානව සම්පත් කළමනාකරණ වාර්තාව	46
සභාපතිතුමාගේ පණිවුඩය	20	ආයතනික පාලනය	49



ජාතික ඵලදායිතා සම්මාන 2012/13
දෙවන ස්ථානය



ශ්‍රී ලංකා ජාතික
තත්ත්ව සම්මාන 2013
රිදී සම්මානය



SLCBCC ව්‍යාපාරික තරුව 2014
රිදී සම්මාන



අකිමොටෝ එස්5 සම්මාන 2014
කුසලතා සම්මානය



ජාතික ව්‍යාපාර විශිෂ්ඨත්ව
සම්මාන 2014
රන් සම්මානය



මානව සම්පත් කළමනාකරණ
සම්මාන 2013
රිදී සම්මානය

අවදානම් කළමනාකරණ වාර්තාව	51
විගණන සහ අවදානම් කළමනාකරණ කමිටුවේ වාර්තා	54
මූල්‍ය ප්‍රකාශන	68
අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය	71
සභාපතිතුමාගේ සහ මූල්‍ය කළමනාකරුගේ වගකීම පිළිබඳ ප්‍රකාශය	72
ස්වාධීන විගණකවරයාගේ වාර්තාව	73
සවිස්තරාත්මක ආදායම පිළිබඳ ප්‍රකාශනය	76
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය	77
ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය	78
මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශනය	79
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	80
පෙරකලාසි ආකෘතිය	105

1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ ජර්මානු රජයේ මූල්‍ය හා තාක්ෂණීය ආධාර ඇතිව 1964දී සීමාසහිත ලංකා පොහොර සමාගම ස්ථාපිත කරන ලදී. මෙය කෘෂිකාර්මික අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර එහි පූර්ණ හිමිකාරිත්වය ශ්‍රී ලංකා රජය සතු වේ.

එහි මූලික කාර්යභාරය වන්නේ ශ්‍රී ලාංකික කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පොහොර අවශ්‍යතා සපුරාලීම වන අතර මෙම වගකීම අපි විසින් ඉටු කරමින් සිටිමු. එහිදී අපගේ ප්‍රමුඛ අවධානය යොමු කරන්නේ නිමැවුමේ ගුණාත්මකභාවය පිළිබඳවය. මෙම වගකීම අප කාලාන්තරයක් තිස්සේ රසායනික පොහොර ආනයනය කිරීම, ගුණාත්මක පොහොර නිපදවීම සහ මිශ්‍ර කිරීම තුළින් සිදු කරන අතර අපගේ ප්‍රාදේශීය පොහොර ගබඩා ජාලය ඔස්සේ අපගේ පොහොර නිෂ්පාදන ලංකාව පුරාම බෙදාහැරීම සිදු කරයි.

එවකට රාජ්‍ය ප්‍රතිපත්තිය වූ රජය සතු සංස්ථාපිත ආයතන, 1987 අංක 23 දරණ සමාගම් පනත රජයේ හිමිකාරිත්වය ඇති ව්‍යාපාරික ආයතන බවට පත් කිරීමේ වැඩපිළිවෙල යටතේ, අප ආයතනය එහි ආරම්භක නාමය වෙනස් නොකර පෙර කී සමාගම් පනත යටතේ 1992 සැප්තැම්බර් 15 දින නැවත ලක් පොහොර සමාගම ප්‍රතිස්ථාපිත කරන ලදී. මේ වනවිට අප සමාගම 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇත.

කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ඇති රාජ්‍ය ව්‍යාපාර ඒකාබද්ධ කිරීමේ වැඩපිළිවෙල යටතේ තමන්කඩුව කෘෂි පොහොර සමාගම , ලක් පොහොර සමාගම යටතට 2008 දී පවරා ගන්නා ලදී. මේ වන විට එය ලක් හොහොර සමාගමේ පොළොන්නරුව ප්‍රාදේශීය පොහොර ගබඩා සංකීර්ණය ලෙස ක්‍රියාත්මක වේ.



වසර
54ක්

පුරා දේශය සාරවත් කරමින්



වී වගාව සඳහා

භාවිතා කරන යූරියා, මියුරිකේට් පොටෑෂ්, ට්‍රිපල් සුපර් පොස්පේට් සහ සින්ක් පොස්පේට් යන සෘජු පොහොර වර්ග අප විසින් ගොවීන් හට සපයනු ලබයි.

ආයතනික
තොරතුරු

සමාගම් නාමය

සීමාසහිත ලංකා පොහොර සමාගම

සමාගමේ ලියාපදිංචි අංකය

PB 499

නෛතික ස්වභාවය

ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කරන ලද මහා භාණ්ඩාගාරයේ ලේකම්ගේ පූර්ණ හිමිකාරිත්වය සහිත වගකීමෙන් සීමිත සමාගමකි.

ලියාපදිංචි කාර්යාලය සහ ලිපිනය

සීමාසහිත ලංකා පොහොර සමාගම
ලක්පොහොර ස්වර්ණ ජයන්ති මාවත,
හුණුපිටිය, ශ්‍රී ලංකාව.
දුරකථන : +94 11 2 930 298 / 99
ෆැක්ස් : +94 11 2 947 763
විද්‍යුත් තැපෑල : info@lakpohora.lk
වෙබ් අඩවිය : www.lakpohora.lk

අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපති

රෝෂණ වඩුගේ මහතා

(19.02.2015 – 31.03.2018)

ක්‍රියාකාරී අධ්‍යක්ෂ

මාධව වත්තේගම මහතා (19.02.2015 – 31.03.2018)

රවී ක්‍රිෂාන් ජයවර්ධන මහතා (24.08.2017 – 31.03.2018)

අධ්‍යක්ෂවරු

ජේ.එම්.එස්.ඩී. රත්නායක මහත්මිය අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
(10.03.2015 - 31.03.2018)

ඩී.කේ.එම්.ආර්. කුමාරසිරි මහතා කෘෂිකර්ම අමාත්‍යංශය
(27.11.2017 - 31.03.2018)

අනෝජා හේරත් මහත්මිය අධ්‍යක්ෂ - සංවර්ධන
(01.04.2017 - 31.10.2017)

හේමක ලසිත් බාලසූරිය මහතා (19.02.2015 - 31.03.2018)

උපුල් පීරිස් මහතා (19.02.2015 - 31.03.2018)

සමාගම් ලේකම්

කන්සල්ටන්ට්ස් ඇන්ඩ් කෝපරේට් සෙක්‍රිටරීස් (පෞද්ගලික) සමාගම

කළමනාකරණ කණ්ඩායම

ප්‍රියන්ත සමරවීර මහතා සාමාන්‍යාධිකාරී (වැඩබලන)
කළමනාකරු (මූල්‍ය)

බී. ඩී. එල්. කුමාරසිරි මහතා ප්‍රධාන අභ්‍යන්තර විගණක

ප්‍රියන්ත පෙරේරා මහතා කළමනාකරු (බෙදාහැරීම්)

ඉංජිනේරු ඩී. එම්. එන්. ඒ. දිසානායක මහතා කළමනාකරු (තාක්ෂණික)

ආර්. පී. එස්. බෝධිපාල මහත්මිය කළමනාකරු (විකුණුම් සහ අලෙවි ප්‍රවර්ධන)

එම්.එල්.යූ. පෙරේරා මහත්මිය කළමනාකරු (රසායනාගාරය)

ෆාහිම් අලවුඩීන් මහතා කළමනාකරු (විශේෂ ව්‍යාපෘති)

සී. පී. ප්‍රේමතිලක බුලත්සිංහල මහතා කළමනාකරු (වැඩබලන)
(පරිපාලන සහ මානව සම්පත්)

පී. ජී. සමන් මහතා කළමනාකරු (වැඩබලන)
(ප්‍රසම්පාදන සහ ආනයන)



තේ වගාව සඳහා

ටී-65, ටී-200, ටී-750, යූටී-1625, යූටී-397, යූටී-752,
වීපීවිල්සී-880, වීපීවිල්සී-945, වීපීයූවිම්-910, යූ-625,
එස්ටී/යූවිම්-400, එස්ටීයූවීවී-435, යූ-709

54 වසරක් දේශය සාරවත් කරමින්
අප ආ ගමනේ සංඩිස්ථාන

1964

ලංකා පොහොර සංස්ථාව, ගරු. ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මැතිතුමා නායකත්වය දරන කෘෂිකර්ම, ආහාර හා සමූපකාර අමාත්‍යංශය යටතේ එම අමාත්‍යංශයේ ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් සෑම් සිල්වා මහතා සමාරම්භක සභාපති ලෙස, ආරම්භක ආයෝජනය ලෙස රු.58,000.00 ක් යොදවා ස්ථාපිත කරල ලදී. ආයතනයේ ප්‍රධාන කාර්යාලය ඩාර්ලි පාරේ පිහිටි අතර මෙට්‍රික් ටොන් 80,000 ක් හැසිරවිය හැකි ගබඩාවක් හුනුපිටියේ පිහිටුවන ලදී. සංස්ථාවට වෑන් රථයක් කුලියට ලබා ගැනීමට මුදල් නොමැති වූ නිසා එවකට ආයතනයේ සමාරම්භක සේවකයෙක් වූ කේ.කේ. ඇන්තනී මහතා වේවැල් වලින් සාදන ලද කූඩ 12ක් අළුත ස්ථාපිත වූ ආයතනය වෙනුවෙන් රැගෙන එම කූඩ බයිකලයේ වටා විල්ලා ගෙන ප්‍රධාන කාර්යාලය දක්වා බයිසිකලය පැද්දේය

1966

පැයට මෙට්‍රික් ටොන් 35ක මිශ්‍ර කිරිමේ ධාරිතාවක් සහිතව හුනුපිටියේ දී මිශ්‍රණ කටයුතු අරඹන ලදී. මෙමගින් මෙට්‍රික් ටොන් 70,000 ක් මිශ්‍ර කරන ලදී. මේ සමඟ එවකට පෞද්ගලික අංශය සතු වූ පොහොර ආනයනය, නිෂ්පාදනය සහ බෙදාහැරීම් ඒකාධිකාරය සදහටම බිඳ දමන ලදී.

1970

සංස්ථාවේ පොහොර "ලක් පොහොර" වෙළඳ නාමය යටතේ අළෙවි කරන ලදී.

1976

බලපත්‍ර ක්‍රමය අහෝසි කළ අතර පොහොර සහනාධාරය හඳුන්වා දෙන ලදී.

1977

විවෘත ආර්ථිකය හඳුන්වා දීමත් සමඟ, අංශයේ නායකත්ව තත්ත්වය සංස්ථාවට අහිමි විය. පෞද්ගලික අංශයේ තරඟයට දැඩිව ප්‍රතිචාර දක්වමින් සංස්ථාවට එහි බෙදා හැරීමේ ජාලය පුළුල් කරන ලද අතර මේ දක්වා එය සිදු වනුයේ සමූපකාර, කෘෂිකාර්මික සේවා මධ්‍යස්ථාන හා බලයලත් පෞද්ගලික අලෙවි නියෝජිතයින් තුලින් පමණි.

1978

ජර්මානු රජයෙන් ලැබුනු රු. මිලියන 28 ක ප්‍රධානයක් හා තාක්ෂණික අධාර යටතේ ප්‍රදේශීය ගබඩා සංකීර්ණ මාහෝ, වැලිගම, පොළොන්නරුව සහ අනුරාධපුර ඉදිකිරීම් ඇරඹීය.

1980

අලුතින් ස්ථාපනය කරන ලද ගබඩා සම්පූර්ණ සේවයට එක් කළ අතර ඒවායේ ධාරිතාවය මෙට්‍රික් ටොන් 13,000 ක් සහ 16,000 ක් අතර විය. පළමුවන වතාවට ප්‍රචාරන පත්‍රිකා සංස්ථාව විසින් සකසා බෙදා හරින ලදී.

1986

රජය විසින් පොහොර බෙදාහැරීම ප්‍රශස්ත කිරීමට පොහොර සම්බන්ධීකරණ කමිටුව පිහිටුවන ලදී. මෙම කමිටුව හරහා පොහොර භාවිතය ගැන පළමු අධ්‍යාපන, පුහුණු සහ දැනුවත්කිරීමේ වැඩසටහන් කෘෂිකාර්මික ප්‍රජාව ඉලක්ක කොට සිදු කරන ලදී.

1988

ජර්මානු රජයේ රු. මිලියන 22 ක් වූ ප්‍රතිපාදන යොදා ගෙන හුනුපිටියේ පිහිටි මධ්‍යම ගබඩා සංකීර්ණය නවීකරණයට ලක් කළේය. එයට පැයකට මෙට්‍රික් ටොන් 30 ක ධාරිතාවයකින් යුතු නව මිශ්‍රණ යන්ත්‍රයක් හඳුන්වා දීය.

1992

රජය විසින් සංස්ථාව සතු වත්කම් අලෙවි කිරීමේ වැඩපිළිවෙලත් සමඟ මෙම වසර වැදගත් වසරක් විය. හුනුපිටිය සංකීර්ණය ලංකා පොහොර සංස්ථාව බවට පත් වූ අතර අනෙකුත් ගබඩා වල භූගෝලීය පිහිටීම මත වගකීමෙන් සීමිත සමාගම් 5 ක් ඇති කළේය. පසුව මෙයින් තුනක් පෞද්ගලික අයිතියට විකිණූ අතර තමන්කඩුව පොහොර සහ ලංකා පොහොර සංස්ථාව වෙන් වෙන් වූ ආයතන 2 ක් ලෙස කටයුතු කළේය.

1994

පොහොර සහනාධාරය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමේ වගකීම ලක් පොහොර සංස්ථාවට පැවරිය. ගෙවුනු යුධ වසරවලදී, සැලකිය යුතු ත්‍රස්තවාදී බලපෑම් නොසලකා සංස්ථාව විසින් දුෂ්කර හා සෘජුව සම්බන්ධ නොවූ ප්‍රදේශ වලට පොහොර සැපයීමට මහන්සි වී කටයුතු කරන ලදී.

2002

ලංකා පොහොර සංස්ථාවේ චැතම් මාවතේ පිහිටි ප්‍රධාන කාර්යාලය හුනුපිටිය සංකීර්ණයට මාරු කරන ලදී.

2005

එවකට පැවැති රජය විසින් ඉතිහාස ගත පොහොර සහනාධාර වැඩපිළිවෙල අරඹන ලදී. ගොවීන් 70% කට සහනාධාරයක් ලබා දෙමින්, කි.ග්‍රෑ. 50 පොහොර මිටියක් රු. 350.00 ට ලබා දීමේ දැවැන්ත වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළේය.

2007

ආයතනය සතු මිලියන 330 ක ශුද්ධ වත්කම් රතු කලාපයට යොමු කරමින්, ආයතනය දැඩි මූල්‍ය අවධානයකට ලක් විය.

2008

රජය විසින් රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය නොකරනවා කියන පොරොන්දුව යටතේ ආයතනයට නව කළමනාකරණ මණ්ඩලයක් පත් කරන ලද අතර සමාගම නැවත 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලදී.

2010

බුද්ධිමත් තීරණ මත ඉදිරියට ගිය ආයතනය පැවති අවදානම් රතු කලාපයෙන් මිදීම ආරම්භ විය. සමාගම පරිවර්ථනයකට ලක් කරමින්, 2013 වන විට විය සතුව ශුද්ධ වත්කම් රු. මිලියන 1606 ක් සතු වූ අතර, මහා භාණ්ඩාගාරයට රු. මිලියන 39 ක මුදලක් ලාභ ලෙස ගෙවන ලදි.

2013

GPS තාක්ෂණය සහිත ප්‍රවාහන ජාලයක් සේම රට පුරා පැතිරුන ඉහල ගුණත්වයෙන් යුතු පොහොර ගබඩා 52 ක් පිහිටුවීය.



අරමුණ

ඉහළම ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව නිෂ්පාදනය කරන ලද රසායනික සහ කාබනික පොහොර ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රජාව වෙත සැපයීම

දැක්ම

ශ්‍රී ලාංකික පොහොර වෙළෙඳපොළ නියමුවා ලෙස කෘෂි ක්ෂේත්‍රය හා ඒ ආශ්‍රිත නව නිපැයුම් සේවා හා යෙදවුම් සපයන විවිධාංගීකරණය වූ නව ලොවට ගැළපෙන ප්‍රමුඛතම ආයතනය වීම.



මෙහෙවර

රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව ලක් පොහොර පවුලේ උපරිම දායකත්වයෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම හා ගොවිජන සේවා ක්ෂේත්‍රයේ නිෂ්පාදන, ආදායම හා ලාභදායිත්වය වැඩි කිරීම සඳහා බහුවිධ වෙළෙඳපොළ ඉල්ලුමට සරිලන පොහොර නිෂ්පාදනය හා අලෙවිය තුළින් සමාගමේ ලාභදායී තිරසාර පැවැත්ම තහවුරු කිරීම.

වටිනාකම්

පාරිසරික තිරසාරත්වය පවත්වාගැනීම සහ බිම් මට්ටමෙන් ගොවීන් සමඟ සම්බන්ධව කටයුතු කිරීම අපගේ මූලික වටිනාකම් වන අතර, අප විසින් අපගේ අනාගත නිෂ්පාදන මාලාව ගොඩනගනුයේ ඒවා මතය.



වෙනත් වගාවන් සඳහා

එළවළු, පලතුරු, අල වර්ග, මිරිස්, කව්පි, රටකජු, මුං ඇට සහ
ඉරිඟු යනාදිය සඳහා විශේෂයෙන්ම මිශ්‍ර කරන ලද පොහොර

මූල්‍ය අවධාරණයන්



ආදායම් අවධාරණයන් හා අනුපාත		2018	2017	වෙනස
		රුපියල්	රුපියල්	%
ආදායම	රු.	3,373,989,990	2,350,637,985	44%
බදු පෙර ලාභය	රු.	39,346,123	127,804,541	-69%
බදු පසු ලාභය	රු.	(24,536,064)	139,592,032	-118%
කොටසක ඉපැයුම	රු.	(0.49)	2.78	-118%
වත්කම් මත ප්‍රතිලාභ	%	-8.00%	0.39%	-2151%
හිමිකම් මත ප්‍රතිලාභ	%	0.42%	2.36%	-82%

මූලයම තත්ත්ව අවධාරණයන් හා අනුපාත				
සමස්ත වත්කම්	රු.	29,476,571,820	35,608,679,679	-17%
සමස්ත හිමිකම්	රු.	5,806,434,717	5,504,165,203	5%
නිකුත් කළ කොටස් සංඛ්‍යාව	සංඛ්‍යාව	50,245,608	50,245,608	-
කොටසකට ශුද්ධ වත්කම්	රු.	116	118	-2%

පසුගිය දස වසර තුළ මූල්‍ය අවධාරණයන්

	2009 SLAS (For 7 Month)	2010 SLAS	2011 SLFRS	2012 SLFRS	2013 SLFRS	2014 SLFRS	2015 SLFRS	2016 SLFRS	2017 SLFRS (Restate)	2018 SLFRS
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය										
ආදායම	1,370,080,315	1,904,299,851	2,246,402,738	2,496,268,383	2,450,132,816	2,563,549,727	3,835,989,834	4,242,769,733	2,350,637,985	3,373,989,990
දළ ලාභය	221,286,371	322,826,103	414,124,001	310,189,751	621,684,097	575,467,461	855,558,167	1,097,447,923	231,025,777	31,497,063
වෙනත් ආදායම්	130,892,642	132,287,779	157,164,017	197,912,757	108,809,998	93,172,755	142,197,667	122,926,594	29,096,825	45,440,368
බදු පෙර ලාභය	35,088,271	42,411,705	73,979,009	159,544,495	199,894,319	241,328,764	520,200,738	836,604,005	127,804,541	39,346,123
බදු	(25,092,763)	(35,000,000)	(43,666,668)	(52,315,944)	(73,037,738)	(62,869,313)	134,184,888	(233,331,176)	11,787,491	(63,882,188)
බදු පසු ලාභය	9,995,508	7,411,705	30,312,341	107,228,551	126,856,581	178,459,452	386,015,851	603,272,829	139,592,032	(24,536,064)
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය										
ප්‍රකාශිත ප්‍රාග්ධනය	502,456,080	502,456,080	502,456,080	502,456,080	502,456,080	502,456,080	502,456,080	502,456,080	502,456,080	502,456,080
ප්‍රත්‍යාගණන සංචිත	1,616,307,519	1,986,087,280	1,986,087,280	1,836,179,780	1,835,723,580	1,835,723,580	1,833,071,080	1,833,071,080	2,506,976,187	2,511,388,189
රඳවා ගත් ඉපැයුම්	201,385,007	208,796,713	224,109,054	1,285,578,730	1,397,891,510	1,500,363,432	1,869,914,195	2,392,840,203	2,899,788,327	2,792,590,448
මුළු හිමිකම්	2,320,148,607	2,697,340,072	2,712,652,414	3,624,214,590	3,736,071,170	3,838,543,092	4,205,441,355	4,728,367,363	5,909,220,594	5,806,434,717
දේපළ, පිරියත හා උපකරණ	1,686,442,553	1,902,075,430	1,895,412,152	1,908,557,760	1,882,887,059	1,879,174,306	1,865,055,225	1,838,655,988	2,683,237,393	2,636,328,307
නොනිමි ප්‍රාග්ධන වැඩ	20,024,735	15,934,103	542,901	-	-	-	29,982,587	32,152,294	21,960,737	22,316,114
විලම්භිත බදු වියදම	-	-	-	4,862,949	73,037,738	5,561,375	37,484,888	-	-	-
භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය	172,614,796	332,205,456	434,767,955	471,025,753	338,620,163	369,088,140	489,125,747	514,903,604	532,548,539	439,277,353
අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-	669,017	344,717	115,417	79,667	-	-
විලම්භිත බදු වත්කම්	-	-	76,814,523	71,951,574	-	-	-	-	-	-
ශුද්ධ ජංගම වත්කම්	610,949,150	12,476,640,540	6,975,143,544	1,706,541,296	1,915,693,141	2,025,842,182	2,417,551,302	2,963,028,124	29,833,731,662	16,516,623,681
විලම්භිත බදු බැරකම්	-	-	-	-	1,086,164	6,647,539	44,132,427	40,928,542	251,974,437	242,009,768
කෙටි/ දිගුකාලීන ණය	-	11,837,929,928	5,369,929,928	-	-	17,728,367,618	31,304,325,268	-	-	-
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය										
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	(23,925,719)	(12,169,047,254)	(16,012,155,140)	12,695,227,509	(9,517,159,808)	(5,094,105,859)	(9,560,794,959)	4,859,448,679	11,542,320	8,052,725,854
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	(85,865,511)	12,216,587,459	(36,565,665)	(8,458,411)	83,232,936	(498,105,232)	(1,021,212,231)	(1,086,700,012)	(908,705,035)	278,487,418
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	46,739,763	(159,725,222)	16,168,483,382	(13,079,312,780)	9,575,483,282	5,654,013,585	10,614,850,014	(3,843,885,272)	(7,628,967,604)	834,304,831
වෙනත් තොරතුරු										
කොටසක ඉපැයුම (රු.)	0.22	0.17	0.60	2.13	2.52	3.55	7.68	12.01	2.78	(0.49)
කොටසකට ලාභාංශය (රු.)	0.06	0.06	0.18	0.18	0.76	1.05	2.30	3.60	0.83	(0.15)
කොටසකට ශුද්ධ වත්කම් (රු.)	46	54	54	72	74	76	84	94	118	116
ජංගම අනුපාතය (වාර ගණන)	1.04	2.09	1.29	1.08	1.08	1.06	1.06	1.09	9.59	2.60



පොල් සඳුහා

වයි.පී.එම්. (ඩබ්ලිව්) (ඩී), ඒ.පී.එම්. (ඩබ්ලිව්)/(ඩී)
රා මැදීම (ඩබ්ලිව්)/(ඩී)

සභාපතිතුමාගේ පණිවුඩය

ශ්‍රී ලාංකික ගොවි ජනතාවගේ කෘෂිකාර්මික යෙදවුම් අවශ්‍යතාවය සපුරාලන ප්‍රමුඛම රාජ්‍ය ආයතනය ලෙස, ලක් පොහොර සමාගම දශක පහකට වඩා වැඩි කාලයක් කටයුතු කරන්නේය. ලංකා පොහොර සමාගම සිය කාර්යභාරය ඉටු කරද්දී, නිරන්තරයෙන් කෘෂිකාර්මිකයට අදාල රාජ්‍ය ප්‍රතිපත්තියට, විශේෂයෙන් පොහොර සඳහා වූ රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුව පෙළගැසී කටයුතු කරනු ලබන්නේය.

දශක ගණනාවක් පැරණි භාවිතා කරන පොහොර වර්ග වලට අදාල කෘෂිකාර්මික ක්‍රමයන් මුළුමනින්ම ප්‍රතික්ෂේප කරමින්, රාජ්‍ය ප්‍රතිපත්තියේ දිශානතියේ වෙනසක් මෙම වසර තුල දැකගත හැකි විය. මීට අමතරව, අළුත් ප්‍රතිපත්ති පැකේජය තුළින් පොහොර සහනාධාරය ඉවත් කළ අතර පොහොර නිෂ්පාදකයන්ට ඒ හා සමාන ලෙස විවෘත වෙළඳපලේ තරඟ කරන්නට සිදුවිය. මේ සියල්ලෙහිම අරමුණ වූයේ, රට රසායනික පොහොර භාවිතයෙන් ඉවත් කර කාබනික පොහොර භාවිතය දෙසට 'වස විස නැති රටක්' වැඩ සටහන තුළින් යොමු කිරීමය.

සංවර්ධනයේ කල්පවත්නා බව සහ රට තිරසාරීභාවය සඳහා වූ ගෝලීය තෙරපුමට පෙළගැස්සවීම සඳහා මෙම ප්‍රතිපත්තිමය වෙනස්කම් වල සම්පූර්ණ අත්‍යවශ්‍යභාවය මැනවින් වටහා ගැනුනු අතර නමුත්, එක් රැයකින් හා සමානව සිදුවූ මෙම වෙනස නිසා සංස්ථාවට සිය ප්‍රාථමික නිෂ්පාදන සඳහා එකතු කිරීම් කිරීමට සේම, යම් අවස්ථාවලදී වෙනස් කිරීම් කිරීමට සිදුවූවා පමණක් නොව, පෞද්ගලික අංශය හා සෘජුව තරඟ කිරීමේ සිට ව්‍යාපාරික හා අලෙවිකරණ ආකෘතිය වෙනස් කිරීමට ද අවශ්‍ය විය.

පෙර සෑම අවස්ථාවකදී මෙන්ම, සමාගම මෙම ප්‍රතිපත්ති වෙනසට කඩිනම් ප්‍රතිචාර දැක්වූවා සේම, එය වෙනස්වුනු ව්‍යාපාරික සංදර්භය තුළ ඉතා කෙටිකාලයකින් නැවතත් සිය වෙළඳපල ස්ථානය ස්ථාපිත කර ගැනීමට අවශ්‍ය උපරිමය සිදු කරන ලදී. කෙසේ වුවද රසායනික පොහොර වලින් කාබනික පොහොර වලට මාරු වීම හා පොහොර සහනාධාරය මුදල් ලෙස ගොවීන්ට ලබා දීම තුළින් සියළු පොහොර වර්ග වල විකුණුම් හි සැලකිය යුතු අඩු වීමක් සිදු විණි. මෙම අඩුවීම තවත් ප්‍රගුණ වූයේ රට තුළ කෘෂිකාර්මික හදබිම් තුල පැවැති නියං තත්ත්වයන් නිසාය.

මෙම සෘණාත්මක කාරනා එකතුවීමේ ප්‍රතිඵලය වූයේ සියළු මූල්‍ය දර්ශකවල විශාල අඩු වීමක් වාර්තා වීමය. මෙම

දශක ගණනාවක් පැරණි භාවිතා කරන පොහොර වර්ග වලට අදාල කෘෂිකාර්මික ක්‍රමයන් මුළුමනින්ම ප්‍රතික්ෂේප කරමින්, රාජ්‍ය ප්‍රතිපත්තියේ දිශානතියේ වෙනසක් මෙම වසර තුල දැකගත හැකි විය.

සලකා බලන වසර තුල ආදායම 44%ක් වැඩි වූ අතර, පරිපාලන වියදම් 7%කින් වැඩි වී ඇත. බදු පසු ලාභය 69% කින්ද, දළ ලාභය 89% ක් වැනි ප්‍රතිශතයකින් අඩු වූයේ සංසන්දනාත්මකව සංකෝචනය වූ තරගකාරී වෙළඳපල තුළ ලාභ ආන්තික අවම වීම නිසාය. සමාගමේ වත්කම් ශක්තිමත් අගයක් වූ බිලියන 29.5 ක පැවති අතර එයින් 8% ක් ජංගම නොවන වත්කම් වේ. එළඹෙන වසරේ ප්‍රමුඛතාවයන් වන්නේ විශේෂයෙන් කාබනික නිමැවුම් හී විකුණුම් වැඩි කරන අතරතුර පරිපාලන වියදම් අවම කිරීම, නව නිෂ්පාදන තුළින් ලාභ ආන්තික ඉහල නැංවීම, ස්වයංක්‍රීයකරණය තව තවත් සිදු කිරීම, හා ඉපැයුම් ලබා නොදෙන වත්කම් වැඩිදියුණු කර භාවිතා කිරීමය.

මෙම කෙටි කාලීන අරමුණු දෙසට, රාජ්‍ය ප්‍රතිපත්ති හා ශ්‍රී ලංකාවේ තිරසාර භාවයට සිදුවන දායකත්වය සිහියට ගනිමින්, දිගුකාලීන සේවයේ නියතු පළපුරුදු හා දක්ෂ කළමනාකරණ මණ්ඩලය විසින් බාහිර පරිසරයේ හට ගත් සෘණාත්මක තත්වයන් පරිවර්තනය කර නැවතත් සමාගමට පළමුව පොහොර වෙළඳපලේ ප්‍රමුඛයා ලෙස ද, දෙවනුව අනෙකුත් කෘෂිකාර්මික අමු ද්‍රව්‍ය වෙළඳපල තුල ද, ස්ථාපිත කිරීමට කටයුතු කරන බවට මා තුළ විශ්වාසයක් පවතී. අපගේ රට පුරා පැතිරුනු බලාත්මක බෙදාහැරීමේ ජාලය සිදු කරන සුවිශේෂී කාර්යභාරය පිළිබඳ මා දැනුවත් අතර, මේ මොහොතේ එම ජාලය සමග බෙදාහැරීමේ ජාලයේ ඵලදායීතාවය ඉහල නංවමින් එය සුසර කිරීමට කටයුතු කල යුතු ආකාරය ගැන සාකච්ඡා පවත්වමින් සිටී. මේ අතර, අපගේ කාබනික නිෂ්පාදන වෙළඳපල තුල ඇති බොහෝ නිෂ්පාදන වලට වඩා ගුණාත්වයෙන් වැඩි අතර, ඒවා ප්‍රචලිත කිරීමේ ශක්තිමත් දැනුවත් කිරීමේ වැඩසටහනක්



ක්‍රියාත්මක කරමින් සිටී. ආයතනයේ කළමනාකාරිත්වයේ, සේවකයින්ගේ, හා බෙදාහරින්නන්ගේ ප්‍රයත්නය විශේෂ ඇගයීමකට ලක් කිරීමට සුදුසු වන්නේ ගෙවුනු වසරේ පැවති දුෂ්කර තත්වයන් සිහියට ගනිමින් වන අතර මෙම දුෂ්කර කාලපරිච්ඡේදය පියමන් කිරීමට ඔවුන් සතු හැකියාව පිළිබඳ මා තුල විශ්වාසය පවතී.

තිරසාරී මුල් පිරීම් තුලින් සමාගමට සිය හැකියාවන් ස්වයං අභියෝගයකට ලක් කර ස්ථීර හා සාධාරණ වර්ධනයක් අත්පත් කිරීමට මග පෙන් වූ රටේ දූරදර්ශී නායකත්වයට, සමාගම වෙනුවෙන් මාගේ කෘතගුණ පලකර සිටිමි. මා හෘදයාංගවම, අවංකව අති ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ඔහුගේ ආශිංසන හා මගපෙන්වීම් වෙනුවෙන්ද, කෘෂිකර්ම අමාත්‍ය ගරු දුමින්ද දිසානායක මහතාට චිතුමා ලබා දුන් ධෛර්යය වෙනුවෙන්ද, අමාත්‍යංශයේ ලේකම් සහ අනෙකුත් අමාත්‍යාංශ නිලධාරීන් විසින් ආයතනයේ අභිමතාර්ථ ඉටු කර ගැනීමට ලබා දුන් සහයෝගයට ද ස්තූතිය පලකරන්නෙමි.

රෝෂණ වඩුගෙ
සභාපති

සාමාන්‍යාධිකාරීතුමාගේ ප්‍රකාශය



විගණනයට ලක් කරන ලද 2017/2018 මූල්‍ය වසරට අදාල මූල්‍ය ප්‍රකාශ සහ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට සහ තවත් මූල්‍ය වසරක් අවසානයේ අපගේ වටිනා කොටස්කරුවන්, හවුල්කරුවන් හා අනෙකුත් පාර්ශවයන් ඇමතීමට ලැබීම මට මහත් සතුටකි.

සලකන මූල්‍ය වසර තුල, ගංවතුර හා නියං තත්වයන් නිසා කෘෂිකර්මාන්තයට දැඩි බලපෑම් එල්ල වූ අතර, මේ නිසා ගොවීන්ගෙන් බොහොමයක් ප්‍රයත්න ඵල රහිත බවට පත් විය.

කෙසේ වූවද අප සමාගම, අති ගරු ජනාධිපතිතුමාගේ "වස විස නැති රටක් - සෞඛ්‍ය සම්පන්න ජනතාවක්" යන ප්‍රතිපත්ති මූලික වැඩසටහන යටතේ සිය ක්‍රියාකාරකම් උපරිමව දියත් කරන ලදී. මේ හා සම්බන්ධව, අප ආයතනය කෘෂි රසායන භාවිතය අවම කිරීමේ හා කාබනික පොහොර භාවිතය වැඩි කිරීමේ දැවැන්ත ප්‍රයත්නයක් අපගේ ගොවි කණ්ඩායම් ඉලක්ක කොට සිදුකරන ලදී.

අපගේ වගකීම පිළිපදිමින්, කාබනික පැලට් සහ දියර පොහොර ශ්‍රී ලාංකික ගොවීන්ට සංස්ථා 'sangstha' වෙළඳනාමය යටතේ හඳුන්වා දුන් පළමු රාජ්‍ය ආයතනය බවට අප පත්විය. සලකා බලන වසර තුල, කාබනික වෙළඳපල තුලට කඩිනමින් කා වැදී, අපගේ කොටස පුළුල් කිරීමේ උත්සාහයේ දී අප විසින් අපගේ කීර්තිනාමය, සන්නාම් පිළිගැනීම, රාජ්‍ය දායකත්වය යන්න උපයෝජනය කර, පෞද්ගලික අංශයේ ආයතන 17ක අභියෝගයට මුහුණ දීමට අපට හැකිවිය.

අපගේ මූලික කාර්යභාරය, මිනිසුන්ට පොහොර ලබාදීම වුවද, සහනාධාර මිලට අනෙකුත් කෘෂිකාර්මික යෙදවුම් ලබාදීමේ අවශ්‍යතාවය ඇතුලත් කරමින් අපගේ සේවාවන් පුළුල් කිරීමේ දැඩි උවමනාවක් ඇති විය. එම නිසා, මේ වන විටත් 'ලක් පොහොර' වෙළඳනාමය යටතේ බීජ, ඉසින යන්ත්‍ර, උදළු තල හා ට්‍රැක්ටර් යනාදිය අලෙවි කිරීමට සැලසුම් සකස් කර අවසන්ය.

අපගේ වගකීම පිළිපදිමින්, කාබනික පැලට් සහ දියර පොහොර ශ්‍රී ලාංකික ගොවීන්ට සංස්ථා 'sangstha' වෙළඳනාමය යටතේ හඳුන්වා දුන් පළමු රාජ්‍ය ආයතනය බවට අප පත්විය.

මම අභිමානයෙන් යුතුව දැනුම් දෙන්නේ, මේ වසර තුල, තොරතුරු සහ සන්නිවේදන පද්ධතීන් සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ කොට, ඒවා ඉල්ලුම් - සැපයුම් දර්ශක හා සෘජුව යා කෙරෙන්නේ සමාගමේ ඵලදායීතාව වඩා යහපත් කොට, සමාගම සමඟ ව්‍යාපාර කිරීම පහසු කිරීමටය.

අප සමාගමට අනාගතයේදී මුහුණදීමට විය හැකි සෑම අභියෝගයක්ම ජයගැනීම වෙනුවෙන්, අප ලක් පොහොර පවුලේ සාමාජිකයන් ලෙස අපගේ සෑම ප්‍රයත්නයක් දැරීමට හා සියල්ල පසෙකලා කැපවීමෙන් කටයුතු කිරීමට, එකමුතුව අරමුණු කර ගන්නෙමු.

මම සතුටින් හා හෘදයාංගම කෘතඥතාවයෙන්, ගරු කෘෂිකාර්මික ඇමතිතුමාට, ඔහුගේ අමාත්‍යාංශ කාර්යමණ්ඩලයට හා ලක් පොහොර සමාගමේ සභාපතිතුමාට, අධ්‍යක්ෂ මණ්ඩලයට හා ලක් පොහොර පවුලේ සාමාජිකයින් සෑම දෙනාට ස්තූතිය පළ කරන්නෙමි.

ප්‍රියන්ත සමරවීර
සාමාන්‍යාධිකාරී



රබර් වගාව සඳහා

ආර්.ඒ. 465, ආර්.යූ - 462, ආර්.යූ - 465,
ආර්/ වයි.බී, ආර්/එස්.ඒ ඇතුළු විශේෂ මිශ්‍ර පොහොර

අධ්‍යක්ෂ මණ්ඩලය



අනෝජා හේරත් මහත්මිය
අධ්‍යක්ෂ

ඩී.කේ.එම්.ආර්. කුමාරසිරි මහතා
අධ්‍යක්ෂ

උපුල් පීරිස් මහතා
අධ්‍යක්ෂ

හේමක ලසිත් බාලසූරිය මහතා
අධ්‍යක්ෂ



රෝෂණ වඩුගේ මහතා
සභාපති

මාධව වත්තේගම මහතා
ක්‍රියාකාරී අධ්‍යක්ෂ

රවී ක්‍රිෂාන් ජයවර්ධන මහතා
ක්‍රියාකාරී අධ්‍යක්ෂ

**පේ.එම්.එස්.ඩී.
රත්නායක මහත්මිය**
අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ මණ්ඩලය



රෝෂණ වඩුගේ මහතා

සභාපති

කොළඹ මහානාම විද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු වන ඔහු ඕස්ට්‍රේලියාවෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාවක් සහ ජපානයේ මෝටර් කාර්මික විද්‍යාව සම්බන්ධ වෘත්තීය පුහුණුවක් ලබා ඇත.

පාසලේ වයස අවුරුදු 15න් පහළ ක්‍රිකට් කණ්ඩායමේ නායකයා වූ ඔහු වයස අවුරුදු 17න් පහළ ක්‍රිකට් කණ්ඩායමේ සාමාජිකයෙකුද විය. ඔහු සිංහ සමාජයේ සභාපති ලෙසද, පාසල් ගුවන්විදුලි සංගමයේ උප සභාපති ලෙසද තනතුරු දරා ඇත.

වසර 3ක කාලයක් පුරා කෝට්ටේ අගනගරයේ සිංහ සමාජයේ සභාපතිත්වය දරා, වසර 3ක් එහි සාමාජික අධ්‍යක්ෂ ලෙසද කටයුතු කළ ඔහු ජාත්‍යන්තර සිංහ සමාජයේ 306 සී දිස්ත්‍රික්කයේ අධ්‍යක්ෂවරයා ලෙසද කටයුතු කරයි.

සමාජ සේවාවන් සඳහා වන රාජ්‍ය නොවන සංවිධානයක් වන ආර්යා පදනම පිහිටුවා, එහි සභාපතිවරයා ලෙස කටයුතු කරන ඔහු ලංකා එක්සත් ප්‍රවාහකයින්ගේ සංගමයේ සභාපති ලෙස සහ ලංකා වාහන ආනයනකරුවන්ගේ සංගමයේ උප සභාපති ලෙසද තනතුරු දරයි.

ශ්‍රී ලංකා එක්සත් ජාතීන්ගේ මිත්‍රත්ව සංවිධානය විසින් 2006 වසරේදී ඔහුට 'ජීවනසූරී' සම්මානය පිරිනමනු ලැබිණි.



මාධව වත්තේගම මහතා

ක්‍රියාකාරී අධ්‍යක්ෂ

කොළඹ නාලන්ද විද්‍යාලයෙන් සිය ද්විතියික අධ්‍යාපනය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, නිව්කාස්ල් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ලබාගත් ඔහු ලන්ඩනයේ ව්‍යාපාර විධායක සංගමයේ I සහ II පරීක්ෂණ සාමාර්ථ සුදුසුකම් ලැබීය. බටහිර ඕස්ට්‍රේලියාවේ පියෝකොම්ප් වෙතින් ඔටෝ කැඩ් සඳහා සහ ඕමානයේ සුල්තාන් රජයේ ඇරැබ් කම්පියුටර් සර්විස් වෙතින් ඔටෝ කැඩ් වින්ඩෝස් සඳහා ලබාගත් සුදුසුකම්ද ඇතුළුව විවිධ ඩිප්ලෝමා සුදුසුකම් රැසක් ඔහු ලබා ඇත.

සිල්වර් බර්ච් ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගමේ සභාපති / කළමනාකාර අධ්‍යක්ෂ ලෙසද, ඉන්ඩිපෙන්ඩන්ස් ආකිටෙක්චරල් හෝම්ස් (පුද්ගලික) සමාගමේ සහ කලම්බු ග්ලෝබල් ෂිපින් (පුද්ගලික) සමාගමේ සභාපති ලෙසද දැනට කටයුතු කරන ඔහු, මධ්‍යම සංස්කෘතික අරමුදලේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයෙකු ලෙසද සේවය කර ඇත.



රවි ක්‍රිෂාන් ජයවර්ධන මහතා

ක්‍රියාකාරී අධ්‍යක්ෂ

ඔහු සිය අධ්‍යාපන සුදුසුකම් ලෙස තායිලන්තයේ, බැන්කොක් හී ආසියානු තාක්ෂණික විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණ ඩිප්ලෝමාවක් ලබාගැනිමෙන් පසුව, 2016 වසරේදී ජාත්‍යන්තර විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමන ලද තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා වූ තරුණ සම්මානය දිනා ගන්නා ලදි.

ඔහු ශ්‍රී ලංකා තරුණ සංගම් එකමුතුවේ වසර දහයක් සේවය කල අතර ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය තුන් වරක් නියෝජනය කළේය.

ඔහු 2005 වසරේ සිට මාධ්‍ය ලේකම් ලෙස අමාත්‍යංශ පහක සේවය කර ඇති අතර ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලයේ උප සභාපති ලෙසද කටයුතු කළේය.

ඔහු ශ්‍රී ලංකා සැහැල්ලු පන්දු ක්‍රිකට් සංගමයේ සභාපති ලෙස කටයුතු කරන අතරතුර සක්‍රීයව ව්‍යාපාර ක්ෂේත්‍රයේ කටයුතු කරමින් සයුක්‍රි හෝල්ඩිංග්ස් පෞද්ගලික සමාගමේ ප්‍රධාන විධායක නිළධාරී ලෙස කටයුතු කළේය.

රසායනික වලින් තොර ආහාර වෙළඳාමේ නියුතු ප්‍රධාන ආයතනයක් වන හෙල්දි ෆුඩ් ෂොප් ඔහු විසින් ආරම්භ කරන ලද අතරම ඔහු විසින් හොඳම ආහාර අලෙවිකරන සම්මානය හා රසායනික වලින් තොර ආහාර අලෙවි කිරීම වෙනුවෙන් ගෞරවාන්විත MASCO සම්මානය ද දිනා ගන්නා ලදී. ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සංගමයේ ශ්‍රී ලංකා සම්බන්ධීකාරකවරයෙකු වන ඔහු ලෝකය පුරා පැවැති විවිධ තරුණ සමුළු වලදී ශ්‍රී ලංකාව නියෝජනය කර ඇත.



හේමක ලසිත් බාලසූරිය මහතා

අධ්‍යක්ෂ

වේල්ස් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය සහ වරලත් අලෙවිකරුවන්ගේ ආයතනයෙන් අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හිමි කරගත්තේය.

කළමනාකරණය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ආයතනයෙන් සිග්මා හය සංකල්පය පිළිබඳ කළු පටි ලාභියකු වන ඔහු, දුරකථන සන්නිවේදනයේ ඉදිරි මෙහෙයුම් (තනි මෙහෙයුම්), ව්‍යාපාර ක්‍රියාවලීන්, අලෙවි කළමනාකරණය, සමූහ කළමනාකරණය, පාරිභෝගික රඳවාගැනීම, ව්‍යාපාර සැලසුම් සහ පරිපාලනය, දැනුම් කළමනාකරණය සහ පාරිභෝගික අත්දැකීම් කළමනාකරණය ඇතුළු විවිධ සේවා ක්ෂේත්‍ර ආවරණය කරමින් බොහෝ ක්ෂේත්‍ර ගණනාවක බහුවිධ කාර්යභාරයන් රැසක් ඉටු කරමින් වසර 16කට අධික විශේෂඥතාව ලබා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය



ජේ.එම්.එස්.ඩී. රත්නායක මහත්මිය

අධ්‍යක්ෂ

කැලණිය විශ්වවිද්‍යාලයෙන් සිය විද්‍යා උපාධිය ලබාගත් ඇය වෙනත් විෂය ක්ෂේත්‍රයන්හි වැඩිදුර අධ්‍යාපනය ලබමින් කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික සංවර්ධනය පිළිබඳවද, ටෝකියෝ නුවර අයිඩියාස් ස්කූල් වෙතින් සංවර්ධන අධ්‍යයනයන් පිළිබඳවද, ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය ප්‍රතිපත්ති සහ කළමනාකරණය පිළිබඳවද පශ්චාත් උපාධි හිමි කරගෙන ඇත.

ශ්‍රී ලංකා ආර්ථික සංගමයේ සහ ශ්‍රී ලංකා ප්‍රතිපත්ති සැලසුම් සංගමයේ සමාජිකාවක් වන ඇය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ප්‍රමිති නිළධාරිනියක ලෙසද (1993 - 1994), මූල්‍ය හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරියක ලෙසද (1994 - 2004), එම අමාත්‍යංශයේම සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරියක ලෙසද, ග්‍රාමීය මූල්‍ය අංශයේ සංවර්ධනය සඳහා වන වැඩසටහනෙහි ව්‍යාපෘති නිළධාරිනිය ලෙසද සේවය කර ඇත. එම අමාත්‍යංශයේම අයවැය සැකසීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරිය ලෙස 2011 සිට 2013 දක්වා වූ කාලය තුළ සිය සේවා කටයුතු කිරීමෙන් අනතුරුව, මේ වන විට ඇය ජාතික ක්‍රමසම්පාදන අමාත්‍යංශයේ අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල්තුමිය ලෙස සේවය කරයි.

ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් විශ්වවිද්‍යාලය, ජපානයේ අයිඩියාස් ස්කූල් සහ කොළඹ විශ්වවිද්‍යාලය ඇතුළු දේශීය සහ ජාත්‍යන්තර විශ්වවිද්‍යාල ගණනාවක පර්යේෂණ අධ්‍යයනයන් සඳහා ඇය සම්බන්ධ වී ඇත.



උපුල් පීරිස් මහතා
අධ්‍යක්ෂ

ගල්කිස්ස, සාන්ත තෝමස් විද්‍යාලයෙන් අධ්‍යාපනය ලද ඔහු, ශ්‍රී ලංකා වැවිලි සංස්ථාවේ මෙන්ම ශ්‍රී ලංකා ඉඩම් ප්‍රතිසංස්කරණ සහ සංවර්ධන මණ්ඩලයේද හිටපු අධ්‍යක්ෂවරයෙකි.

ඌව පළාතේ හිටපු ප්‍රධාන අමාත්‍යතුමන්ගේ සම්බන්ධීකරණ ලේකම් ලෙස සේවය කර ඇති ඔහු, 2015 පෙබරවාරි 4 වැනිදා සිට සීමාසහිත ලංකා පොහොර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස කටයුතු කරමින් සිටියි.



ඩී.කේ.එම්.ආර්. කුමාරසිරි මහතා
අධ්‍යක්ෂ

කෘෂිකර්ම අමාත්‍යංශයේ සාමාජික, ප්‍රධාන ගණකාධිකාරී, කෘෂිකර්ම අමාත්‍යංශය

අධ්‍යක්ෂ මණ්ඩලය



අනෝජා හේරත් මහත්මිය

අධ්‍යක්ෂ

කොළඹ දේවි බාලිකා විද්‍යාලයේ ආදි ශිෂ්‍යාවක වන ඇය, පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් විද්‍යා විශේෂ උපාධියක් (කෘෂිකර්ම) සහ කැලණිය විශ්වවිද්‍යාලයෙන් සමාජවිද්‍යා ශාස්ත්‍රපති උපාධියක් හිමි කරගෙන ඇත.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරියක ලෙස වෘත්තීය ජීවිතය ආරම්භ කළ ඇය, පර්යේෂණ සහකාරවරියක ලෙස පරිසර කටයුතු හා ස්වභාවික සම්පත් අමාත්‍යංශයට බැඳී, 2003 වසරේ සැප්තැම්බර් මාසයේදී ආධුනික නිළධාරිනියක ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයට බැඳුණාය.

ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරියක, පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යංශයේ සහකාර අධ්‍යක්ෂවරියක සහ තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යංශයේ අධ්‍යක්ෂවරියක ලෙස කටයුතු කළ ඇය දැනට කෘෂිකර්ම අමාත්‍යංශයේ අධ්‍යක්ෂවරියක ලෙස සේවය කරයි. ශ්‍රී ලංකාවේ කාලගුණික විපර්යාස භාරගැනීම සහ තුලනය කිරීම සම්බන්ධ තාක්ෂණ අවශ්‍යතාවන් ඇගයීම සඳහා වන ව්‍යාපෘතියේ ව්‍යාපෘති සම්බන්ධීකාරිකාව ලෙස ඇය කටයුතු කර ඇත. ශ්‍රී ලංකාව

නියෝජනය කරමින් පාරිසරික හා තිරසාරත්ව සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර සමුළු ගණනාවකට සහභාගි වී ඇති ඇය එක්සත් ජාතීන්ගේ කාලගුණ වෙනස්කම් සම්මුතිය සහ නියොන් කෙටුම්පත සකස් කිරීමේදී ශ්‍රී ලංකාවේ රාජ්‍ය නියෝජිතවරියක් ලෙස සහභාගි වී ඇත.

ශ්‍රී ලංකාවේ කාබනික තේ පිළිබඳ පර්යේෂණ ගණනාවක් සිදු කර, ඒවා ප්‍රකාශයට පත් කර ඇති විශේෂඥවරියක වන ඇය දැනට සීමාසහිත ලංකා පොහොර සමාගමේ රේඛීය අමාත්‍යංශ්‍ය වන කෘෂිකර්ම අමාත්‍යංශය නියෝජනය කරන සාමාජිකාව ලෙස කටයුතු කරන්නීය.

එස් ඇන්ඩ් ඒ කන්සල්ටන්ස්
(පෞද්ගලික) සමාගම

සමාගමේ ලේකම්
894/4, බී,
අතුරුගිරිය පාර,
මාලඹේ.



ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



පී.ආර්. සමරවීර මහතා

සාමාන්‍යාධිකාරී (වැඩ බලන) සහ කළමනාකරු (මූල්‍ය)

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් වාණිජ (විශේෂ) උපාධියක් හිමි කරගෙන ඇත. ශ්‍රී ලංකාවේ පොදු මූල්‍ය හා සංවර්ධන ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේත්, වරලත් ව්‍යාපාර පරිපාලන ආයතනයේත්, ශ්‍රී ලංකා පොදු මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේත් ඉහළ සාමාජිකත්වය දරන ඔහු ශ්‍රී ලංකාවේ ගණකාධිකාරීවරුන්ගේ වෘත්තීය ආයතනයේ ආශ්‍රය සාමාජිකත්වයද දරයි. වර්ෂ 1987 දී සීමාසහිත ලංකා පොහොර සමාගමට සම්බන්ධ වූ ඔහු දීර්ඝ කාලයක් අප සමඟ රැඳී සිටීමින් සමාගමේ ජ්‍යෙෂ්ඨතම කළමනාකරු බවට පත්ව සිටියි.

බී.ඩී.එල්. කුමාරසිරි මහතා

සමාගමේ ප්‍රධාන අභ්‍යන්තර විගණක



කැලණිය විශ්වවිද්‍යාලයෙන් වාණිජ (විශේෂ) උපාධියක් ලබා ඇති ඔහු ශ්‍රී ලංකාවේ මහජන මූල්‍ය හා සංවර්ධන ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේත්, වරලත් ව්‍යාපාර පරිපාලන ආයතනයේත්, ශ්‍රී ලංකා පොදු මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ සහ ශ්‍රී ලංකාවේ පොදු මූල්‍ය සහ සංවර්ධන ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ විශේෂ සාමාජිකත්වය දරයි. ඔහු පොදු ගිණුම් සහ මූල්‍ය ආයතනයෙන් මෙන්ම අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයෙන්ද අභ්‍යන්තර විගණනය සඳහා සහතික ලබා ඇත. ජාතික උපකරණ යන්ත්‍රසූත්‍ර පිළිබඳ සංවිධානයේ ගණකාධිකාරීවරයා සහ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා ලෙස ඔහු සේවය කර ඇත.



ඉංජිනේරු ඩී.එම්.එන්.ඒ. දිසානායක මහතා

කළමනාකරු (කාර්මික)

ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ BSc උපාධියක් සහ කැලණිය විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය (මූල්‍ය) පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකයකු වන ඔහු ඒ ආයතනයේම ඉංජිනේරු අංශ කමිටුවේ සාමාජිකයකුද වෙයි.

ආර්.ඒ.පී. පෙරේරා මහතා

කළමනාකරු (බෙදාහැරීම්)



ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් සමාජවිද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් ලබා ඇත. එයට අමතරව ඔහු කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවන්ද හිමි කරගෙන ඇත. ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ ඵලදායීතාව පිළිබඳ ඩිප්ලෝමාව සාර්ථකව සම්පූර්ණ කර ඇති ඔහු මානව සම්පත් කළමනාකරණය, කාර්මික සෞඛ්‍යය සහ ආරක්ෂාව, ගිනි ආරක්ෂාව සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ නඩත්තු ක්ෂේත්‍ර පිළිබඳව විශේෂඥ වෘත්තීය මට්ටමක් දරයි.



ආර්.පී.එස්. බෝධිපාල මිය

කළමනාකාරිණී (අලෙවි සහ වෙළෙඳ)

ඇය සබරගමුව විශ්වවිද්‍යාලයෙන් කෘෂිකර්මය (වැවිළි කළමනාකරණය) පිළිබඳ විද්‍යා විශේෂ උපාධියක් සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. වැවිළි කර්මාන්ත කළමනාකරණය පිළිබඳ ඉහළ පළපුරුද්දක් ඇයට ඇත.

එම්. එල්. යූ. පෙරේරා මිය

කළමනාකාරිණී (රසායනාගාරය)

ඇය කැලණිය විශ්වවිද්‍යාලයෙන් විද්‍යා (ජීවවිද්‍යා) උපාධියක් සහ කොළඹ විශ්වවිද්‍යාලයෙන් විශ්ලේෂණාත්මක රසායන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් (MSc) ලබා ඇත. වර්ෂ 1996 දී සීමාසහිත ලංකා පොහොර සමාගමට සම්බන්ධ වූ ඇය පොහොර විශ්ලේෂණය සම්බන්ධ ඉහළ අත්දැකීම් සහිතව දීර්ඝ කාලයක් සේවය කර ඇත.





ෆාහිම් අලවිඩීන් මහතා

කළමනාකරු- විශේෂ ව්‍යාපෘති

කොළඹ විශ්ව විද්‍යාලයේ ආදි සිසුවෙකු වේ. ඔහු විශේෂ ඉංජිනේරු උපාධිය එක්සත් රාජධානියේ කිංග්ස්ටන් විශ්වවිද්‍යාලයෙන් හා කළමනාකරණය සහා අළෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් එක්සත් රාජධානියේ අයිරිෂ් ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයෙන් ලබා ඇත. ඔහු අප සමාගමේ හිටපු අලෙවිකරණ උපදේශක වන අතර වසර පහළොවකට අධික කාලයක් සැකසුම්, ඉංජිනේරු, විකුණුම් හා අලෙවි, නඩත්තු කිරීම, මෙහෙයුම් සහ පරිපාලනය වැනි විවිධ ක්ෂේත්‍ර වල වසර 15 විවිධ කාර්යයන් සිදු කරමින් අත්දැකීම් ලබා ඇත. හිටපු වාර්මාර්ග, ජල සම්පත්, හා ආපදා කළමනාකරණ ඇමතිතුමාගේ සම්බන්ධීකරණ නිළධාරී ලෙසද කටයුතු කළේය. ඔහු එක්සත් රාජධානියේ ඉංජිනේරු ආයතනයේ හා රාජකීය ගගනගාමී සමාජයේ සාමාජිකයෙකු වේ.

සී.පී.පී. බුලත්සිංහල මහතා

වැඩ බලන කළමනාකරු (පරිපාලන සහ මානව සම්පත්)

ඔහුට මෙම සමාගමේ වසර 36ක සේවා පළපුරුද්දක් ඇත. ඔහු දිවයින පුරා බල පැවැත්වෙන පරිදි සාමදාන විනිශ්චයකරුවකුද වේ.





පී.පී. සමන් මහතා

වැඩ බලන කළමනාකරු (ප්‍රසම්පාදන සහ ආනයන)

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් කලා උපාධියක් ලබා ඇත. දැනට ඔහු ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ප්‍රසම්පාදන සහ ගිවිසුම් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් හදාරයි.

ආයතනයේ සංවිධාන ව්‍යුහය





ක්‍රියාකාරී අධ්‍යක්ෂ



ක්‍රියාකාරී අධ්‍යක්ෂ

කළමනාකරු බෙදාහැරීම්

කළමනාකරු කාර්මික

කළමනාකරු රසායනාගාරය

කළමනාකරු වාහනය

සහකාර කළමනාකරු බෙදාහැරීම්

සහකාර කළමනාකරු කාර්මික

සහකාර කළමනාකරු රසායනාගාරය

සහකාර / කළමනාකරු නීතිමය

නියෝජ්‍ය කළමනාකරු තොරතුරු තාක්ෂණ

කාර්මික විධායක

කළමනාකරණ සහකාර (ශිල්පීය නොවන)

කළමනාකරණ සහකාර (ශිල්පීය නොවන)

කළමනාකරණ සහකාර (කාර්මික)

කළමනාකරණ සහකාර (ශිල්පීය නොවන)

කළමනාකරණ සහකාර (ශිල්පීය නොවන)

කළමනාකරණ සහකාර (කාර්මික)

ප්‍රාථමික මට්ටම (පුහුණු)

ප්‍රාථමික මට්ටම (පුහුණු)

ප්‍රාථමික මට්ටම (අර්ධ පුහුණු)

ප්‍රාථමික මට්ටම (නුපුහුණු)

ප්‍රාථමික මට්ටම (නුපුහුණු)

ප්‍රාථමික මට්ටම (නුපුහුණු)

ප්‍රාථමික මට්ටම (නුපුහුණු)

ප්‍රාථමික මට්ටම (නුපුහුණු)

ප්‍රාථමික මට්ටම (නුපුහුණු)



44 දීපව්‍යාප්ත පොහොර බෙදාහැරීම් ජාලය...

සීමාසහිත ලංකා පොහොර සමාගම

දීපව්‍යාප්ත පොහොර බෙදාහැරීම් ජාලය

උතුරු පළාත
කොණ්ඩවිල්
කිළිනොච්චි
වරණි
ඕලුමඩු
මුරන්කන්

උතුරු මැද පළාත
මැදවච්චිය
හොරොව්පතාන
නොච්චියාගම
හිඟුරක්ගොඩ
වැලිකන්ද
පොළොන්නරුව

වයඹ පළාත
ආණමඩුව
මහව
කුරුණෑගල
නාත්තණ්ඩිය

මධ්‍යම පළාත
දඹුල්ල
නාගොල්ල
මාතලේ
ගම්පොළ
රිකිල්ලගස්කඩ
නුවරඑළිය

නැගෙනහිර පළාත
ත්‍රිකුණාමලය
කන්තලේ
මඩකලපුව
දෙහිඅත්තකණ්ඩිය
අම්පාර
පොතුවිල්

බස්නාහිර පළාත
හුණුපිටිය
දොඩංගොඩ
මතුගම
පැලවත්ත

සබරගමුව පළාත
කෑගල්ල
කුරුවිට
ඇඹිලිපිටිය

ඌව පළාත
මහියංගනය
බිබිල
බදුල්ල
මොණරාගල

දකුණු පළාත
වීරවිල
දෙහිගහලන්ද
බට-අත
මැදවියන්ගොඩ
අකුරැස්ස
කොග්ගල



කළමනාකාරීත්ව විමසුම සහ විශ්ලේෂණය



කෘෂිකාර්මික අංශයේ දළ ආර්ථික විශ්ලේෂණය.

සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරන ලද නිල දත්ත වලට අනුව ශ්‍රී ලංකාවේ දළ දේශීය නිශ්පාදනයේ වර්ධනය 2016 වසරේ පැවති 4.5% සිට 3.1% දක්වා 2017 වසරේදී මන්දගාමී විය.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාවිතා කළ වෙළඳපල මත පදනම් වූ විනිමය අනුපාත ප්‍රතිපත්තිය යටතේ ශ්‍රී ලංකා රුපියල 2017 වසරේදී සංසන්දනාත්මකව බලන කල ස්ථාවර අගයක පැවතිනි. රුපියල අවප්‍රමාණ වීමේ පීඩනය 2017 වසරේ මුල් මාස දෙක තුල පැවතියද, පසුව සිදුවූ රජයේ සුරුකුම්පත් හා



කොටස් වෙළඳපලේ විදේශ ආයෝජන හා අපනයන ආදායම් රට තුලට ලබාගැනීම වැඩි වීමත් සමඟ මෙම තත්වය මධ්‍යස්ථ අතට හැරිය. රුපියල කෙරෙහි අවප්‍රමාණ පීඩනය තවදුරටත් මැයි මාසයෙන් පසු අඩු වූයේ ISB මඟින් ලැබුණු විදේශ මුදල් සැපයීමේ පහසුකම සහ IMF – EFF යටතේ වාරික දෙකක් ලැබීම හේතුකාරනා ආයෝජකයින්ගේ විශ්වාසය වැඩිදියුණු වීමට යෙදවීමය.

2017 වසරේදී ක්‍රම ක්‍රමයෙන් රටේ විදේශ අංශය වර්ධනය වූයේ ඉහළ විදේශ මුදල් හුවමාරු මූල්‍ය ගිණුමට ගලා ඒම මතය. 2017 වසරේදී වෙළෙඳ බඩු විකිණීමේ විදේශ ආදායම සිහිකළ යුතු ඉලක්කම් දෙකක වර්ධනයක් පෙන්නුම් කළේය. මෙයට අඩක් යුරෝපියානු සංගමයේ GSP+ පහසුකම නැවත යථා තත්වයට පත් වීම සහ ශක්තිමත් ආයතනික හා ප්‍රතිපත්තිමය සහයද හේතු විය. කෙසේ වූවද, බලාපොරොත්තු වූවාට වඩා ආනයන වියදම්, විශේෂයෙන් ඉන්ධන සහ පැවැති විනාශකාරී කාළගුණ තත්වය නිසා හාල් සේම රත්රන් ද ආනයනය නිසා, වෙළඳ ශේෂ හිඟය මෙම වසරේදී වර්ධනය විය. කාර්මික හා සේවා අංශ වල ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීමක් නිරීක්ෂණය කළ අතරම, කෘෂිකාර්මික ක්ෂේත්‍රය 0.8% හැකිලීමක් සිදුවූයේ 2016 සිට පැවති අයහපත් දේශගුණ තත්වයන් මතය. කෘෂිකාර්මික ක්‍රියාකාරකම් අතර තෙලමය හෝග, වීළවළු හා වී වගාව ඍණ අගයයන් වාර්තා කළේය. කෙසේ වූවද වන හා දැව, පළතුරු හා තේ යන අංශ වල

සිදුවූ වර්ධනය සමස්ථ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සිදුවූ හැකිලීම යම් දුරකට සීමා කිරීමට උදව් විය. දළ දේශීය නිෂ්පාදිතයේ 26.8% කට හිමිකම් කියන කාර්මික කටයුතු 3.9%කින් 2017 වසරේදී වර්ධනය විය.

ප්‍රධාන කෘෂිකාර්මික බෝග ලෙස සැලකෙන වී, එළවලු, අනෙකුත් ආහාර භෝග සහ පොල් යන ඒවායේ නිශ්පාදනය සැලකිය යුතු අඩු වීමක් ප්‍රධාන ලෙස වාර්තා වූයේ වර්ෂය තුළ පැවති නියං තත්ත්වය නිසාය. ගෙවූ දශකයේ අඩුම වී නිෂ්පාදනය වාර්තා කරමින්, 2016/17 මහ සහ 2017 යල යන කන්න දෙකේ අස්වැන්න සීඝ්‍ර ලෙස පහත වැටුන අතර, සමස්ථ වී නිෂ්පාදනය 46.1% ක අඩු වීමක් වනම් විය කිලෝග්‍රෑම් මිලියන 2,383ක් දක්වා පහත වැටිය. මේ නිසා, රටේ හාල් නිෂ්පාදනය ප්‍රමාණවත් වූයේ රටේ මාස 8ක ඉල්ලුම සැපිරීමට පමණි. මේ තත්ත්වය මත, සහල් මිල ඉහල ගිය අතර රජය විසට ප්‍රතිචාර දක්වමින් සහල් ආනයන අයබදු අඩු කළේය. මේ වාතාවරණය තුල, සහල් දේශීය නිෂ්පාදනයේ හිඟය පියවීමට සහ සහල් මිල ඉහල යෑමේ පීඩනය අවම කරලීම යන හේතු කරුනු කොටගෙන සහල් ආනයනය ඉහල ගියේය.

ගිය වසරේ සිට පැවති වියළි කාළගුණ තත්වය නිසා පොල් නිෂ්පාදනයට ද බලපෑම් ඇතිවිය. පොල් නිෂ්පාදනය 18.7% කින්, වනම් විය පොල්ගෙඩි මිලියන 2,450ක් දක්වා පහත ගිය අතර, පොල් ගෙඩියක සිල්ලර මිල 47.1% කින්, රු.67.40ක් දක්වා ඉහල ගියේය.

එළවළු හා අනෙකුත් භෝග නිෂ්පාදනය ද පැවැති අයහපත් කාළගුණ තත්වයන් මත බාධාවට ලක්වූ අතර, එළවළු නිෂ්පාදනය 2016/17 මහ සහ 2017 යල කන්න වලදී අඩු විය. මේ අතර, මෑත කාලීනව පහත යමින් තිබුණු තේ නිෂ්පාදනය, තේ මිළ ඉහල යෑම මත ඇති වූ උනන්දුව හා තේ වගාකරන ප්‍රධාන කලාප වල පැවැති යහපත් කෘෂි කාලගුණික කාරණා හේතු කොට, වර්ෂයේ දෙවන භාගයේදී ඉහල ගියේය. මේ නිසා තේ කර්මාන්තශාලා ඉහල ධාරිතාවකින් යුක්තව මෙහෙයුම් කටයුතු සිදු කළේය. රටේ සමස්ථ යහපත වෙනුවෙන් කෘෂිකාර්මික අංශයේ, වැදගත්කම සලකා, රජය විසින් මේ අංශයට වැඩි සහයක් ලබා දෙන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවට අනුව, ගොවීන් වඩාත් වාණිජමය ලෙස ප්‍රතිලාභ දෙන ක්‍රියාකාරකම් දෙස උනන්දු කරවීම උදෙසා ප්‍රතිපත්තිමය වෙනස අවශ්‍යය. එයට මහ බැංකුව සිය සැලකිලිමත්භාවය යොමු කරමින් කියා සිටියේ 1962 දී ඵලදාව වැඩි කිරීමට හඳුන්වා දුන් පොහොර සහනාධාරය නිසා, කෘෂිකාර්මික ඵලදාවේ වැඩි වීමක් නොමැතිව කෘෂිරසායනික භාවිතය වැඩි වී ඇති බවයි. මෙමගින් අවධාරණය කරන්නේ සහනාධාර මත දිවෙන යැපුම් කෘෂිකර්මාන්ත ආකෘතියෙන්, පශ්චාත් අස්වනු හානිය අවම කරගනිමින්, ක්‍රියාවලි කළමනාකරණයේ ඵලදාව ඉහල නංවමින්, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපලට ප්‍රවේශය පුළුල් කරමින් වාණිජමය කෘෂි කටයුතු දෙසට යොමුවිය යුතු බවයි.

සමාගම් විශ්ලේෂණය :

ලංකා පොහොර සමාගම පොහොර ආනයනය සේම අවශ්‍ය යම් අමුද්‍රව්‍ය රට තුලින් ලබා ගැනීමද සිදුකරයි. අප සමාගම වී, එළවළු සහ රනිල කුලයේ භෝග සඳහා වඩාත් උචිත පොහොර මිශ්‍රණයන් නිපදවා, ඒවා අභ්‍යන්තර රසායනාගාර තුල අත්හදා බලා රටපුරා පිහිටි බෙදාහැරීම් ජාලය ඔස්සේ බෙදා හරියි. 2005 වසරේ සිට, රජය ගොවීන්ට පොහොර සහනාධාරිතව ලබා දීම සිදු කරයි. කෙසේ වුවද, මෙම ප්‍රතිපත්තිය කෙටි කලකට 2016 දී ඉවත් කළ අතර නැවතත් විය 2018 වසරේ දී හඳුන්වා දුන් අතර, මෙම රාජ්‍ය ප්‍රතිපත්තීන් ලංකා පොහොර සමාගමේ ලාභාන්තික කෙරෙහි දැඩිව බලපෑමක් සිදු කිරීමට සමත් විය.

අප සමාගමේ පොදු ඉලක්කය, වඩාත් පුළුල්ව පැවසුවහොත්, එය වන්නේ ශ්‍රී ලාංකික ගොවි ප්‍රජාවගේ අවශ්‍යතාවයන් හී සිටින, පොහොර ආනයනය කර මිශ්‍ර සහ සෘජු පොහොර ලෙස බෙදා හරින මිතුරා බවට පත්වීම සහ කෘෂිකර්මාන්තයේ වර්ධනයට කැප වූ රාජ්‍ය ආයතනයක් බවට පත් වීමය.

අපගේ කාර්මික පර්යේෂණ පහසුකම් හී තදබල පරීක්ෂණ තුලින් පොහොර නිමවුම් හී ගුණාත්මකභාවය තහවුරු කරමින්, රට පුරා විහිදුනු ගොවි ජනතාවට අවශ්‍ය අවස්ථාවලදී ගුණාත්මක පොහොර බෙදා හැරීමට පූර්ණ ලෙස කැප වී සිටී. අපගේ අභ්‍යන්තර රසායනාගාර සඳහා ISO/ IEC/ 17025:2005 තත්ත්ව සහතික හා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ අනුමැතිය ඇති අතර, අප විසින් බලයලත් බෙදාහරින්නන්ට යවන සෑම පොහොර වර්ගයකකම නියැඳි පරීක්ෂාවක් මෙම අභ්‍යන්තර රසායනාගාර වලදී සිදු කරයි. මීට අමතරව අප සමාගමට ISO9001/ 2008 සේම ISO14001/2004 සහතිකය ද හිමියි.

වත්තල, හුනුපිටිය පිහිටි මධ්‍යම ගබඩා සංකීර්ණය මෙට්‍රික් ටොන් 67,000ක ධාරිතාවයකින් යුක්ත වන අතර පොළොන්නරුව පිහිටි ප්‍රධාන ප්‍රාදේශීය ගබඩා සංකීර්ණයේ ධාරිතාව මෙට්‍රික් ටොන් 18,000කි. මීට අමතරව, රටපුරා පැතිරුණු ගබඩා 43කින් සමන්විත ගබඩා ජාලයේ සමස්ථ ධාරිතාවය මෙට්‍රික් ටොන් 50,000කි.

සමාගමේ ව්‍යාපාර මෙහෙයුම් වල ප්‍රධාන කොටසක් වන්නේ වී වගාව සඳහා පොහොර සැපයීම වුවද, මෙයට අමතරව අප සමාගම සතුව තේ,පොල්, රබර්,එළවළු හා පළතුරු වැනි බෝග සඳහා විශේෂයෙන් සකස් කරන ලද සෘජු හා මිශ්‍ර කරන ලද පුළුල් පොහොර සැකසුම් එකමුතුවක් ඇත. ගෝලීයව මතුවන තිරසාර කෘෂිකර්මය පිළිබඳ කතිකාවත හා සමගාමීව, අප සමාගම මෑතකදී කාබනික පොහොර අලෙවි කිරීමේ හා බෙදාහැරීමේ කාර්යය ආරම්භ කළේය.

ලංකා පොහොර සමාගමේ අභ්‍යන්තර මෙහෙයුම් පූර්ණ ලෙස ස්වයංක්‍රීය බවට පත්කර ඇත්තේ ව්‍යාපාරයේ සියළු මෙහෙයුම් පරිපූර්ණව ආවරණය කරන, පරිශීලනයට පහසු, පිරිවැය ඵලදායී ව්‍යවසාය සම්පත් කළමනාකරණ (ERP) මෘදුකාංගය ඔස්සේය.

විකුණුම් විමසුම

වසර	සෘජු පොහොර (මෙට්‍රික් ටොන්)	මිශ්‍ර පොහොර (මෙට්‍රික් ටොන්)	එකතුව
2016/2017	46,299	5,006	51,305
2017/2018	65,921	7,975	73,896

DIRECT FERTILIZER	Sales (Mt.)
UREA	30,181
TSP	8,628
MOP	5,531
ERP	283
HERP	110
SA	771
BORETE	9.0
ZINC SULPHATE	85
DOLOMITE	366
SOP	46
DAP	15
CES	174
KIE	100
TOTAL	46,299

මූල්‍ය සාරාංශය

විමසුමට ලක් කරන වසර තුල සමාගම වී වගාව සඳහා හා අනෙකුත් බෝග සඳහා භාවිතා කරන පොහොර විකිණීම තුලින් බිලියන 3.37ක ආදායමක් වාර්තා කල අතර එය වසරකට සාපේක්ෂ වසරකදී 44%ක අඩු වීමකි.

ආදායම



දළ ලාභය

සමාගම මෙම වසරේදී රු.මිලියන 31ක ලාභයක් ලැබූ අතර එය පෙර වසරට සාපේක්ෂව වසරකදී 87% ක අඩු වීමකි. මේ සා විශාල ලෙස දළ ලාභය අඩු වීමට හේතු වූයේ රජය විසින් පොහොර සහනාධාරය ඉවත් කිරීමට ගත් ප්‍රතිපත්තිමය තීරණයයි.

දළ ලාභය



පරිපාලන වියදම්

මෙම මූල්‍ය වසරට අදාල සමාගමේ පරිපාලන වියදම රු. මිලියන 475කි. එය පෙර වසරට සාපේක්ෂව 7%ක ඉහළ යෑමක් විය.

පරිපාලන වියදම්



බෙදාහැරීමේ වියදම්

2016/17 වසරේදී බෙදාහැරීමේ වියදම වසරකට සාපේක්ෂව වසරකදී ඉහල ගිය බව අප සමාගම සිහියට ගෙන, මෙම වසරේදී කළමනාකරණයේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාව ඉහල නැංවීමට සේම බෙදාහැරීමේ ජාලයේ පැතිරීම හා කාර්යක්ෂමතාවය ඉහල නැංවීමට කටයුතු කර, බෙදාහැරීමේ වියදම් 20%කින් එනම් රු.මිලියන 16 දක්වා අඩු කර ගැනීමට සමත් විය.

බෙදාහැරීම් වියදම්



මූල්‍ය ආදායම් සහ වියදම්

සමාගමේ මූල්‍ය ආදායම් සලකා බලන වසර තුල රු. මිලියන 456ක් දක්වා වැඩි විය. අභ්‍යන්තර කාර්යක්ෂමතාව තිව්‍ර කිරීමෙන් සහ මූල්‍ය ක්‍රියාවලීන් ඊ.ආර්.පී. පද්ධතියක් හරහා ස්වයංක්‍රීය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය වියදම් විශාල ලෙස රු. 126,125.00 ක් දක්වා පහල වැටීමක් විය.

මූල්‍ය ආදායම හා වියදම්



බදු පෙර ලාභය

රජයේ සිදුවූ ප්‍රතිපත්තිමය වෙනස්කම මත පොහොර සහනාධාරය ඉවත් කිරීම නිසා අපගේ ලාභාන්තික කෙරෙහි ඇති වූ දැඩි බලපෑම මත සමාගමේ බදු පෙර ලාභය රු. මිලියන 39ක් පමණ විය. එය 69%ක වසර 8කින් වාර්තා වූ අවම අගය විය.

බදු පෙර ලාභය



බදු

මෙම මූල්‍ය වසරේ ආදායම් බදු ප්‍රමාණය රු.මිලියන 82කි. එය 2016/17 වසරේ රු. මිලියන 44කි. බදු පිරිවැය තුල රු. මිලියන 29ක විලම්භිත බදු වියදමක් ඇතුලත්ය.

කොටසක ඉපැයුම් (EPS)

සමාගමේ කොටසකට ඉපැයුම් මෙම වසරේදී සෘණ 0.49ක් වූ අතර එය වසර 8කින් සෘණ අගයක් වාර්තා වූ පළමු අවස්ථාව විය.

කොටසක් සඳහා ඉපැයුම්



කොටසකට ලාභාංශ (DPS)

මෙම වසරේ කොටසකට ලාභාංශ ප්‍රමාණය සෘණ 0.15ක් වූ අතර එය වසරකට සාපේක්ෂව වසරකදී 118%ක අඩු වීමකි.

කොටසක් සඳහා ලාභාංශ



වත්කම් මත ප්‍රතිලාභ (ROA)

විමසුමට ලක් කරන වසරේදී සමස්ත වත්කම් මත 6.0% ප්‍රතිලාභයක් ජනනය කිරීමට සමාගමට හැකි විය. එය පෙර වසරට සාපේක්ෂව 100% ක අඩු වීමකි.

වත්කම් මත ප්‍රතිලාභ



හිමිකම් මත ප්‍රතිලාභ (ROE)

සමාගමේ හිමිකම් පත ප්‍රතිලාභ 0.0 දක්වා පහළ ගිය අතර එය 100% ක පහළ වැටීමක් විය.

හිමිකම් මත ප්‍රතිලාභ



වත්කම් පදනම



වත්කම් පදනම

ජංගම නොවන වත්කම් 8% ක් සහ ජංගම වත්කම් 92% කින් සමන්විත වූ සමාගමේ සමස්ථ වත්කම් වටිනාකම රු. බිලියන 35.6ක් ලෙස 2017 මූල්‍ය වසර අගදී වාර්තා විය. ප්‍රධාන වශයෙන්ම දේපල, වගකීම් හා උපකරණ වලින් සමන්විත වූ ජංගම නොවන සමස්ත වත්කම් රු. බිලියන 2.7ක් ලෙස ප්‍රක්ෂේපිත වසරේ වාර්තා විය. පසුගිය වසරට සාපේක්ෂව සමස්ථ වත්කම් 17% ප්‍රමාණයකින් පහල වැටී තිබිණි.

මුදල් ප්‍රවාහය හා ද්‍රවශීලීතාවය

සමාගමේ ප්‍රධාන මුදල් ප්‍රභවයන් වන්නේ මෙහෙයුම් සහ ආයෝජන මඟින් ජනනය කරනු ලබන මුදල්ය. ප්‍රක්ෂේපිත මූල්‍ය වර්ෂයේදී මෙහෙයුම් වලින් ලද මුදල් ප්‍රමාණය රු. මිලියන 8,052 ක් සහ ආයෝජන වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය රු. මිලියන 591ක් විය. විමසුමකට ලක් කරන වසර තුළදී සමාගමේ මූල්‍ය ක්‍රියාකාරීත්වයන් මඟින් ලද මුදල් ප්‍රවාහය රු. මිලියන 7,628 ක් විය.

සේවා ණය සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා

ප්‍රාග්ධන වියදම් සහ ලාභාංශ පියවීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් පවත්වා ගැනීමට සමාගමට හැකිවිය.

කොටස් හිමියන්ගේ අරමුදල්

කොටස් 100%ක හිමිකාරීත්වය රජයේ භාණ්ඩාගාරය සතුව පැවතිණි. නිකුත් කළ කොටස් ප්‍රමාණය 50,245,608 කි.



මානව සම්පත් කළමනාකරණ වාර්තාව

යහ ක්‍රියාපිළිවෙත් සහ සේවක ප්‍රතිපත්ති

සාජ්පු හා කාර්යාල පනත, පරිපාලක සභා ආඥා පනත, භාණ්ඩාගාර හා රේඛීය අමාත්‍යංශය මඟින් නිකුත් කර ඇති මාර්ගෝපදේශන සංග්‍රහය සහ දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකව පවතින අදාළ සියලු කම්කරු නීතීන් යනාදියට අනුකූල වන පරිදි අපගේ මානව සම්පත් කළමනාකරණ ක්‍රමෝපායයන් මනාව සකසනු ලැබ ඇත. රජයේ පරිපාලන නියාමනයන්ගේ සහ විද්‍යුත් ඊ කේතකරණයේ ඉහළම ප්‍රමිතීන්වලට අනුගත වෙමින්, සිය මානව සම්පත් කළමනාකරණය ප්‍රශස්ත මට්ටමක පවත්වාගැනීමට වෙහෙසෙන අතරම, ආයතනික ව්‍යුහය නිර්මාණය කිරීමේදී නිසි අවධානය සහ විනිවිදභාවය පවත්වාගනිමින්, එහි අඩුපාඩු හඳුනාගනිමින් වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන උපදෙස් පරිදි ඒවා සම්පූර්ණ කිරීම සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ස්ථාපිත කරනු ලබන ප්‍රමිතීන් සහ උපදෙස් අනුව උසස්වීම් පිරිනැමීම සහ වැටුප් සැකසීම යනාදියද සමාගම විසින් සිදු කරනු ලබයි.

සේවක ප්‍රතිලාභ සැලසුම

රජයේ නියමයන්ට අනුකූල වන පරිදි, සමාගම විසින් දළ වැටුපෙන් 15% ක් (මූලික වැටුප + ජීවන වියදම) සේවක අර්ථසාධක අරමුදලටද, 3% ක් සේවක නියුක්තියන්ගේ භාර අරමුදලටද දායක කරනු ලබයි.

ප්‍රතිලාභ සැලසුම හඳුන්වාදීම

ශ්‍රී ලංකාවේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සුදුසුකම්ලත් තක්සේරුකරුවකු විසින් සෑම වසරකම මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති ප්‍රතිලාභ වගකීම ගණනය කරනු ලබන අතර, සෑම සේවකයෙකුගේම ප්‍රථම සේවා වසරේ සිට විශ්‍රාම ප්‍රතිලාභ හිමිකම් වගකීම සඳහා අදාළ ප්‍රතිපාදනද වෙන්කරනු ඇත.

සේවක දිරිගැන්වීම

එකමුතුකමෙන් යුතු සේවා පරිසරයක් නිර්මාණය කිරීම, පහසුකම් වැඩිදියුණු කිරීම, ආතතිය පහල දැමීම, සමාග මේ එදිනෙදා ව්‍යාපාර කටයුතු මෙන්ම ක්ෂයවීම් විශාල වශයෙන් අවම කිරීමෙන් කෙටි සහ දීර්ඝ කාලීන වශයෙන් ලැබෙන ප්‍රතිලාභ සම්බන්ධ පුළුල් හැඟීමක් සේවකයින්ට ලබාදීම මඟින් කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාව උපරිම මට්ටමකට ඉහළ නැංවීම සඳහා කාර්යමණ්ඩලය දිරිගැන්වීමට සමාගම අවධානයක් යොමු කරයි.

මූල්‍ය ප්‍රතිලාභ

- ක්‍රියාකාරිත්වය ඇගයීම සඳහා වන ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව පැවැත්වෙන වාර්ෂික දිරිගැන්වීම් වැඩසටහනක් මඟින් සෑම සේවකයෙකුගේම තනි පුද්ගල ක්‍රියාකාරිත්වය හඳුනාගනු ලැබෙයි.

- මූල්‍ය පීඩනය අවම කිරීම සඳහා සුදුසුකම් සහිත කාර්යමණ්ඩල සාමාජිකයින්ට තේ, පවිත්‍රතා සහ ඇඳුම් සඳහා දීමනා ගෙවනු ලැබේ.
- වසරේ වැඩි දින ගණනක් සේවා ස්ථානයේ ගත කිරීමට සියලු සේවකයින් යොමු කෙරෙන දිරිගැන්වීමක් ලෙස ඉතිරි වෛද්‍ය නිවාඩු දින සඳහා මුදල් ගෙවනු ලැබේ.
- සමාගම වෙනුවෙන් ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා සුදුසුකම්ලත් කාර්යමණ්ඩල සාමාජිකයින්ට ජංගම දුරකථන සැපයෙන අතර, ජංගම සහ ගෘහස්ථ දුරකථන බිල්පත් සඳහා ප්‍රතිපාදන ලබාදෙනු ලැබේ.
- වැටුප් ගෙවීමට අමතරව කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් ඇති වගකීම වටහාගනිමින්, දේශීය සහ විදේශීය මට්ටමෙන් අධ්‍යාපනික, සංස්කෘතික හෝ ක්‍රීඩා කටයුතුවලදී විශිෂ්ටතා දක්වන කාර්ය මණ්ඩලිකයින්ගේ දූ දරුවන්ට මූල්‍ය තිළිණ ප්‍රදානය කරනු ලැබේ.

වෙනත් ප්‍රතිලාභ

- අලෙවි ඉලක්ක සපුරාලන ප්‍රාදේශීය කළමනාකරුවන්ට නිල වාහන සපයනු ලැබේ.
- සේවා කටයුතු ආශ්‍රිත ඵලදායීතාව ඉහළ නැංවීමට හා සේවා වෙහෙස අවම කිරීමට දිස්ත්‍රික් අලෙවි විධායකයින් සඳහා යතුරුපැදි ලබාදෙනු ලැබේ.
- සියලුම සේවකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ආවරණය වන පරිදි වෛද්‍ය රක්ෂණ සැලසුමක් ක්‍රියාත්මක කර ඇත.
- ඉහළම අලෙවියක් වාර්තා කරනු ලබන දිස්ත්‍රික් අලෙවි විධායකයින් දිරිගැන්වීම සඳහා දේශීය හෝ විදේශීය සංචාර පිරිනමනු ලැබේ.
- පහළ සිට ඉහළට නිදහසේ සහ සුහදශීලී ලෙස තොරතුරු ගලායෑම සඳහා ඉඩ සැලසෙන විවෘත සන්නිවේදන ප්‍රතිපත්ති සහිත, මනා වැඩ පරිසරයක් ඇති වන ආකාරයේ ආයතනික සංස්කෘතියක් ස්ථාපිත කර ඇත.
- අපගේ සේවකයින්ට ආධ්‍යාත්මික සහ කුසලතා ආශ්‍රිත පුහුණු වැඩසටහන් නිතිපතා පිරිනැමෙන අතර, එමඟින් සමස්ත වශයෙන් මානසික සෞඛ්‍යය සහ රැකියා කුසලතා වැඩිදියුණු කිරීම අපේක්ෂා කෙරෙයි.

අප කාර්ය මණ්ඩලයේ සංයුතිය

ලක් පොහොර සමාගමේ සාර්ථකත්වයේ රහස වන්නේ, එහි සේවකයන් ආයතනයේ ප්‍රධාන අභිමතාර්ථ අත්පත් කර ගැනීම වෙනුවෙන් ඇති පූර්ණ කැපවීමයි. සමාගමේ මූලික උපක්‍රමික සැළසුම් ක්‍රියාත්මක කිරීම හරහා වැදගත් සන්ධිස්ථානයන් හා අරමුණු ලඟා කර ගැනීම සඳහා කැපවුන 368 දෙනෙකුගෙන් යුත් සේවක කණ්ඩායමක් සමාගම සතුව ඇත. රැකියා පදනම, සේවා වර්ගය, ප්‍රදේශය හා ස්ත්‍රී පුරුෂභාවය යන කරුණු මත සමාගමේ සේවක වර්ගීකරණය පහත දක්වා ඇත.

ස්ථිර සේවකයින් - 2018 මාර්තු 31 දාට



සියලු සේවකයින් - 2018 මාර්තු 31 දාට: 368

සේවකයින්ගේ පළාත්බද විසිරීම - 2018 මාර්තු 31 දාට

Se. No	පළාත්	සේවක සංඛ්‍යාව
1	උතුරු සහ උතුරු මැද පළාත	39
2	වයඹ පළාත	12
3	දකුණු පළාත	29
4	මධ්‍යම පළාත	32
5	නැගෙනහිර පළාත	24
6	ඌව පළාත	11
7	සබරගමුව පළාත	14
8	බස්නාහිර පළාත (ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය ඇතුලත්ව)	207
	එකතුව	**368**

ස්ත්‍රී පුරුෂභාවය මත ස්ථිර සේවකයන්ගේ බෙදී යාම - 2018 මාර්තු 31 දාට

තනතුර	වේතන කේතය	ස්ත්‍රී පුරුෂභාවය	
		ගැහැණු	පිරිමි
ජ්‍යෙෂ්ඨ කළමනාකරු	HM 2.1	0	0
ජ්‍යෙෂ්ඨ කළමනාකරු	HM 1.2	5	2
කළමනාකරු	MM 1.2	16	4
කණිෂ්ඨ කළමනාකරු	JM 1.1	25	7
කළමනාකාර සහායක (තාක්ෂණික)	MA 2.1	3	3
කළමනාකාර සහායක (තාක්ෂණික නොවන)	MA 1.2	80	65
ප්‍රාථමික මට්ටම (ශිල්පීය)	PL 3	75	0
ප්‍රාථමික මට්ටම (අර්ධ ශිල්පීය)	PL 2	4	0
ප්‍රාථමික මට්ටම (ශිල්පීය නොවන)	PL 1	79	0
		287	**81**

සේවක සෞඛ්‍යය සහ ආරක්ෂාව

සේවකයින්ගේ සෞඛ්‍යය, සමාගමේ අඛණ්ඩ කාර්ය සාධනය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වන අතර අපගේ සේවකයින්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව ප්‍රමුඛ කොට කටයුතු කිරීම අපගේ ව්‍යාපාර ක්‍රියාවලීන් ප්‍රශස්ත මට්ටමට ගෙන ඒමේ ක්‍රියාවලියේ පදනම වේ. මෙම අවධාරණය ඉහළ

කාර්ය සාධනයක් අත්පත් කරගැනීමට, ඵලදායී ප්‍රතිඵල ලඟා කර ගැනීමට, සේවක සංතාපය අඩු කර ගැනීමට සහ සමාගමේ ප්‍රතිපත්තීන් හා උපාය මාර්ගයන් කෙරෙහි සේවක විශ්වාසය වැඩි වීම වැනි ප්‍රතිඵල ලබා දී ඇත. මෙම උත්සාහය වැඩබිමේ ආරක්ෂාව සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතීන් ට අනුකූල වන අතර, මේ තුල සේවකයකුගේ සෞඛ්‍යය, ආරක්ෂාව හෝ යහපැවැත්ම අනතුරේ හෙලන යම් නොමනා සිද්ධියක් හෝ සිදුවීමක දී එය කඩිනමින් විමර්ශනය කිරීම ද එවැනි සිදුවීමක් නැවත ඇතිවීමේ ඉඩකඩ තුරන් කිරීමටද අවශ්‍ය පියවර ගනු ලබයි.

සුබසාධනය සහ මානව සම්පත්

අපගේ සියලුම කාර්යමණ්ඩල සාමාජිකයින් අතර ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම, ස්වයං වර්ධනය, නායකත්ව හැකියාවන් සහ අභියෝගයන්ට ප්‍රතිචාර දැක්වීම යනාදිය සඳහා සහාය, අනුග්‍රහය සහ පහසුකම් සපයන යහපත් ආකාරයේ පරිසරයක් නිර්මාණය කිරීමේ වැදගත්කම අප හොඳින් වටහාගෙන සිටියි.

එයට අමතර වශයෙන්, අපගේ සමස්ත මානව සම්පත් සංවර්ධන ක්‍රියාදාමයේ කොටසක් ලෙස දිරිගැන්වීම් ඉහළ නැංවීම, අත්දැකීම් ඔස්සේ ඉගෙනීම සඳහා දිරිගැන්වීම සහ උපදේශන ධාරිතාව ඉහළ නැංවීම යනාදිය සිදු කරන අතරම, තාක්ෂණික සහ නායකත්ව කුසලතා වැඩිදියුණු කිරීමට අපි විවිධ අංශ, තේමා සහ ප්‍රවණතාවන් සම්බන්ධ අභ්‍යන්තර මෙන්ම බාහිර වෘත්තිකයින්ගේ සේවාවන් යොදා ගන්නෙමු.

තවදුරටත්, සමාගම 2010 වසරේ සිට ICT පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් සිටින අතර, සමාග මේ අනුග්‍රහය යටතේ මෙම පුහුණු වැඩසටහන සාර්ථකව නිම කරන්නනන් වෙනුවෙන් ජාත්‍යන්තරව පිළිගත් ICDL සහතිකය පිරිනමයි.

සමාගමේ නිෂ්පාදන පිළිබඳ සවිස්තරාත්මක අවබෝධයක් ලබාගැනීම දසත විසිර සිටින සේවක පිරිස් සඳහා අත්‍යවශ්‍ය වන බැවින්, විශේෂ පුහුණු වැඩසටහන් අලෙවි බලකාය සඳහා කාබනික පොහොර පිළිබඳ ඉතා ඉහළ දැනුමක් ලබාදීම සිදුකරනු ඇත.

ඉගෙනුම සෑම දෙයක්ම වන අතර එහි පදනම වන්නේ පොත්ය. එනිසා මේ සඳහා, ලබාදිය හැකි හොඳම ඉගෙනුම් පරිසරය සේවකයන් හට ලබා දීමට සමාගම දූරදර්ශී වී ඇති අතර, සේවකයන්ට සිය දැනුම යාවත්කාලීන හා වැඩිදියුණු කරගැනීම සඳහා පුස්තකාල පහසුකම් ලබා දීමට කටයුතු කර ඇත.

නවීන රසායනාගාර වල වඩාත් තාක්ෂණිකව සංගත පොහොර විශ්ලේෂනයන් කාර්යක්ෂමව සිදු කිරීමට හැකී වීම සඳහා, රසායනාගාර සේවකයන් වෙනුවෙන් විශේෂ තාක්ෂණික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරයි.

රැඳවාගැනීම

කාර්යමණ්ඩල සංවර්ධන කටයුතු, සමානාත්මතාව, සුහදශීලීත්වය සහ වෘත්තීය ප්‍රාගුණ්‍යය වැඩිදියුණු කරගැනීම සඳහා අවස්ථාවන්ගෙන් උපරිම ප්‍රයෝජන ලබාගැනීමට පහසුකම් සහ ප්‍රතිලාභ සැලසෙන පරිදි ඉගෙනීමේ හැකියාව ලැබෙන මනා වැඩ පරිසරයක් නිර්මාණය කිරීම මඟින් මූල්‍ය වසර තුළදී අඩු සේවක පිරිවැයක් සහ අවම සේවක පිරිවැටුමක් පවත්වාගැනීමෙන් ලබාගත් ජයග්‍රාහී තත්ත්වය පිළිබඳව සමාගමට ආඩම්බර විය හැකිය.

ආයතනික පාලනය

ප්‍රබල ආයතනික හර පද්ධතියක් සහ සම්මත මානව සම්පත් කළමනාකරණ ක්‍රියාවලියක් මඟින් පාලනය වන ධුරාවලියක් මඟින් ආයතනකරණය වී තිබේ. ඉහළම ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සීමාසහිත ලංකා පොහොර සමාගමේ ආයතනික පාලනය පවත්වාගැනීමේ පූර්ණ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය. සමාගමේ ආයතනික පාලනයේ යාන්ත්‍රණය මඟින් සියලු පාර්ශ්වයන්ට කිසියම් විකඟතාවක් මත පිරිනැමෙන වටිනාකමක් සහතික කෙරෙයි. ආයතනික පාලනය සිදු වන්නේ පහත දැක්වෙන රෙගුලාසි, නීති සහ පනත් අනුවය.

1. 2007 වසරේ අංක 7 දරණ සමාගම් පනත
2. යහපාලනය සඳහා වන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ සංග්‍රහය
3. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ යහපාලනය සඳහා වන ප්‍රතිපත්ති ලේඛනය

අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වන්නේ රාජ්‍ය ප්‍රතිපත්ති හා අනුකූල වන පරිදි කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස රාජ්‍ය කර්මාන්ත කළමනාකරණය කිරීමය. සම්පත් ආරක්ෂා කිරීම, මනා ගිණුම් තත්ත්වයන් පවත්වාගැනීම, නිවැරදි වාර්තා සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු සහතික කිරීම සහ කළමනාකරණය සම්බන්ධ සියලු ස්ථාපිත හා වෙනත් අවශ්‍යතා අනුව කටයුතු කිරීම මඟින් මෙය කළ හැකිය.

කර්මාන්තයට ක්‍රමෝපායයික අරමුණු ඇති බවත්, එහි ක්‍රමෝපායයික අරමුණු ඉටු කරගැනීමට සමාගම කටයුතු කරන බවත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරනු ලබයි. අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණය සඳහා ඵලදායී ක්‍රමයක් පවත්වා ගැනීමත්, කළමනාකරණ කටයුතු ඵලදායී අයුරින් සිදු කිරීමත් මෙන්ම සම්පත් සහ වත්කම් ඵලදායී අයුරින් යොදවාගැනීමත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රමානුකූලව අධීක්ෂණය කරනු ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂිකව සාමාන්‍යාධිකාරීවරයාගේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව කාර්ය මණ්ඩලයේ ක්‍රියාකාරිත්වයන් ඇගයීමත්, මූල්‍ය කරුණු පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු ඒ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට සැපයීමත් සහ අවශ්‍ය වූ විටෙක එම ස්වරූපයේ වෙනත් කරුණු ක්‍රමානුකූල පදනමක් මත හෙළිදරව් කිරීමත් සිදු කරනු ලබයි.

විගණන සහ අවදානම් කළමනාකරණ කමිටු පත්කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය. සමාගම විසින් ආයතනික පාලනය සම්බන්ධ සම්මත පාලන මාර්ගෝපදේශ මාලාවක්, චර්යාධර්ම සංග්‍රහයක් සහ ක්‍රමෝපායයන් හඳුන්වා දී ඇත. මෙහෙයුම් කටයුතු සහ හිමිකාරිත්වය සම්බන්ධයෙන් කිසිදු ගැටලුවක් ඇති නොවන පරිදි රජයේ චක්‍රලේඛයන්ට අනුව මේ සියලු ව්‍යවස්ථාවන් සහ උපදෙස් මාලාවන් අනුගමනය කෙරෙන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වගබලා ගත යුතු වෙයි.

අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීම

රජය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලබන විට, එම පත්වීම් කරනු ලබන්නේ සම්මත, තරගකාරී සහ වගකීම් සහගත ආකාරයකටය. පත්වීම් ලිපිය මඟින් අදාළ බලයලත් පුද්ගලයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ බැඳීම්, කාර්යභාරයන් සහ වගකීම් පැහැදිලිව දක්වනු ලබයි. සමාගමේ ක්‍රමෝපායික ඉලක්ක සහ ආයතනික අරමුණු, සමාගමේ ආයතනික පාලනය, කළමනාකරණ හා පරිපාලන ක්‍රම සහ ක්‍රියා පිළිවෙත් සම්බන්ධ වගකීම් පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරෙනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014/15 මූල්‍ය වසර තුළදී රැස්වීම් 12ක් පවත්වා ඇති අතර, කළමනාකාරිත්වය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ලේඛන මඟින් කාලීන සහ අදාළ තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබ ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ දීමනා

රජය විසින් සැලසුම් කරන ලද දීමනා ප්‍රතිපත්ති සහ පරිමාණයන් මත පදනම්ව අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ දීමනා ගෙවනු ලැබේ. මේ දීමනා සම්බන්ධ තීරණවලට අධ්‍යක්ෂවරුන් මැදිහත් නොවේ.

සභාපති

සභාපතිවරයාගේ කාර්යභාරය සමස්ත ආයතනික ව්‍යුහය සඳහා ඉතා වැදගත් වන අතර, ඔහු විසින් ආයතනය නිවැරදි දිශාව වෙත මෙහෙයවනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. ආයතනික පාලනය පවත්වාගැනීම සම්බන්ධ කටයුතු ගැටලුවකින් තොරව සිදු වන බවට වගබලාගැනීම, සෑම අධ්‍යක්ෂවරයෙකුටම එක සමාන ලෙස සැලකීම, නිවැරදි ආකාරයෙන් වගකීම් බෙදාහැරීම, බලය සහ අධිකාරිත්වය තුලනය කිරීම, ඔහුගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යෑමේ ක්‍රියාවලිය සහතික කිරීම යනාදිය සභාපතිවරයා විසින් සිදු කරනු ඇත. සිය විශේෂඥතාව සහිත අංශවලට ඔහු දායකත්වය සපයනු ඇති අතර, සක්‍රිය කාර්යභාරයක්

ඉටු කිරීමට සියලු අධ්‍යක්ෂවරුන් යොමු කරවන අතරම මෙහෙයුම් කටයුතුවලට ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වීමෙන් වැළකී සිටිමින් අධීක්ෂණ කාර්යභාරයක් ඉටු කරනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

වෘත්තීය වශයෙන් සුදුසුකම් ලත් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම් සහ වාර්ෂික මහා සමුළු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම්දීම සහ කාලයෙන් කාලයට අදාළ වගන්ති සහ කොන්දේසි පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය යාවත්කාලීන කිරීම සම්බන්ධ වගකීම දරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳව දැනුවත්ව සිටීම, අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී ලෙස කටයුතු කරන්නේදැයි

යන්න සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා නිසි කලට පෙර බෙදාහරිනු ලබන්නේදැයි යන කරුණු හා සම්බන්ධ ක්‍රියාපිළිවෙත් නිසි පරිදි සිදු වන බවට ලේකම් වගබලා ගත යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලයට සම්බන්ධ වගකීම්, වගන්ති සහ කොන්දේසි මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත උපදෙස් සමඟ සහාය ලබාදීම පිළිබඳ මාර්ගෝපදේශකත්වය ඔහු විසින් සපයනු ඇත.

සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් සමාගමේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ වගකීම දරණු ලබයි. ඵලදායී ලෙස ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ දියත් කිරීම හා සම්බන්ධ වගකීම ඔවුන් සතුය. අධ්‍යක්ෂ මණ්ඩලයේ සලකා බැලීම සහ තීරණ ගැනීම සඳහා අදාළ තොරතුරු සහ අවශ්‍ය පැහැදිලි කිරීම් ඔවුන්ට සපයනු ලබන්නේ සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසිනි. සමාගමේ ඵලදායී කළමනාකාරීත්වය සඳහා පරිපාලන සහ නියාමන පද්ධති පවත්වාගන්නා අතරම සමාගමේ දැක්ම සහ අරමුණු සපුරාලීමට හැකි වන පරිදි මෙහෙයුම්, සැලසුම් සහ අයවැය සැකසීම ඔවුන් විසින් සිදු කරනු ලබයි.

සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සඳහා වන දීමනා තීරණය කෙරෙනුයේ දීමනා ගෙවීම් යෝජනාවලිය අනුවය.

මූල්‍ය වාර්තා

සමාගමේ වාර්ෂික මූල්‍ය තත්ත්වය සහ කාර්යසාධනය නිවැරදි සහ සාධාරණ ආකාරයෙන් දක්වමින් වාර්ෂික මූල්‍ය වාර්තා සැකසීම සම්බන්ධ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය. ශ්‍රී ලංකාවේ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට සහ 2007 වසරේ අංක 07 දරණ සමාගම් පනතට අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශන සකසා ඉදිරිපත් කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලයට සහ සාමාන්‍යාධිකාරී ඇතුළු ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට සිය වගකීම් ඵලදායී අයුරින් ඉටුකිරීමේ හැකියාව ඇති වන පරිදි වැදගත් තොරතුරු අවශ්‍ය සෑම විටෙකම මූල්‍ය වාර්තා මඟින් ඒවා පූර්ණ වශයෙන් ඉදිරිපත් කළ යුතු වෙයි.

වාර්ෂික විගණනය

වරලත් ගණකාධිකාරීවරුන්ගේ ලැයිස්තුවකින් විගණකාධිපති / මහා භාණ්ඩාගාරය විසින් නිර්දේශ කරනු ලබන සහ විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශය මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන බාහිර විගණකවරයකු විසින් සමාගමේ වාර්ෂික විගණනය සිදු කරනු ලබයි. වාර්ෂික විගණන වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විමසුමට ලක් කරනු ලැබීමෙන් පසුව වාර්ෂික මහා සමුළුවේදී අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරෙයි. විගණන ක්‍රියාවලියේදී පාක්ෂිකභාවයෙන් තොර සහ ස්වාධීන තීරණ කෙරෙහි බලපෑම් ඇති විය හැකි උපදේශන සහ වෙනත් සේවාවන් සැපයීමෙන් වැළකී සිටින අතර, මෙම බාහිර විගණකවරුන් සෑම වසර 05 කට වරක් බැගින් වෙනස් කෙරෙයි.

විගණන සහ අවදානම් කළමනාකරණ කමිටුව

පරිපාලන කටයුතුවලදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම මඟින් සමාගමේ විගණන සහ අවදානම් කළමනාකරණ කමිටුව වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මහා භාණ්ඩාගාරයේ මූල්‍ය වශයෙන් සුදුසුකම් ලත් නියෝජිතයෙකුද ඇතුළත්ව අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන සාමාජිකයින් තුන්දෙනෙකුගෙන් මෙම කමිටුව සමන්විත වෙයි. එම නියෝජිතයා විගණන කමිටුවේ සභාපති තනතුර දරයි.



අවදානම් කළමනාකරණ වාර්තාව

අනාවරණය වූ අවදානමක් හඳුනාගැනීම සහ අවබෝධ කරගැනීම සිදු කරනු ලබන්නේ අවදානම් කළමනාකරණය මඟිනි. පාඩු සිදුවීම වළක්වාගැනීම සහ පාඩුවකින් ඇති වන බලපෑම අවම කරගැනීම සඳහා ආයතනය මඟින් ඵලදායී සැලසුමක් සකසා ක්‍රියාත්මක කිරීමට එමඟින් කටයුතු කෙරෙයි. අවදානම් හඳුනාගැනීම සඳහා පැහැදිලි සහ ව්‍යුහාත්මක මඟක් අවදානම් කළමනාකරණය මඟින් සැපයෙයි. සියලු අවදානම් ගැන පැහැදිලි අවබෝධයක්ලබාගැනීම මඟින් එම අවදානම් අවම කිරීම සඳහා අවශ්‍ය ඇගයීම් කරමින් සහ ප්‍රමුඛතාවන් ලබාදෙමින් අදාළ පියවර ගැනීමට ආයතනයකට හැකි වෙයි.

නොසැලකිලිමත්බව හඳුනාගැනීම, ඇගයීම, අවම කිරීම සහ වෙනස් කිරීම සඳහා එසැණින් ක්‍රියාත්මක වන ක්‍රියාවලියක් ආයතනය විසින් අනුගමනය කරනු ලැබ ඇත. අපගේ අවදානම් කළමනාකරණ ක්‍රමයේ මූලික අරමුණ වනුයේ අවදානම් පිළිබඳව පූර්ණ අවධානය මත පදනම්ව අපගේ ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතුවලට සහාය ලබාදීමය.

කළ යුතු මූලිකම සහ වැදගත්ම දේ වනුයේ අවදානම් හඳුනාගැනීම සහ ඇගයීමය. හඳුනාගත් අවදානම් වැළැක්වීම, අවම කිරීම සහ වෙනස් කිරීම සඳහා යොදාගත හැකි ක්‍රමෝපායයන් ඉන් පසුව සැලසුම් කෙරෙයි. සමාගමේ මෙහෙයුම් කටයුතු කෙරෙහි අවධානය යොමු කරන ඵලදායී අවදානම් කළමනාකරණ ක්‍රමයක් පවත්වාගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කළ යුතුය.

මූලික අවදානම් සාධක

අපගේ සමාගමේ අවදානම් සාධක කිහිපයක් සඳහා නිරාවණය වීම් ඇති අතර, මෙහෙයුම් සැකසුමෙහි අවිනිශ්චිතතාවක් පවතී. සමාගම මුහුණ දෙන එම අවදානම් සාධක සහ ඒවා අවම කිරීම සඳහා ගෙන ඇති පියවර පසුව සාකච්ඡා කෙරෙයි.

උපායමාර්ගික අවදානම්

අපගේ ක්‍රමෝපායයික අභිමතාර්ථ සහ ප්‍රයෝජනයට නොගත් අවස්ථාවන් තුළ ගැබ්ව ඇති අවිනිශ්චිතතාවන් මඟින් ඇතිවන අවදානම් ක්‍රමෝපායයික අවදානම් ලෙස හැඳින්වේ. මෙවැනි ආකාරයේ අවදානම් පැන නඟින්නේ ප්‍රධාන වශයෙන්ම ආයතනයේ ඉලක්කවලට අනුකූලව අධ්‍යක්ෂවරුන් විසින් ගනු ලබන වැදගත් තීරණ මඟිනි.

ක්‍රමෝපායයික අවදානම පසුපස ඇති මූලිකම සංකල්පය වනුයේ අපගේ යෝජිත ආයතනික ඉලක්ක සපුරාගැනීමට අසමත්වීමය. මෙය කාරුණික අවධානයට

ගනිමින්, අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරීත්ව කණ්ඩායම විසින් අනාගතයට අදාළ වන පරිදි වසර පහක සංයුක්ත සැලසුමක්, වසර තුනක ක්‍රියාකාරී සැලසුමක් සහ වාර්ෂික සැලසුම මත පදනම්ව ක්‍රමානුකූල පසු විමසුම් සිදු කරනු ලබයි.

වෘාපාර අවදානම්

නිෂ්පාදනය, නිෂ්පාදනයේ අලෙවිය සහ වෙළෙඳාම සම්බන්ධ අවදානම්, නිෂ්පාදන පිරිවැයට බලපාන ආර්ථික අවදානම්, මෙන්ම තාක්ෂණික පරිසරයේ සහ පාරිභෝගික රුචි අරුචිකම් වෙනස් වීම හේතුකොටගෙන ඇති වන අවදානම් යනාදිය මෙම අවදානමට අයත් වේ. අපගේ ව්‍යාපාරයට සම්බන්ධ ප්‍රධානතම අභ්‍යන්තර අවදානම් වන්නේ පවතින නිෂ්පාදන සම්බන්ධයෙන් කටයුතු කිරීමේ නොහැකියාව සහ නව නිෂ්පාදන සංවර්ධනයට සම්බන්ධ අවදානම්ය. පවතින නිෂ්පාදන සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඇති නොහැකියාව සිව්වැදෑරුම් වෙයි. එනම්, පාරිභෝගිකයාගේ අවශ්‍යතා, තාක්ෂණය, කර්මාන්තමය සහ ආර්ථික කරුණු මෙන්ම සෛද්ධාන්තික අවශ්‍යතා හඳුනාගැනීමට ඇති නොහැකියාව වශයෙනි.

සමාගම විසින් පාරිභෝගික තෘප්තිය පිළිබඳ ක්‍රමානුකූල සමීක්ෂණ සහ ඔවුන්ගේ අවශ්‍යතාවන්ගේ වෙනස්වීම් පිළිබඳ ඇගයීම් පවත්වනු ලබයි. සමාගමේ සිදු විය හැකි නියාමනයන් සහ නිර්දේශයන් සම්බන්ධ අනාගත වෙනස්වීම් වටහාගැනීම සඳහා ප්‍රමුඛතම නීති මණ්ඩල මෙන්ම රජය, පොල් පර්යේෂණ ආයතනය, තේ පර්යේෂණ ආයතනය සහ රබර් පර්යේෂණ ආයතනය වැනි ආයතන සමඟද විය සමීපව කටයුතු කරයි.

නව නිෂ්පාදන හඳුන්වාදෙනු ලබන්නේ වෙළෙඳපළ සහ පාරිභෝගික අවශ්‍යතා පිළිබඳ පූර්ණ අධ්‍යයනයකින් පසුව පමණකි.

වෘාපාරමය නොවන අවදානම්

මෙම අවදානම ප්‍රධාන ව්‍යාපාරයට සම්බන්ධ නොවන අතර, දිගු කාලීන මූල්‍යකරණය සඳහා මූලික වශයෙන් සම්බන්ධ වෙයි. ඉදිරි වසර 5 සඳහා වන සංයුක්ත සැලසුම සහ වසර 3ක් සඳහා සැකසූ ක්‍රියාකාරී සැලසුම ඔස්සේ සමාගමේ දිගු කාලීන මූල්‍ය අවශ්‍යතා කල්තියා ඇගයීම මඟින් මෙම මූල්‍ය අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය මූලාශ්‍ර හඳුනාගනු ලැබේ. සැලසුම් කළ වාර්ෂික අයවැය සහ ප්‍රසම්පාදන සැලසුම මඟින් සමාගම තුළට එන සහ එයින් පිටතට යැවෙන මුදල් ප්‍රවාහය කාර්යක්ෂම කෙරෙන බැවින් කිසිවිටෙක ක්ෂණික මුදල් අවශ්‍යතා කිසිවක් පැන නොනගියි.

මෙහෙයුම් අවදානම්

ආයතනයේ බිම් මට්ටමේ සිදු වන්නේ කුමක්දැයි යන්න පිළිබඳව අදහසක් මෙයින් ලබාදෙයි. ආයතනයේ අභ්‍යන්තර සම්පත්, පද්ධති, ක්‍රියාවලීන් සහ සේවකයින් සමඟ මෙහෙයුම් අවදානම් සෘජුවම සම්බන්ධය. ගබඩා සහ යන්ත්‍රසූත්‍ර නිසි පරිදි ක්‍රියාත්මක නොවීම, සේවක පිරිවැය සහ අයහපත් දේශගුණික තත්ත්ව වැනි ස්වභාවික සංසිද්ධීන්ද මෙයට ඇතුළත්ය.

- ප්‍රමාණවත් ගිනි නිවීම් යන්ත්‍ර සහ අනතුරු සංඥා උපකරණ සහිත විශාල ආරක්ෂක පද්ධතියක් සමාගම විසින් පවත්වාගෙන යනු ලැබේ.
- ගින්නකින් ඇති විය හැකි හානි ආවරණයට සමාගම විසින් ගිනි රක්ෂණාවාරණයක් සහ අති සංවේදී පර්යේෂණාගාර උපකරණ සඳහා අමතර ඉලෙක්ට්‍රෝනික රක්ෂණයක් ලබාගනු ලැබ ඇත.
- මංකොල්ලකෑම සහ වංචා දූෂණ වැනි දෙයින් ඇති විය හැකි බලපෑම අවම කිරීම සඳහා ජංගම මුදල් සහ මුදල් සේප්පු සඳහා රක්ෂණය ලබාගෙන ඇත.
- ආනයනය කරනු ලබන සෑම නැව් තොගයක් සඳහාම ප්‍රමාණවත් සාගර රක්ෂණයන් ලබාගෙන ඇත.
- මුදල්මය සහ මුදල්මය නොවන සේවක දිරිගැන්වීම් වැඩසටහන් නිසා සමාගමේ සේවකයින් සඳහා යන වියදම අඩු මට්ටමක පවතී.

මූල්‍ය අවදානම්

මුදල් උපකරණ භාවිතයේදී ණය අවදානම, ද්‍රවශීලතා අවදානම සහ වෙළෙඳපොළ අවදානම යනාදිය ඇතුළත් මුදල් අවදානම සමාගම සතුව ඇත.

ණය අවදානම්

සමාගමේ එකඟතාවන් ඇතිකර ගත් වගකීම්වලට මුහුණදීමට අදාළ පාර්ශ්වයන් අසමත් වන්නේ නම්, සමාගමේ මූල්‍ය පාඩුවට සම්බන්ධ අවදානම වන්නේ ණය අවදානමය. ණය අවදානම ඇති වන්නේ ප්‍රධාන වශයෙන්ම ණය පදනම යටතේ කෙරෙන අලෙවිය සහ මූල්‍ය ආයතනවල කෙරෙන තැන්පතු හේතුවෙනි. මෙම අවදානම් අවම කරගැනීම සඳහා පහත සඳහන් පියවර අනුගමනය කෙරෙයි.

- බෙදාහරින්නන් පත් කිරීමට පෙර ඒ සෑම අයෙකුගේම ශක්‍යතාව පිළිබඳ සවිස්තාරාත්මක විශ්ලේෂණයක් ප්‍රාදේශීය අලෙවි කළමනාකරුවන්, ප්‍රධාන අභ්‍යන්තර විගණක, මූල්‍ය කළමනාකරු, සහ සමාගමේ නීති නිලධාරීන් යන අයගෙන් සමන්විත කණ්ඩායමක් විසින් සිදු කරනු ඇත.
- ණය පහසුකම් නිදහස් කිරීමට පෙර බෙදාහරින්නන්ගෙන් සහ අදාළ පාර්ශ්වයන්ගෙන් බැංකු ඇපකර ලබා ගැනෙයි.
- ණය කාලපරිච්ඡේදයන් සහ ණය සීමාවන් දැක්වෙන්නේ බෙදාහරින්නන් සහ අදාළ පාර්ශවයන් සඳහා සිදු කෙරෙන ණය විශ්ලේෂණවලදී ඇති කරගනු ලබන අවසන් නිගමනවලට අනුකූලවය.

ද්‍රවශීලතා අවදානම්

මූල්‍ය වගකීම්වලට මුහුණ දීමට සමාගමට ඇති නොහැකියාව ද්‍රවශීලතා අවදානම ලෙස හැඳින්වේ. ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම සඳහා සමාගම කටයුතු කරන්නේ සාමාන්‍ය මෙන්ම අනපේක්ෂිතව ඇති වන වගකීම්වලටද මුහුණ දීම සඳහා සෑහෙන මුදල් ප්‍රමාණයක් පවත්වාගැනීම සඳහාය. සමාගමෙන් පිටතට යැවෙන මුදල් සහ මෙම මුදල් ප්‍රවාහයන්ගේ ප්‍රභවයන් පිළිබඳ පූර්ව ඇගයීම් හඳුනාගැනීමට ඉදිරි වසර පහ සඳහා වන සංයුක්ත සැලසුම සහ ඉදිරි වසර තුන සඳහා වන ක්‍රියාකාරී සැලසුම උපකාරී වන අතර, සමාගම වෙතට එන සහ සමාගමෙන් පිටතට යන මුදල් ප්‍රවාහයන් කාර්යක්ෂම කිරීම සහ සියලු මූල්‍ය වගකීම් සපුරාලීම සඳහා පහසුකම් සැපයීම වාර්ෂික වාර්තාව සහ ප්‍රසම්පාදන සැලසුම මඟින් සිදු කෙරෙයි.

වෙළෙඳපොළ අවදානම්

විදෙස් විනිමය වටිනාකම වෙනස් වීම (විනිමය මුදල් අවදානම) සමඟ පොළී අනුපාත වෙනස් වීම හේතුවෙන් වෙළෙඳපොළ මිල වෙනස් වීම වෙළෙඳපොළ අවදානම ලෙස හැඳින්වෙන අතර, එමඟින් සමාගමේ ආදායමට සහ මූල්‍ය උපකරණ පවත්වාගැනීමේ හැකියාවට බලපෑම් ඇති විය හැකිය.

හුවමාරු මුදල් අවදානම්

ඇමෙරිකානු ඩොලරයට සාපෙක්ෂව ශ්‍රී ලංකා රුපියලේ වටිනාකම වෙනස් වීමෙන් ඇති වන අවදානම මඟින් සමාගමට විනිමය මුදල් අවදානම ඇති වෙයි.

පොළී අවදානම

ස්ථාවර පොළී අනුපාතයක් යටතේ කරනු ලබන ණය මිලදීගැනීම සහ බැංකු තැන්පතු සම්බන්ධ රඳවාගැනීම් පොළී සඳහා වෙළෙඳපොළ පොළී අනුපාත වෙනස් වීම පොළී අවදානම ලෙස හැඳින්වේ.

නියාමන අවදානම්

පොහොර ආනයනය, නිෂ්පාදනය, බෙදාහැරීම සහ පරිභෝජනය සම්බන්ධ රාජ්‍ය නියාමනයන් සහ පොල් පර්යේෂණ ආයතනය, තේ පර්යේෂණ ආයතනය සහ රබර් පර්යේෂණ ආයතනය වැනි රාජ්‍ය ආයතන මඟින් බලාත්මක කරනු ලබන නිර්දේශයන් වෙනස් වූ විට, ඒ අනුව කටයුතු කිරීමේ නියාමන බලය සමාගමට ඇත. නියාමන සැකැස්මේ කිසියම් වෙනසක් හඳුනාගැනීමේදී සමාගම මේ ආයතන සමඟ සමීපව කටයුතු කරයි.

කෙසේවුවද, අවදානම් සාධක මෙම ලැයිස්තුවට සීමා නොවන අතර, සමාගමේ මෙහෙයුම්වලට බලපෑම් ඇති කළ හැකි එවැනි වෙනස්වීම් සම්බන්ධයෙන් එය ඉතා සැලකිලිමත්ය.

විගණන සහ අවදානම් කළමනාකරණ කමිටු වාර්තා

2018 මාර්තු 31 වැනිදායින් අවසන් වූ වසර තුළදී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්දේශ කරන ලද කාර්ය නීතිවලට අනුකූලව විගණන සහ අවදානම් කළමනාකරණ කමිටුව කටයුතු කර ඇත.

කමිටුවේ සංයුතිය

විගණන සහ අවදානම් කළමනාකරණ කමිටුව පත් කරනු ලැබ ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සහ කමිටු සභාපති ලෙස කටයුතු කරන භාණ්ඩාගාර නියෝජිතයෙකුගෙන් කමිටුව සමන්විත වෙයි. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයා සහ කෘෂිකර්ම අමාත්‍යංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා කමිටුවේ නිරීක්ෂකයින් ලෙස කටයුතු කරති. මෙම කමිටුව 2017/18 සඳහා පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

- **ජේ. එම්. එස්. ඩී. රත්නායක මිය**
  කමිටු සභාපතිනිය
- **ඩී. කේ. එම්. ආර්. කුමාරසිරි මහතා**
  කමිටු සාමාජික
- **හේමක ලසිත බාලසූරිය මහතා**
  කමිටු සාමාජික
- **ආර්. පී. සුනන්දා පද්මිණී මිය**
  නිරීක්ෂක, විගණකාධිපති දෙපාර්තමේන්තුව
- **පී. එල්. නාමසේන මහතා**
  නිරීක්ෂක, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

කමිටු රැස්වීම් සහ සහභාගීත්වය

මෙම මූල්‍ය වසර තුළදී විගණන කමිටුව 5 වරක් රැස්වී ඇත. විගණන කමිටුවේ කැඳවුම්කරු ලෙස ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා කටයුතු කර ඇති අතර, කමිටුවේ ආරාධනය පරිදි පැහැදිලි කිරීම් සැපයීම සඳහා සාමාන්‍යාධිකාරීවරයා, අදාල අංශ ප්‍රධානීන් සහ සෙසු නිලධාරීන් රැස්වීම්වලට සහභාගි වී ඇත. රැස්වීම්වලට සහභාගිවීම පහත පරිදි විය.

දිනය	ජේ. එම්. එස්. ඩී. රත්නායක මිය	ඩී. කේ. එම්. ආර්. කුමාරසිරි මහතා	හේමක ලසිත බාලසූරිය මහතා	ආර්. පී. සුනන්දා පද්මිණී මිය	පී. එල්. නාමසේන මහතා
17.06.21	✓	-	✓	✓	✓
17.09.06	✓	-	✓	✓	×
17.12.07	✓	✓	×	✓	✓
18.01.12	✓	✓	✓	✓	✓
18.03.28	✓	✓	✓	✓	✓
	5/5	3/3	4/5	5/5	4/5

ඩී. කේ. එම්. ආර්. කුමාරසිරි මහතා පත් තරන ලද්දේ 2017/11/27

කමිටුවේ කාර්යභාරයන්

1. මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලාංකේය සහ ජාත්‍යන්තර ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව සකසා ඇත්දැයි සහතික කරගැනීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාව සහ සාධාරණත්වය විශ්ලේෂණය කිරීම.
2. සමාගමේ අභ්‍යන්තර පාලන ක්‍රමයේ ආර්ථිකය, කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව සහතික කරගැනීම, විමර්ශනය සහ ඇගයීම.
3. සමාගමේ අවදානම් කළමනාකරණ පද්ධතියේ ඵලදායීතාව විමර්ශනය කිරීම.
4. බාහිර විගණකවරුන් සමඟ සාකච්ඡා පැවැත්වීම සහ විගණන කළමනාකරණ ලිපිය විමර්ශනය කිරීම.
5. නීති, නියාමන, වගන්ති සහ චක්‍රලේඛ යනාදිය සමඟ සමාගමේ ක්‍රියාකාරකම් අනුගත වන්නේදැයි සහතික කරගැනීම.
6. අභ්‍යන්තර විගණන වාර්තා / විගණකාධිපතිවරයාගේ විගණන විමසුම් සම්බන්ධ විමසුම් සහ නිර්දේශ.
7. මහජන ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් / නියමයන් ක්‍රියාත්මක කිරීම.

වසරේ ක්‍රියාකාරකම්

අදාල පාර්ශ්වයන්ට සපයන ලද තොරතුරුවල නිරවද්‍යතාව සහ විශ්වසනීයත්වය සහතික කරගැනීම සඳහා ක්‍රියාත්මක කරනු ලැබ ඇති මූල්‍ය වාර්තාකරණ පද්ධතිය විමසුමට ලක් කළ කමිටුව විසින් ශ්‍රී ලාංකික සහ ජාත්‍යන්තර ගිණුම් ප්‍රමිතීන් සහ ආශ්‍රිත පාර්ශවීය කටයුතු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් සිය නිරීක්ෂණයන් සපයනු ලැබිණි.

අභ්‍යන්තර විගණනය

සමාගම මනා සංවිධානාත්මක බවකින් යුතු අභ්‍යන්තර විගණන අංශයකින් සමන්විත වන අතර, එහි කාර්යමණ්ඩලය විගණනය, මූල්‍ය ගිණුම්කරණය, බදුකරණය සහ ව්‍යාපාර පරිපාලනය ඇතුළු විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන පළපුරුදු වෘත්තිකයින්ගෙන් සැදුම් ලත් කාර්ය මණ්ඩලයකින් සමන්විතය.

අභ්‍යන්තර විගණන අංශයේ මූලික අරමුණු:

1. ගිණුම්කරණ සහ අභ්‍යන්තර පාලන ක්‍රම විමසුමට ලක්කිරීම
2. මූල්‍ය සහ මෙහෙයුම් තොරතුරු පරීක්ෂාව
3. මෙහෙයුම්වල ආර්ථිකය, කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව විමසුමට ලක්කිරීම
4. කළමනාකරුවන් වෙත පවරා ඇති මෙහෙයුම් සහ වැඩසටහන් නිසි පරිදි සිදු වන බවට වගබලා ගැනීම සහ මෙහෙයුම් සහ වැඩසටහන් සැලසුම් කළ පරිදි සිදු කෙරෙන බව මෙන්ම ස්ථාපිත අරමුණු සහ ඉලක්ක සමඟ මෙහෙයුම් ප්‍රතිඵල සමපාත වන බව සාධාරණ ඇගයුමක් සහිතව සහතික කිරීම
5. කළමනාකරණ ප්‍රතිපත්ති සමඟ නීති, නියාමනයන් සහ සෙසු බාහිර අවශ්‍යතා සමපාත වන බව සහතික කරගැනීම
6. විශේෂ විමර්ශන සිදුකිරීම

අභ්‍යන්තර විගණන සැලසුම, ප්‍රාදේශීය පොහොර ගබඩාවල විගණන වැඩසටහන්, නියාමන අවදානම් ඇගයුම් ක්‍රමවේදය සහ අවදානම් මත පදනම් වූ විගණන සැලසුම් කෙරෙහි අවධානය යොමු කරමින් වාර්තා කිරීම් කාලපරිච්ඡේදය අතරතුරදී විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය අධීක්ෂණය කරනු ලැබීය. විමසුමට ලක් කරන ලද වසර තුළදී අභ්‍යන්තර විගණකවරයාගේ වාර්තා සහ නිර්දේශයන් සැළකිල්ලට ගැනීම සඳහා විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණකවරයා සමඟ සාකච්ඡා පවත්වා ඇත.

අභ්‍යන්තර විගණන වාර්තා සැළකිලිමත්ව විමසුමට ලක් කරන ලද අතර, සමස්ත අභ්‍යන්තර පාලන පද්ධතීන් සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය තුළ සැලකිය යුතු වර්ධනයක් දැකගත හැකි විය.

වැදගත් කරුණු සාකච්ඡා කිරීම සඳහා ත්‍රෛමාසික පදනමක් මත කෘෂිකර්ම අමාත්‍යාංශයේ පැවැත්වෙන විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම්වලට සමාගමේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා සහභාගි වෙයි. පොහොර අලෙවිය සහ බෙදාහැරීම සම්බන්ධ ක්‍රියාවලියේදී සිදු වන අල්ලස් හා දූෂණ මර්දනය සඳහා තොරතුරු ලබාදීමට කැමති මහජනතාව සහ ඒ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙතින් රහස්‍යභාවය සහතික කරමින් තොරතුරු ලබාගැනීම සඳහා තොරතුරු තාක්ෂණ විගණන ඒකකයක් ස්ථාපිත කර ඇත. විගණකාධිපති දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව සහ පොලිස් දෙපාර්තමේන්තුව මේ සම්බන්ධයෙන් ලබාදෙන සහයෝගය ඉහළින් අගය කරමි.

බාහිර විගණනය

සමාගමේ බාහිර විගණක ලෙස විගණකාධිපති දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

සමාගමේ බාහිර විගණක ලෙස විගණකාධිපති දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

කමිටු සභාපති සහ කළමනාකාරීත්ව කමිටු සාමාජිකයින් විසින් අපේක්ෂිත සහාය කමිටුවට ලබාදෙන ලද අතර, වාර්තා කිරීම් කාලපරිච්ඡේදය අතරතුරදී ඵලදායී ලෙස ක්‍රියාත්මක වීම සඳහා කමිටුවට එය ඉතා වැදගත් විය.

කමිටු ඇගයීම

කමිටුවේ සේවා ක්‍රියාවලිය එහි විමසුමක් සමඟම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අගයනු ලැබේ. කමිටුවේ සේවා ක්‍රියාවලිය ඵලදායී වී ඇතැයි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිගමනය කරනු ලැබ ඇත.



ජේ. එම්. එස්. ඩී. රත්නායක මිය
සභාපතිනිය,
විගණන සහ අවදානම් කළමනාකරණ කමිටුව
2018 මැයි 31

තොරතුරු තාක්ෂණ අංශ වාර්තාව

තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති සහ සැලසුම්, මෘදුකාංග යෙදවුම සහ නඩත්තුව, දෘඩාංග ලබාගැනීම සහ නඩත්තුව, ජාලගතකරණ සංවර්ධනය සහ නඩත්තුව, දත්ත සහ තොරතුරු කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ලැබෙන බව සහතික කිරීම වෙබ් අඩවි නඩත්තුව සහ තොරතුරුවල ආරක්ෂාව සහතික කිරීම යන ක්‍රියාකාරකම් තොරතුරු තාක්ෂණ අංශය මඟින් ඉටු විය යුතු යැයි අපේක්ෂා කෙරෙයි.

ප්‍රධාන තීරණ ගන්නන්ට අවශ්‍ය කළමනාකරණ තොරතුරු නිසි වෙලාවට ලබා ගැනීම සඳහා ලංකා පොහොර සමාගමේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ජාලයේ පුලුල් බව නිසා සියලු විසිරුනු ඒකක මධ්‍යම ඒකකයට සම්බන්ධ කිරීම අත්‍යවශ්‍යයෙන් කළයුතු වූවා සහ සුමටව ප්‍රතිචාර දක්වන පද්ධතියක් ගොඩනැගීම සඳහා ආයතනික සම්පත් කළමනාකරණ ක්‍රමෝපායක් සංවර්ධනය කළේය.

ලංකා පොහොර සමාගමේ ව්‍යවසාය සම්පත් කළමනාකරණ (ERP) මෘදුකාංගයේ මූලික අරමුණ වන්නේ භාණ්ඩ සැපයුම් දාමයේ ක්‍රියාකාරකම්, මිලදී ගැනීමේ සිට සැකසීම, සහ පාරිභෝගිකයා වෙත බෙදාහැරීම දක්වා පිරික්සීමය. සමාගමේ දත්ත පිළිබඳ මේ සමෝධානික දැක්ම මඟින් ක්‍රියාකාරිත්ව සහ ආයතනික සීමාවන් ඔස්සේ තොරතුරු බෙදාහදාගැනීම සහ සහයෝගයෙන් යුතුව කටයුතු කිරීම ඉහළනැංවීම අරමුණු කෙරෙයි.

සමාගම විසින් ව්‍යවසාය සම්පත් කළමනාකරණ මෘදුකාංගය (ERP) යොදාගනු ලබන්නේ එහි අභ්‍යන්තර ක්‍රියාවලීන් වඩාත් කාර්යක්ෂම කිරීම සඳහාය. මේ පද්ධතියෙහි තත්කාලීන තොරතුරු ප්‍රවාහය මඟින් දත්ත රැස්කිරීම, විශ්ලේෂණය සහ වාර්තාකරණය සරල කෙරෙන අතර, එමඟින් තීරණ ගැනීමේ හැකියාව ඉහළ නැංවෙයි. ව්‍යවසාය සම්පත් කළමනාකරණ මෘදුකාංගය සඳහා සැලසුම්කරණය, තොග නැවත ගබඩා කිරීම සහ නිෂ්පාදන කාල සැලසුම්කරණය අවශ්‍ය වන අතර, එමඟින් බහුවිධ දත්ත ගොනු සහ වෙන් වෙන් වශයෙන් වාර්තාකරණ පද්ධතීන් පවත්වාගැනීමේ අවශ්‍යතාව අඩු වෙයි. කළමනාකාරිත්වයට අදාළ මොහොතේදීම සැකසීම් කළ හැකි වන බැවින් මෙම ක්‍රියාවලිය මඟින් නිෂ්පාදන පමාවන්ද හා පිරිවැයද අඩු වෙයි.

අදාළ විමසුමට ලක් කරන ලද වසර තුළදී තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් පහත පරිදි වේ:

- සියළු දිස්ත්‍රික් පොහොර ගබඩා පරිඝනකගත කරන ලද අතර සියළු ගනුදෙනු ERP හරහා මාර්ගගත කරන ලදී.
- ප්‍රාදේශීය පොහොර ගබඩාහි සියළු ගනුදෙනු දත්ත සමකාලීකව සකසන ලදී.
- ඵලදායීතාව වැඩි කළ අතර තොරතුරු රැස් කිරීමේ පිරිවැය ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය පොහොර ගබඩා වල පහත හෙළීය.
- සේවක කළමනාකරණය ඉහළ නංවමින් සියළු ප්‍රාදේශීය පොහොර ගබඩා හී සේවකයන්ගේ පැමිණීම, නිවැරදි හා යාවත්කාලීනව පැමිනීම් කළමනාකරණ පද්ධතියක් තුලින් කළමනාකරණය සිදු කරයි.
- ප්‍රාදේශීය පොහොර ගබඩා හී සේවකයින්ගේ සියළු ගෙවීම් (අතිකාල, තේ දීමනා යනාදිය) ප්‍රමාදයකින් තොරව ගෙවීම දැන් සිදු කරයි.
- සේවක නිවාඩු ඉල්ලීම හා අනුමත කිරීම වෙබ් ද්වාරයක් ඔස්සේ දැන් සිදු කලහැක.
- වැඩි දත්ත ආරක්ෂාවක් යටතේ සියළු මෙහෙයුම් කටයුතු කරගෙන යෑමට ඉඩ සලසමින්, දත්ත හී ආරක්ෂාව බාහිර සේවාදායකයක් ඔස්සේ උසස් කරන ලදී.

කාර්මික අංශ වාර්තාව

කාර්මික අංශය, ලංකා පොහොර සමාගමේ සෑම සේවකයෙක්ටම සුමිහිරි හා පහසු වැඩ පරිසරයක් ඇති බවට තහවුරු කිරීමට විඩා නොතකා වැඩ කරන අතරතුර, එය සමාගමේ සියළු අංශ සඳහා ඔවුනොවුන්ගේ නිශ්පාදන ප්‍රසම්පාදන අවස්ථාවේ සිට පාරිභෝගිකයින් වෙත සැපයුම් අවස්ථාව දක්වා වන සාමුහික ක්‍රියාවලීන්ට අවශ්‍ය කාර්මික විශේෂඥතාවය ලබා දේ.

මෙම අංශය සාමාජිකයින් 20 දෙනෙකුගෙන් පමණ සමන්විත වන අතර එය විසින් ඔවුන්ගේ ගුණාත්මක එකමුතුවක් නිර්මාණය කරනු ලැබ ඇති අතර, එය ඉහළ ගුණාත්මක, අපක්ෂපාතී කාර්මික සේවයක් සමාගමේ මෙහෙයුම් සඳහා තීරණාත්මක සියළු ස්ථිර සේවකයන්ට, සියලු ප්‍රවාහන සේවා සැපයුම්කරුවන්ට, සහ ඔවුන්ගේ නියෝජිතයින්ට, ලියාපදිංචි වූ බෙදාහරින්නන්ට සහ සිල්ලර අලෙවි බෙදාහරින්නන්ට සහ භාණ්ඩ හා සේවා සපයන්නන්ට ලබා දෙනු ලැබේ. සෑම අවස්ථාවකදීම, කාර්මික අංශය කටයුතු කරන්නේ මිත්‍රශීලී සේවා පරිසරයක් සමාගමේ සියළු පාර්ශවකරුවන්ට, හවුල්කරුවන්ට සහ සේවකයන්ට නිර්මාණය කිරීම උදෙසාය.

අනෙතුත් අංශ සඳහා, සාප්පු හා කාර්යාල සේවක පනතේ විධිවිධානයන්ට අනුව නියමිත වැඩ කළ යුතු කාලයට වඩා අඩු කාලයක් වැඩ කිරීමේ සහනයක් සලසා දී ඇති අතර, අප කාර්මික අංශය ලෙස ආඩම්බරයෙන් ප්‍රකාශ කර සිටින්නේ එම සහනය භාවිතයට නොගන්නා බව සහ ලංකාවේ කම්කරු නියාමනයන්ට යටත් වෙමින් පූර්ණ වැඩ දවසක් සේවයේ යෙදෙන බවය. සේවකයින්ගේ මෙම නිර්ලෝභී, ආත්මාර්ථකාමී නොවන කැපවීම මත අංශය විසින් 2011 වසරේ සිට අතරමැද විරාමයකින් තොරව එහි සියලු ගුණාත්මක ඉලක්ක අත්පත් කර ගැනීමට සමත් වී ඇත.

අංශය මගින් සපයන සේවාවන් පහත පරිදි වේ.

1. කිරුම් පාලම් යොදාගෙන ආනයනික පොහොර ගෙන එන ලොරි මධ්‍යම ගබඩා වෙතට යැවීමට පෙර කිරා බැලීම සහ බෙදාහැරීමේ අංශය විසින් ඒවා රටපුරා බෙදා හැරීමට පෙර කිරා බැලීම.

2. ක්‍රමවත්ව පොහොර ගබඩා කිරීමට සහ නැවත ලබා ගැනීමට භාවිතා කරන ගොඩගැසීමේ යන්ත්‍ර මෙහෙයවීම සහ නඩත්තු කිරීම.

3. බෙදාහැරීමේ අංශය විසින් භාවිතා කරන උර මැසීමේ යන්ත්‍ර, තරාදි, අත් කරත්ත, සීල් කිරීමේ උපකරණ වැනි සියළු උපකරණ අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම.

4. සියළු ගොඩ නගන ලද ප්‍රදේශ, ඉදිකිරීම් සහ භූමි ප්‍රදේශ නඩත්තු කිරීම.

5. ජල සැපයුම, විදුලිබල සැපයුම සහ අභ්‍යන්තර දුරකථන පද්ධතිය ප්‍රශස්ත ක්‍රියාකාරී තත්ත්වයක පවත්වාගෙන යෑම.



නීති අංශ වාර්තාව

හිඟ මුදල් වලින් සුවිශේෂී ප්‍රතිශතයක් අත්පත් කරගැනීම සේම ප්‍රමාද වූ ණයගැතියන් ට විරුද්ධ නීතිමය පියවර ගැනීම, සලකා බලන වසර තුළ නීති අංශය සමාගමේ ප්‍රගමනයට උදව් වූ ප්‍රධාන අංශ වේ. අතිරේක වශයෙන්, සේවක කල්ක්‍රියාවට අදාළ ප්‍රශ්න සහ ගැටළු සේම අක්‍රමිකතා අවම කිරීමට අප අංශයට හැකි වූයේ, විනයානුකූල විමර්ශන කිරීමට පිළිගැනීම හා ඒවා වේගවත්ව සිදු කිරීම තුළිනි, මේ සම්බන්ධව නීති අංශය විසින් අනෙකුත් අංශ සඳහා සේවක ගැටලු සංවාද තුළින් විසඳා ගැනීමට අවශ්‍ය සහාය ලබා දීම මගින් සේව්‍ය - සේවක ගතිකයන් ප්‍රශස්ත සමගි මට්ටමක පවත්වාගෙන යාම තහවුරු කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස අවම සේවක ගැටලු ගණනාවක් පැවති අතර එතුළින් සෘජුව හා වක්‍රව අභ්‍යන්තර සමගිය ඉහළ යෑම සහ ඵලදායිතාව වැඩි දියුණු විය.

නීති අංශය, එහි සාමාන්‍ය කටයුතුවල කොටසක් ලෙස ගිවිසුම් හා රාමු ලේඛන ක්‍රමවත්ව සැකසූයේ ඒවාගේ ශක්තිමත්භාවය හා වලංගුභාවය නීතිමය ස්ථාවරයකින් තහවුරු කිරීමටය.

ආයතනයේ සමාගම් කටයුතු වලදී සම්මත ඉහලම නීතිමය පාලනයකට යටත්ව කටයුතු කරන බව තහවුරු කරමින්, නීති අංශය විසින් සාර්ථකව සමාගමට විරුද්ධව බාහිර පාර්ශවයන් සහ නියාමන ආයතන විසින් ගෙන ආ නඩු හා පැමිණිලි වලදී සාර්ථකව සමාගම ආරක්ෂා කර ගැනීමට හැකිවී ඇත. මෙම ප්‍රයත්න වලදී නීති අංශය නිතිපතා නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගනුයේ නීතිමය ප්‍රශ්න වලට මුහුණ දෙන අපගේ වැළැඹුම සක්සුදක්සේ ස්ථාපිත හා රටේ නීතින්ට අනුකූල බව තහවුරු කරගැනීමටය.

අලෙවි අංශ වාර්තාව

සමාගමේ මෙහෙයුමට ඉතාම තීරණාත්මක ක්‍රියාකාරකම වනුයේ රට පුරා පැතිර සිටින ගොවීන්ගේ පොහොර අවශ්‍යතාවය සපුරාලීම වේ. මෙම අවශ්‍යතාවය ඉටුකරලීම සඳහා සමාගම පොහොර ආනයනය කර, කලවම් කර, කලාපීය ව පිහිටි ගුදම් 43 ක් හා ඈදුනු බෙදාහැරීමේ ජාලය ඔස්සේ බෙදාහැරීමට සහ අළෙවි කිරීමට පෙර අගය එකතු කිරීම සිදු කරයි. රට පුරා විසිරුනු වෙළෙඳසැල් 1,000 කට වඩා ඇති ජාලයක් සමාගම වර්තමානයේ දී පවත්වාගෙන යයි. "වස විස නැති රටක් - නිරෝගීමත් ජනතාවක්'' යන තේමාව ඔස්සේ රජයේ රසායනික පොහොර භාවිතය අඩු කිරීමේ සහ කාබනික පොහොර පරිභෝජනය වැඩිකිරීමේ ප්‍රතිපත්තියට ගරු කරමින් සමාගම කාබනික පොහොර නිෂ්පාදන ගණනාවක් වෙළඳපොළට හඳුන්වා දෙන ලදී.

ශ්‍රී ලංකාව කෘෂිකාර්මික ආර්ථිකයක් සහිත රටක් ලෙස යැපුම් බෝග වන වී ද, වැවිලි බෝග වන තේ, පොල්, සහල් , රබර් යනාදියද, විශාල පරාසයක වියළි හා තෙත් කලාපීය එළවළු, පළතුරු සහ ප්‍රධාන වශයෙන් අපනයනය ඉලක්ක කොට ද්විතීයබෝග ද නිෂ්පාදනය කරයි. ශ්‍රී ලංකාවේ ඇති මහත් කෘෂී විවිධත්වය නිසා පරිභෝජනයට ගත හැකි, සෘතුමය හෝ බහුවාර්ෂික ලෙස වගා කළ හැකි බෝග 500 කට වඩා පවතී.

2005 වසරේදී වී වගාව සඳහාද, 2011 වසරේදී අනෙකුත් භෝග සඳහාද ලබාදුන් පොහොර සහනාධාර ක්‍රමය නව රජය විසින් අවලංගු කර වී වෙනුවට ගොවීන්ට මුදල් සහනාධාරයක් හඳුන්වා දුන්නේය. මෙම වෙනස සමඟ රජය අපනයනය පංගු ක්‍රමය හා සීමාවන් ඉවත් කර පොහොර ආනයන වෙළෙඳපොළ විවෘත කළේය.

නව පෞද්ගලික ආයතන ගණනාවක් වෙළෙඳපළ තුළ මතුවීමත් සමඟ වෙළෙඳපොළ දැඩි තරඟකාරී විය. මේ හේතුවෙන් ලංකා පොහොර සමාගමට තරඟ වැදීමට නොහැකි තත්ත්වයක් උදා වූයේ, එය අනිවාර්යයෙන් පිළිපැදිය යුතු රාජ්‍ය ප්‍රතිපත්තීන් සහ ව්‍යාපාර ආචාරධර්ම දැඩිව පිළිපැදීමය. මේ සම්බන්ධයෙන්, රසායනික හා කාබනික පොහොර දෙවර්ගයේම ප්‍රමිතියන් පවත්වාගෙන

යනබව තහවුරු කිරීමට රජයේ නියාමන ආයතන වල තිබූ ධාරිතාමය අඩුපාඩුකම් නිසා වෙළෙඳපොළ බාල නිෂ්පාදනයන්ගෙන් පිරී ගියේය.

පොහොර සහනාධාරය 2015 දී ඉවත් කිරීම නිසා තවත් සමාගම් 30ක් පමන පොහොර වෙළඳපොළට ඇතුළු වීම නිසා, ලංකා පොහොර සමාගම සතු වූයේ 44% ක්වූ වෙළෙඳපල කොටස 15% දක්වා පහත වැටීය. ඒ කෙසේ වුවද 2018 වසරේ දී වී සඳහා පොහොර සහනාධාරය නැවත හඳුන්වා දුන්නේ ලංකා පොහොර සමාගමට හා කොළඹ කොම්ෂල් පොහොර සමාගමට එය ක්‍රියාත්මක කිරීම පවරමිනි. මේ සමඟ ශ්‍රී ලාංකික ගොවි මහතුන්ගේ රසායනික පොහොර භාවිතය වැඩි වූ අතර, ඵලදාව ගුණනය වී ආදායම ඉහළ ගියේය.

නව රජයේ ප්‍රතිපත්තිමය වෙනසත් සමඟ රසායනික පොහොරවල සිට කාබනික පොහොර වලට මාරුවීම යුගමය වෙනසකි. මෙම මාරුවීම බලාත්මක කිරීම ලංකා පොහොර සමාගමට අභියෝගයක් සේම වගකීමක්ද විය. කෙසේ වුවද, රසායනික පොහොර භාවිතය නිසා පස හායනයට ලක් වී ඇති නිසා කාබනික පොහොර සඳහා පූර්ණ මාරු වීමක් සිදු කිරීමට සංක්‍රමණික කාලයක් අවශ්‍ය විය. ගොවීන් මෙම මාරු වීමට මැලිකමක් දැක්වූයේ ඔවුන්ගේ ආසන්නතම ඉදිරි අස්වනු මට්ටම් අනෙකුත් කෘෂි රසායනික යෙදවුම් මත පදනම් වූ ක්‍රමයන්ට වඩා පසුබෑමට ලක් වීමයි. අතිරේක වශයෙන්, මෙම ප්‍රශ්නය තවත් තීව්‍ර වූයේ කාබනික යෙදවුම් සඳහා අස්වනු චක්‍රය දිගු වීම ය.

සමාගමේ පාලනයෙන් තොර බාහිර යැපුම් සාධක, ආයතනයේ ලාබදායකත්වයට බලපෑම් කරන පරිසරයක් තුල, ලංකා පොහොර සමාගම ආක්‍රමණශීලීව සහ වගකීම් සහගතව එහි නිෂ්පාදන ප්‍රචලිත කිරීමේ දැනුවත් කිරීමේ වැඩසටහනක් දියත් කළේය. මේ කාරණයට අදාලව, ලංකා පොහොර සමාගම ගොවීන් රසායනික හා කාබනික පොහොර දෙවර්ගයම සමාන්තරව භාවිතා කිරීමට ද, ක්‍රමක්‍රමයෙන් රසායනික පොහොර ප්‍රමාණය අඩු කිරීමට ද, ඊට පරස්පර ලෙස භාවිතා කරන කාබනික පොහොර ප්‍රමාණය වැඩි කිරීම්ට ද දිරිමත් කළේය. අමතර වශයෙන්, කාබනික පොහොර භාවිතයේ තාර්කික බව සහ එහි ධනාත්මක බලපෑම් පිළිබඳ අලෙවි නියෝජිතයින් ,බෙදාහරින්නන් , ක්ෂේත්‍ර නිලධාරීන් සහ අනිකුත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහාය නිලධාරීන්ගේ දැනුවත්භාවය ඇති කළේය.

රජය වස විස නැති රටක් අරමුණු කර ගැනීම ප්‍රශංසනීය වූවද මෙම ප්‍රතිපත්තිය, සහනාධාරය ඉවත් කළ පසු වසර වලදී සමාගමේ මූල්‍ය ශක්තිමත්භාවය පවත්වාගෙන යෑමේ දැඩි අපහසුතාවයක් ඇති කළේය. කෙසේ වුවද 2018 වසරේදී සහනාධාරය යථාතත්වයට පත් කිරීමත් සමඟ සාමාන්‍ය පුරෝකථනය වන්නේ මූල්‍ය තත්වය එළඹෙන වසර කීපයේදී යථා තත්වයට පත්වන බවය. නමුත්, දේශපාලන හා පාරිසරික බාහිර සාධක වලට සමාගමේ ඇති අවදානම් සහගත බව සිහියට ගන්නා අතර එහි අනාගත සමස්ත මෙහෙයුම් සැලසුම්කරණයේ දී මෙම කරුණු සැළකිල්ලට ගනු ඇත.

සමාගම ශ්‍රී ලංකාවේ ගොවීන්ට බොහෝ සෙයින් අවශ්‍ය රසායනික පොහොර සපයන අතර තුර තිරසාරත්වය දෙසට ඇති ගෝලීය නැඹුරුවෙන් ගම්‍ය වන්නේ, තිරසාර කෘෂිකර්මාන්තයට ඇති ශ්‍රී ලංකාවේ කැපවීම තහවුරු කරමින්, සමාගමේ නිෂ්පාදන කළඹ අවශ්‍යයෙන්ම කෘෂි රසායනික මත පදනම් වූ අවම කිරීමේ කෘෂිකාර්මික ක්‍රියාකාරකම් වල සිට කාබනික හෝ ස්වභාවික කෘෂිකාර්මික පද්ධතීන් දෙසට නැඹුරු විය යුතු බවයි.

රසායනික පොහොර :

පෙරකල, රසායනික පොහොර සමාගමේ ප්‍රධාන ආදායම් ප්‍රභවයක් හා ශ්‍රී ලංකා පොහොර සමාගමේ ප්‍රධාන කොටස විය විය. ඉහත සඳහන් කළ පරිදි, ලංකා පොහොර සමාගම යූරියා, TSP, MOP, SA, SOP, DAP, ERP, HERP, ඩොලමයිට්, CES, බොරේට්, සින්ක් සල්පේට්, සහ කීසරිට් වැනි පොහොර ආනයනය කර එක් එක් බෝග වර්ග ප්‍රචලිත කිරීමට වගකියන ආයතන කළ ඇති නිර්දේශ වලට අනුව මිශ්‍ර කරයි.

අවශ්‍යතාව මත පොහොර පහත පරිදි ඇසුරුම් කරයි.

වර්ගය	ඉලක්ක වෙළෙඳපල
500g (Mini Pack)	ගෙවතු
1Kg/2Kg/5Kg/10Kg	ගෘහස්ත
25Kg/50Kg	මහා පරිමාණ භාවිත කරන්නන්

සමහර ප්‍රදේශවල ගංවතුර සිදු වුව ද, පසුගිය පස් වසර තුළ ජලය ඌණ තත්ත්වයක් වාර්තා වීමේ ප්‍රතිඵලයක් ලෙස පසුගිය වසරේ ශ්‍රී ලංකාවේ අස්වැන්න අඩු වීමක් වාර්තා විය. එම නිසා, රසායනික පොහොර විකුණුම් ද අඩු විය. අතිරේක වශයෙන්, 2017 වසර ආරම්භයේ වී නිෂ්පාදනය පසුගිය වසර 10 ට සාපේක්ෂව අඩුම අගය වාර්තා වූයේ පැවති නියං තත්ත්වය හා ගංවතුර නිසාය. 2017 වසර අගදී වගා කිරීමේ ප්‍රතිශතය 201, 332 ක්, එනම් ඉලක්කයෙන් 50% ක් විය.

කාබනික පොහොර

රජයේ ප්‍රතිපත්ති වෙනසත් සමග, ලංකා පොහොර සමාගම කාබනික පොහොර ප්‍රභේද 03ක් වෙළෙඳපළට හඳුන්වා දුන්නේය. ලංකා පොහොර සමාගම දැනට බෙදා හැර ඇති රසායනික පොහොරවලට අමතරව, එය රජයේ මුල් පිරීම් සහ ඝන හා ද්‍රව දෙවිදියටම කාබනික පොහොර අවශ්‍යතා සඳහා සහාය දැක්වූයේ ය.

ඇසුරුම්	ප්‍රමාණය
සංස්ථා කාබනික (කොම්පෝස්ට්)	2Kg / 25Kg
සංස්ථා කාබනික (පෙලට්)	2Kg / 20Kg
සංස්ථා කාබනික (දියර පොහොර)	200Ml / 500Ml / 1L

බෝග වර්ග මත විකුණුම් 2017/18

පොහොර වර්ගය	Sales (Mt.)	%
සෘජු පොහොර	65,920.90	89
පොල් පොහොර	915.18	1
තේ පොහොර	2,776.39	4
රබර් පොහොර	1,073.38	1
එළවළු පොහොර	216.63	0.29
පළතුරු/ මල් පොහොර	83.85	0.11
අපනයන බෝග සඳහා පොහොර	170.42	0.23
අනෙකුත් බෝග සඳහා පොහොර	2,386.44	3
කාබනික පොහොර	352.84	0.48
එකතුව	**73,896.02**	**100**



ප්‍රසම්පාදන අංශ වාර්තාව

ලංකා පොහොර සමාගම මූල්‍ය වශයෙන් සවිමත්භාවයෙන් යුතු රජයට අයත් ව්‍යාපාරයක් වන බැවින්, එය ශ්‍රී ලංකාවේ පොදු භාණ්ඩාගාරයට අයත් වුවද, ඒකාබද්ධ අරමුදලෙන් කිසිදු මූල්‍ය සහායක් ලබා නොගනියි. එසේම, වී වගාව සඳහා රටේ පොහොර අවශ්‍යතාවයෙන් 65 සහ 75 මෙම සමාගමේ ක්‍රමවත් ප්‍රසම්පාදන ක්‍රමය මඟින් සපුරාලනු ලැබ ඇත. එනිසා, සීමාසහිත ලංකා පොහොර සමාගමේ අරමුණ සපුරාගැනීම සඳහා ප්‍රසම්පාදන අංශය විසින් සමාගම තුළ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබන්නේ සමාගම වඩාත් පුළුල් මෙන්ම විවිධාංගීකරණය වූ වෙළෙඳපොළක් සඳහා පොහොර නිෂ්පාදනය සහ අලෙවිය සිදු කරන අතරම ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය සහ කෘෂි සේවාවන් තුළ නිෂ්පාදන ආදායම සහ ලාභදායීත්වය ඉහළ නැංවීමට සක්‍රියව දායක වෙමින් ලාභ උපරිමකරණය සහ පවත්වාගැනීම සිදු කෙරෙන බවට තහවුරු කිරීමටය.

රජයේ ප්‍රතිපත්තිය වන්නේ "වසවිසෙන් තොර රටක් - නිරෝගීමත් හෙටක්" යන තේමාව යටතේ රසායනික පොහොර භාවිතය අවම කරන අතරම, කාබනික පොහොර පරිභෝජනය ඉහළ නැංවීම වන බැවින්, ප්‍රසම්පාදන අංශය විසින් රාජ්‍ය ප්‍රතිපත්තිය හා අනුකූල වන පරිදි කාබනික දියර පොහොර, කාබනික කැට පොහොර සහ කොම්පෝස්ට් පොහොර වැනි කාබනික පොහොර නිෂ්පාදන ප්‍රසම්පාදනය කිරීම සඳහා ක්‍රමෝපායයන් ක්‍රියාත්මක කරනු ලැබිණි.

මෙම අංශයේ මූලික කාර්යභාරය වන්නේ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ප්‍රසම්පාදන උපදෙස් මාලාවන් සහ නිර්දේශයන්ට අනුකූලව භාණ්ඩ, සේවාවන්, කාර්යභාරයන් සහ උපදේශන සේවාවන් සපයාගැනීමය. මූලික අවධානය යොමු කෙරෙන්නේ රටේ ගොවි ප්‍රජාවගේ අවශ්‍යතාවය සපරාලිය හැකි පරිදි රටේ පොහොර අවශ්‍යතාවය ගැලපෙන ලෙස පොහොර ප්‍රසම්පාදනය කෙරෙහිය.

අප පහත සඳහන් රසායනික පොහොර වර්ග වල ප්‍රමාණයන් පසුගිය මූල්‍ය වර්ෂය තුළදී ප්‍රසම්පාදනය කිරීමට හැකි විය.

පොහොර වර්ගය	ප්‍රමාණය
යූරියා	57,885.000
MOP	105.000
TSP	1,732.500
අනෙකුත් පොහොර	1.400.00

යූරියා, මුරියේට් පොටෑෂ් සහ ත්‍රිපල් සුපර් පොස්පේට් වැනි ප්‍රධාන රසායනික පොහොර ආනයනය ජාතික ප්‍ර සමාගම පොහොර වික්සත් අරාබි රාජධානිය, චීනය, ඉන්දුනීසියාව, බෙලරුස් ජනරජය, ඊජිප්තුව, කටාර් සහ පාකිස්ථානය වැනි රටවලින් පොහොර ආනයනය කරනු ලබන්නේ ඩොලමයිට්, ඉහළ ශ්‍රේණියේ එප්පාවල රොක් පොස්පේට් සහ එප්පාවල රොක් පොස්පේට් දේශීය ප්‍රසම්පාදන වලට අමතරවය.

සම්පාදන මාර්ග නිර්දේශය සහ උපදෙස් මාලාවේ පෙර-සුදුසුකම් ලැබීමේ ක්‍රමයට අනුකූල වේ. රසායනික පොහෙර ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාවේ යොදවන්නේ පිළිගත් කැබිනට් මණ්ඩලය විසින් පත්කරල ලද හා අනුමත කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මතය.

අතිරේක වශයෙන්, කිස්රිට්, සින්ක් සල්පේට්, ඩයි-ඇමෝනියම් පොස්පේට්, බොරේට්, ෂල්පේට් ඔෆ් ඇමෝනියා සහ කොමර්ෂල් එප්සම් වැනි සුලුපටු අමුද්‍රව්‍ය ආනයන කිරීමේ ක්‍රියාවලියේ දී ජාත්‍යන්තර තරඟකාරී මිල කැඳවීම් ක්‍රියාවලිය අනුගමනය කරනු ලබයි. එය කෘෂිකර්ම අමාත්‍යංශයේ ලේකම් අනුමත කරන ලද දෙපාර්තමේන්තුමය ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශයන් මත වේ. ඩොලමයිට්, ඉහළ ශ්‍රේණියේ එප්පාවල රොක් පොස්පේට් සහ එප්පාවල රොක් පොස්පේට් දේශීයව ප්‍රසම්පාදනය කරනු ලබන්නේ ජාතික ප්‍රසම්පාදන මාර්ග නිර්දේශ වලට අනුකූලව ප්‍රසම්පාදන කමිටුවේ හා අමාත්‍යංශයෙන් වී හා සමාන අනුමැතියන් සමගය.

ආනයන ගෙවීම් ක්‍රියාවලිය සටහන





බෙදාහැරීම් අංශ වාර්තාව

බෙදාහැරීම් අංශයේ ප්‍රධානියා කළමණාකරු (බෙදාහැරීම්) වේ. මෙම අංශය වගකිව යුතු වන්නේ අලෙවි අංශයේ තොරතුරු මත පොහොර කළවම් කිරීම, පොහොර ප්‍රාදේශීය ගබඩා සහ අනෙකුත් නියම කර ඇති ගමනාන්ත කරා බෙදා හැරීම, සමස්ත බෙදා හැරීම් ක්‍රියාවලිය කළමනාකරණය කිරීම, පොහොර තොග ලබා ගැනීම සහ ඒවා දැඩි අධීක්ෂණ තත්වයන් යටතේ ගබඩා කිරීමය.

බෙදාහැරීම් අංශයේ, රට පුරා පැතිරුණු ජාලය සතුව ශක්තිමත් දැවැන්ත, හොඳින් ස්ථාපිත වූ ගබඩා හා ගුදම් ජාලයක් පොහොර ගබඩා කිරීම හා විකිණීම සඳහා ඇත. වර්තමානය වන විට, දිස්ත්‍රික් අලෙවි කළමනාකරුවන් හා ප්‍රාදේශීය කළමනාකරුවන් විසින් අධීක්ෂණය කරන පළපුරුදු ගබඩා භාරකරුවන් සහිත රට පුරා විසිරුනු ප්‍රාදේශීය පොහොර ගබඩා 44 ක් ඇත. ප්‍රාදේශීය පොහොර ගබඩා වන්හී සාමාන්‍ය ධාරිතාව වන්නේ මෙට්‍රික් ටොන් 120,000 කි.

කාබනික පොහොර පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තිය යටතේ, බෙදා හැරීමේ අංශය ශක්තිමත් ප්‍රවර්ධන සහයක් තුළින් එම මුල පිරීමට දායක වී ඇත.

2017/18 මූල්‍ය වර්ෂය සඳහා ඉලක්ක ගත බෙදාහැරීමේ පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 150,000ක් සහ වාර්තා කළ බෙදා හළ පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 85,000 කි. වාර්තා කරන ලද බෙදා හැරීමේ ප්‍රතිශතය 56.66% කි. කාබනික පොහොර වලට අදාලව ලීටර 200,000 ක් පිටත් කොට යැවීම සිදු කරනු ලැබ ඇත.

පොහොර බෙදා හැරීම 2017/18



කාබනික පොහොර අංශ වාර්තාව

රජයේ ප්‍රතිපත්තිය වූ කෘෂි රසායන භාවිතය අවම කිරීම වෙනුවෙන් ලංකා පොහොර සමාගම සිය පූර්ණ පිට බලය ලබා දෙන්නේය. එම ප්‍රයත්නය වෙනුවෙන් එහි කාබනික අංශය මෑතකදී පිහිටු වීය. එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක වල සඳහන් පරිදි තිරසාරත්වය සඳහා වූ ගෝලීය තෙරපුම හා සමපාත වෙමින් කාබනික අංශය විසින් කෘෂිරසායන වල සිට කාබනික පොහොර යුගයක් වෙත මාරු වීම ප්‍රචලිත හා ජනප්‍රිය කිරීමේ අසීරු කර්තව්‍ය බාර ගත්තේය. මෙම දිශාවට, සලකා බලන වසර තුල එම අංශය ප්‍රචලිත කිරීමේ ක්‍රියාකාරකම් කිහිපයක්ම ඉටු කළේය.

1. කළමනාකරණ හා විශේෂ ව්‍යාපෘති කණ්ඩායමේ සහභාගීත්වය සහිතව, 2018 ජනවාරි මස දී පොළොන්නරුව හා අනුරාධපුර දිස්ත්‍රික්ක ආවරණය කරමින්, කෘෂිකාර්මික ව්‍යාපෘති නිලධාරීන් සහ ගොවි ප්‍රජාව ඉලක්ක කොට කාබනික පොහොර ප්‍රචලිත කිරීම පිණිස දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

2. මාකදුර කාබනික පොහොර විශ්ලේෂීකරණ ඒකකයේ පැවැති ප්‍රදර්ශනයේ දී, විශේෂ ව්‍යාපෘති ඒකකය විසින් කාබනික පොහොර ප්‍රචලිත කිරීමට හා සිල්ලර විකුණුම් වැඩි කර ගැනීම පිණිස කුටියක් ලබා ගැනුනි.

3. දකුණු පළාතේ කෘෂිකර්ම අමාත්‍යංශය 2017 නොවැම්බර් 27 සිට දෙසැම්බර් 01 දක්වා, පොද්දිවල පවත්වන ලද කෘෂිකර්ම සහ අධ්‍යාපන ප්‍රදර්ශනයේ දී, ලංකා පොහොර සමාගමේ විශේෂ ව්‍යාපෘති ඒකකය දකුණු පළාත් අලෙවි කණ්ඩායම හා එක්ව ප්‍රදර්ශන කුටියක් ලබා ගත්තේය.

4. "වස විස නැති රටක් - නිරෝගී ජනතාවක්" රජයේ වූ ප්‍රතිපත්තිය ලඟා කර ගැනීම පිණිස, කෘෂිකර්ම අමාත්‍ය ගරු දුමින්ද දිසානායක මැතිතුමාගේ මග පෙන්වීමෙන් ලංකා පොහොර සමාගමේ බස්නාහිර පළාත් අලෙවි විධායක මධුර ප්‍රියන්ත මහතා, සබරගම පළාත් අලෙවි විධායක තිලක් පින්නපොල මහතා සහ විශේෂ ව්‍යාපෘති ඒකකයේ නිලධාරීන් විසින් මාදිවෙල ගොවි සමිති හට කාබනික පොහොර පිළිබඳ අධ්‍යාපනය ලබා දෙන ලදී.

රසායනාගාර සේවා අංශ වාර්තාව

ලංකා පොහොර සමාගමේ පොහොර පරීක්ෂා කිරීමේ රසායනාගාරය ISO/IEC 17025/2005 තත්ත්ව සහතිකය ලත් පරීක්ෂා කිරීමේ පහසුකමක් සහ එය පරීක්ෂණ සේවාවන් සම්මත ක්‍රමවේදයන්ට, පාරිභෝගිකයින්ගේ අවශ්‍යතාවන්ට සහ අදාළ ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි සිය සේවාවන් සිදු කරයි.

කළමනාකාරිත්වය සහ ලංකා පොහොර සමාගමේ රසායනාගාර කාර්ය මණ්ඩලය පාරිභෝගිකයින්ට පරීක්ෂාවන් සහ විශ්ලේෂණයන් සම්බන්ධව පහසුකම්, පුද්ගලයන් හා තොරතුරු නිසි වෙලාවට සපයන බවට, පිරිමැසුම්දායි හා දැඩි පරීක්ෂණ ප්‍රමිතයන් පිළිපදින බවට තහවුරු කරමින් ඉහළ අනර්ඝත්වයෙන් යුතු විශිෂ්ඨ සේවාවක් ලබාදීම සඳහා කටයුතු කරනු ලැබේ.

රසායනාගාරයේ අරමුණ වන්නේ සෑම සේවකයෙකුටම සිය සේවා කාර්යභාරයන් නිවැරදි අයුරින් පළමු වරම සිදු කිරීම සඳහා පැහැදිලි අවශ්‍යතා, සුදුසු මෙවලම්/උපකරණ සහ මනා පුහුණුව ලැබෙන පරිසරයක් නිර්මාණය කිරීමය. සියලු රසායනාගාර සේවකයින් ඔවුන්ගේ රැකියා කාරයභාරයට සහ බැඳී සිටින ෂීඩ ප්‍රමිතයන්ට අදාළ ක්‍රියාවලීන් සහ ක්‍රියාපටිපාටීන් ගැන පුහුණුව හා සුදුසු කම් ලබා ඇත.

ලංකා පොහොර සමාගම වර්තමානයේ කොටස් තුනතට වර්ග කල හැකි, එනම් නැව්ගත භාණ්ඩ, ඇසුරුම් අමුද්‍රව්‍ය සහ අභ්‍යන්තර සාම්පල යන ඒවා පරීක්ෂා කරයි. එසේ වුවද, බාහිර පාර්ශවයන්ගෙන් සැලකියයුතු සාම්පල ප්‍රමාණයක් ලැබී තිබූ අතර ඒවා මුදල් අය කිරීමකින් තොරව පරීක්ෂා කරන ලදී. රසායනාගාරය වෙනම ලාභ ලබන මධ්‍යස්ථානයක් බවට පත් කිරීමේ දැනට ක්‍රියාත්මක

පරාමිතිය	පරීක්ෂණ ප්‍රමානය												
	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්	ජනවාරි	පෙබරවාරි	මාර්තු	එකතුව
එන්	0	4	5	3	21	16	14	5	13	16	0	4	**101**
පී	0	5	5	3	21	13	14	6	15	15	2	6	**105**
කේ	0	4	5	2	21	13	13	7	13	13	0	3	**94**
එම්	1	0	3	4	0	1	4	2	0	0	2	2	**19**
පී	1	0	3	4	0	1	4	2	0	0	1	2	**15**
තෙතමනය	0	1	0	3	1	4	2	0	2	9	2	3	**28**
අංශු ප්‍රමාණය	1	0	3	3	0	3	3	1	1	8	2	2	**27**
වෙනත්	2	4	9	16	64	15	22	11	6	21	8	13	**191**
එකතුව	**5**	**18**	**33**	**38**	**128**	**66**	**76**	**34**	**50**	**82**	**17**	**35**	

පොහොර සාම්පල පරීක්ෂා කිරීම

ප්‍රයත්නයේ කොටසක් ලෙස බාහිර සාම්පල පරීක්ෂා කිරීම තුලින් කළමනාකරණයේ සහාය සමඟ අපගේ පරීක්ෂණ ධාරිතාව වැඩි කර ගැනීමට බලාපොරොත්තු වේ.

සාරාංශ වාර්තාව අප්‍රේල් - මාර්තු පරාමිති වශයෙන් (2017/2018)



සාරාංශ වාර්තාව අප්‍රේල් - මාර්තු මාසිකව (2017/2018)



රසායනාගාර ආදායමේ සාරංශ වාර්තාව

වසර	ආදායම
2013	41064.00
2014	30240.00
2015	97233.50
2016	187137.00
2017	360544.50
2018 Sep	281644.5



මූල්‍ය ප්‍රකාශන

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
සීමාසහිත ලංකා පොහොර සමාගම

අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශ

2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ අංක 150(1) සහ 151 වගන්තීන්ට අනුව එහි සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල වන ආකාරයෙන් සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම සමාගමේ කටයුතු සහ සමාගමේ ලාභ අලාභ ගිණුමෙහි සත්‍ය හා සාධාරණත්වය පිලිබිඹු වන ආකාරයෙන් මූල්‍ය ප්‍රකාශන සකස් කරන බවට අධ්‍යක්ෂවරුන් වගකිව යුතුය.

මූල්‍යමය තත්වය සාධරණ නිර්වද්‍යතාවයකින් තීරණය කිරීමට ඉවහල් වන පරිදි විධිමත් ලේඛණ පවත්වාගෙන යන බවට, මූල්‍ය ප්‍රකාශන සකස් කරන බවට සහ එම ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන නිමාකාරයෙන් සිදුවන බවට අංක 148 වගන්තියට අනුව අධ්‍යක්ෂවරු වගකව යුතු වේ. ඉදිරිපත් කරනු ලබව මූල්‍ය ප්‍රකාශන වල අවංකභවය හා වාස්තවිකතාවය පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය භාරගනී. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී ගණුදෙනු වල ස්වරූපය හා අන්තර්ගතය නිසි අයුරින් පිළිබිඹු වන සාධාරණ හා විචක්ෂණ විනිශ්චයන්ට එලඹෙමින් උචිත ගිණුම් ප්‍රතිපත්ති සංගතභාවයකින් යුතුව තෝරාගෙන භාවිතා කළ බවට අධ්‍යක්ෂවරු සහතික කරති

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතට හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කරන ලද බවට ද අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.

තවද මෙම මූල්‍ය ප්‍රකාශන සමාගම් පනත යටතේ අවශ්‍ය තොරතුරු සම්පාදනය කරන අතර අධ්‍යක්ෂවරුන් තමන් සතු සමාගවම් පිළිබඳ දැනීම ප්‍රධාන මෙහෙයුම් හා සමාගමේ අබණ්ඩ පැවැත්ම පිළිබඳ නිශ්චිත තොරතුරු මත පදනම්ව තම මතය ඉදිරිපත් කරයි. මෙම මූල්‍ය ප්‍රකාශන එම පදනම මත පිළියෙල කර ඇත.

සමූහයේ වත්කම් සුරකීම පිළිබඳ අධ්‍යක්ෂවරුන් සාධාරණ පියවර ගෙන තිබෙන අතර වංචා හා වෙනත් අක්‍රමිකතාවයන් වළක්වා ගැනීමේ අරමුණින් ඒ සම්බන්ධයෙන් උචිත අභ්‍යන්තර පාලව පද්ධති ස්ථාපිත කර තිබේ. සමාගම් පනතේ අංක 57 වගන්තිය යටතේ එවැනි බෙදාහැරීමකින් පසු සමාගමට නුඹුන්වත්භාවය පිළිබඳ පරීක්ෂාවෙන් සාර්ථකත්වය ලැබිය හැකි බවට ලැබී ඇති තොරතුරු මත සෑහීමට පත්වී, සමාගම් පනතේ අංක 56 (2) වගන්තිව අනුකූලව දැනට යෝජිත ලාභාංශ බෙදාහැරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇති අතර යෝජිත ලංහාංශ සම්බන්ධයෙන් නුඹුන්වත්භාවය පිළිබඳ ප්‍රකාශනයක් සමාගමේ විගණකවරුන්ගෙන් ඉල්ලා ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයේ විධිවිදාන යටතේ ශ්‍රී ලංකා පොහොර සමාගමේ විගණනය කිරීමේ බලය හිමි විගණකාධිපති මට මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ඔවුන්ගේ මතය පිහිටුවීමට සුදුසු යැයි ඔවුන් සැලකූ පරීක්ෂාවන් භාරගැනීම සඳහා අවශ්‍ය සෑම අවස්තාවක්ම සලසනු ලැබේ.

අනුකූලතා වාර්තාව

සමාගමේ සේවකයන් හා රජයට අදාළව සමාගමෙන් එහි පරිපාලිග සමාගම් වලින් මූල්‍ය තත්ව ප්‍රකාශයේ දිනය වන විට ගෙවීමට නියමිත සියළුම නීති ප්‍රකාර ගෙවම් සිය උපරිම දැනුම අනුව ගෙවා නිමකර ඇති බව හෝ අදාල පරිදි ඒ වෙනුවෙන් ප්‍රතිපාදන සලසා ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ.



අමරනන්ද අබේගුණසේකර
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි
සී/ස ලංකා පොහොර සමාගමේ
2018 ඔක්තෝබර් 23 දිනදී ය.

සභාපතිවරයාගේ හා මූල්‍ය කළමනාකරුගේ
වගකීම් පිළිබඳ ප්‍රකාශය

2018 මාර්තු 31 දිනට සීමාසහිත ලංකා පොහොර සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කරනු ලබනුයේ පහත දැක්වෙන අවශ්‍යතාවයන්ට අනුකූල වෙමිනි.

- ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්
- 2007 අංක 07 දරණ සමාගම් පනත
- මහාභාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති සංයුක්ත පාලනය සම්බන්ධයෙන් හොඳම පරිචයන සංග්‍රහය.

මූල්‍ය ප්‍රකාශන වල සටහන් යටතේ විස්තර කර ඇති පරිදි මූල්‍ය ප්‍රකාශන සකස කිරීමේදී ප්‍රායෝගික කරගන්නා ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති උචිත පරිදි හා නිරන්තරයෙන් යෝදාගත් බව අපි සනාථ කරමු.

කිසිම අපගමනයකින් තොරව නිර්දිශ්ට ගිණුම් ප්‍රමිතීන් යොදාගෙන තිබේ. ඉහළ මට්ටමේ විචාර බුද්ධි ගෝචර හා සංකීර්ණ වැදගත් ගිණුම් ප්‍රතිපත්ති හා ඇස්තමේන්තු සම්බන්ධයෙන් විගණන කමිටියේ සහ අපගේ බාහිර විගණකයින්ගේ අදහස් විමසන ලදී.

වත්කම් සුරකීමේ, වංචා හා වෙනත් අක්‍රමිකතාවයන් වලක්වා ගැනීමේ හා අනාවරණය කර ගැනීමේ අරමුනෙන් අභ්‍යන්තර පාලන පද්ධති හා ගිණුම් ලේඛණ ස්ථාපිත කිරීමටද අප නිසි හා ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා ඇත. මේවා ඉදිරියටද ක්‍රියාත්මක වන පදනමක් මත සමාලෝචනයට, ඇගයීමට හා යාවත්කරණයට ලක්වී තිබේ. සමාගමේ අභ්‍යන්තර විගණකයින් විසින් කලින්කලට කරන ලද නිගමන තුළින් සමාගමේ ස්ථාපිත ප්‍රතිපත්ති හා පටිපාටි නිරන්තරයෙන්ම අනුගතය වී තිබෙන බවට සාධාරණ සහතික වීමක් සැලසී ඇත. එසෙ වුවද ඕනෑම අභ්‍යන්තර පාලන හා ගිණුම් තැබීමේ පද්ධතියක් තුළින් සැකසෙන සහතික වීම් කිරා බැලීමේ දී හදුනාගත යුතු වූ ආවේනික සීමාවන් තිබේ.

විගණන වල සඵලතාවය සමාලෝචනය කිරීමටත් විගණනය කිරීම, අභයන්තර පාලනය හා මූල්‍ය වාර්තාකරණයේ ගැටළු ගැන සාකච්ඡා කිරීමටත් සමාගමේ විගණන කමිටිය කලින් කලට අභ්‍යන්තර විගණකයින්ට හා බාහිර විගණකයින්ට පූර්ණ හා නිදහස් අවසරය දී තිබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විගණකාධිපති විසින් මූල්‍ය වාර්තා විගණනය කරන ලදී.

අමරනන්ද අබේගුණසේකර
සභාපති

ප්‍රියන්ත සමරවීර
මූල්‍ය කළමනාකරු
2018 ඔක්තෝබර් 23 දිනදී ය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } එජිවල්/සි/සිඑස්සී/1/17-18/11 ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2018 නොවැම්බර් 14 දින

කොටස් හිමියන් වෙත,
සීමාසහිත ලංකා පොහොර සමාගම

සීමාසහිත ලංකා පොහොර සමාගමේ 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව

සීමාසහිත ලංකා පොහොර සමාගමේ 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එම වර්ෂයෙන් අවසන් වන්නා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

කත්තිවාගණනය කළ මතය සඳහා පදනම

(අ) 2018 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු රු.18,917,610,958 ක්, වෙළඳ ණයගැනි වටිනාකම රු.293,697,701 ක් සහ ණය හිමි වටිනාකම රු.2,373,490,543 ක් සඳහා අදාළ පාර්ශවයන් විසින් ශේෂ සනාථන ඉදිරිපත් නොකෙරුණි.එම නිසා එම ශේෂ වල නිරවද්‍යතාව හා පැවැත්ම පිළිබඳ විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි වුණි.

(ආ) 2017 අංක 24 දරන දරන දේශීය ආදායම් පනතේ 6(2) ඡේදය ප්‍රකාරව සමාගම සතු ඉඩම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් ජනිත වූ ප්‍රත්‍යාගණන අතිරික්තය විලම්භිත බදු ගණනයේදී සැලකිල්ලට ගත යුතු වුවත් අස්ථිත්වය ඵලෙස සිදු නොකර සමාලෝචිත වර්ෂයේ විලම්භිත බදු ගණනය සිදු කර තිබුණි.

තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම යටතේ ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාන වලින් 2018 මාර්තු 31 දිනට සීමාසහිත ලංකා පොහොර සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය මඟින් නියම කරන පරිදි මම පහත සඳහන් කරුණු ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ සීමාවන් ඉහතින් ප්‍රකාශකළ පරිදි වේ.

(ආ) - තත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණු වලට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත් මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවන් හා අනුකූල බව මා දරන්නා වූ මතය වේ.

වාර්ෂික වාර්තා සභාගත කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

විස්තීරණ ආදායම් ප්‍රකාශනය

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ප්‍රකාශ කිරීම ශ්‍රී ලංකා රුපියල්වලිනි

	සටහන්	2018	2017
අයභාරය	3	3,373,989,990	2,350,637,985
විකුණුම් පිරිවැය	4	(3,342,492,927)	(2,119,612,208)
දළ ලාභය		**31,497,063**	**231,025,777**
අනෙකුත් මෙහෙයුම් ආදායම්	5	45,440,368	29,096,825
පරිපාලන වියදම්	6	(475,948,499)	(445,490,134)
බෙදාහැරීම් වියදම්	7	(16,819,404)	(20,490,594)
මෙහෙයුම් ලාභය		**(415,830,472)**	**(205,858,126)**
මූල්‍ය ආදායම්	8	455,960,515	333,536,542
මූල්‍ය වියදම්	8	(783,920)	126,125
බදු පෙර ලාභය		**39,346,123**	**127,804,541**
ආදායම් බදු	9	(63,882,188)	11,787,491
වර්ෂය සඳහා ලාභය		**(24,536,064)**	**139,592,032**
වෙනත් විස්තීර්ණ ආදායම්			
ප්‍රත්‍යාගණනය කරන ලද දේපල පිරියත හා උපකරණ මත අතිරික්තය		-	847,136,318
ප්‍රත්‍යාගණන අතිරික්ත මත විලම්භිත බදු ප්‍රතිලාභ		5,728,502	(173,231,211)
සමස්ත විස්තීරණ ආදායම්		**5,728,502**	**673,905,107**
වර්ෂය සඳහා සමස්ත විස්තීරණ ආදායම		**(18,807,562)**	**813,497,139**
කොටසක මූලික ඉපැයුම	10.1	(0.49)	2.78
ලාභාංශ ඉපැයුම්	10.2	(0.15)	0.83

වරහන් තුළ අගයන්වලින් අඩු කිරීම් පෙන්නුම් කෙරේ.

අංක 80 සිට 104 දක්වා පිටුව දක්වා ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශවල සංකලික කොටසක් වශයෙන් සැලකිය යුතුය.

මූල්‍ය තත්ව ප්‍රකාශනය

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ප්‍රකාශ කිරීම ශ්‍රී ලංකා රුපියල්වලිනි

	සටහන්	2018	2017
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	11	2,636,328,307	2,683,237,393
නොනිමි වැඩ	12	22,316,114	21,960,737
අස්පෘශ්‍ය වත්කම්	13	-	-
මුළු ජංගම නොවන වත්කම්		**2,658,644,421**	**2,705,198,130**
ජංගම වත්කම්			
තොගය	14	2,229,992,191	2,043,336,119
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	15	19,211,497,863	26,693,371,394
සේවක ණය හා අත්තිකාරම්	16	41,547,002	45,206,196
කල්පිරීම් සඳහා පවත්වාගෙන යන ආයෝජන	17	583,043,365	532,548,539
අනෙකුත් මූල්‍ය වත්කම්	18	4,366,920,845	3,099,723,762
මුදල් හා මුදල් සමාන දෑ	19	384,926,133	894,350,929
මුළු ජංගම වත්කම්		**26,817,927,399**	**33,308,536,939**
මුළු වත්කම්		**29,476,571,820**	**36,013,735,069**
හිමිකම් හා වගකීම්			
හිමිකම්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	20	502,456,080	502,456,080
ප්‍රත්‍යාගණන සංචිත	21	2,511,388,189	2,506,976,187
රඳවාගත් ලාභය		2,792,590,448	2,899,788,327
මුළු හිමිකම		**5,806,434,717**	**5,909,220,594**
ජංගම නොවන වගකීම			
සේවක පාරිතෝෂික බැඳීම්	22	50,551,004	66,893,460
රාජ්‍ය ප්‍රදාන	23	-	-
විලම්බිත බදු	24	119,595,155	155,078,112
ගෙවිය යුතු ණය	26	13,198,687,226	26,407,737,626
මුළු ජංගම නොවන වගකීම්		**13,368,833,385**	**26,629,709,198**
ජංම වගකීම්			
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ	25	2,508,468,200	1,400,959,514
ගෙවිය යුතු ණය	26	7,548,028,800	1,887,007,200
තැන්පතු හා අත්තිකාරම් ලැබීම්	27	133,365,452	138,241,125
වර්තමාන බදු වගකීම්	28	43,399,414	8,266,616
උපචිත වියදම් හා වෙන්කිරීම්	29	64,069,808	39,571,679
බැංකු අයිරා	19	3,972,044	759,143
මුළු ජංගම වගකීම්		**10,301,303,718**	**3,474,805,277**
මුළු හිමිකම් හා වගකීම්		**29,476,571,820**	**36,013,735,069**
කොටසක ශුද්ධ වටිනාකම		**115.56**	**117.61**

සමාගමෙහි මෙම මූල්‍ය පකාශන කට්ටලය 2007 අංක 7 දරණ සමාගම් පනතෙහි අවශ්‍යතාවයන්ට අනුරූපව පිළියෙල කර ඇති බවට මම සහතික කරමි.

මූල්‍ය කළමනාකරු

අධ්‍යක්ෂක මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම් සම්බන්ධයෙන් වගකීමට බැඳේ.
අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවට අනුමත කර අත්සන් කළේ.

සභාපති

අධ්‍යක්ෂ

23.10.2018
කොළඹ

වරහන් තුළ අගයන්වලින් අඩු කිරීම් පෙන්නුම් කෙරේ.
අංක 80 සිට 104 දක්වා පිටුව දක්වා ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශවල සංකලික කොටසක් වශයෙන් සැලකිය යුතුය.

ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ප්‍රකාශ කිරීම ශ්‍රී ලංකා රුපියල්වලිනි

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රත්‍යාගණන සංචිත	රඳවාගත් ලාභ නැවත සලකාබැලීම	එකතුව
2016 අප්‍රේල් 01 දනට ශේෂය (සටහන් අංක 02)	**502,456,080**	**1,833,071,080**	**2,797,895,594**	**5,133,422,754**
වර්ෂය සඳහා ලාභය	-	-	(7,699,299)	(7,699,299)
පෙර වර්ෂයේ ගැලපීම්	-	-	139,592,032	139,592,032
ප්‍රත්‍යාගණන වත්කම් අපහරණය	-	673,905,107	-	673,905,107
ලාභාංශ වෙන්කිරීම්	-	-	(30,000,000)	(30,000,000)
2017 මාර්තු 31 දිනට ශේෂය	**502,456,080**	**2,506,976,187**	**2,899,788,327**	**5,909,220,594**
වර්ෂය සඳහා ලාභය	-	(1,316,500)	(1,723,010)	(3,039,510)
වර්ෂය සඳහා ලාභය	-	-	(24,536,064)	(24,536,064)
අනෙකුත් විස්තීරණ ආදායම්	-	5,728,502	-	5,728,502
ලාභාංශ ගෙවීම්	-	-	(80,938,804)	(80,938,804)
2018.03.31 දිනට ශේෂට	**502,456,080**	**2,511,388,189**	**2,792,590,448**	**5,806,434,717**

සටහන් 1

2016/17 වර්ෂයේ මිලදී ගන්නා ලද ගෘහභාණ්ඩ හා උපකරණ වල අගය රු. 1,316,500ක අගය වැරදීමකින් ප්‍රත්‍යාලණන ලාභයට ගලපා ඇත. එය මෙම වර්ෂයේ දී නිවරදි කරන ලදී

රු.1,723,010ක් වූ පෙර වසරේදී වැඩිතක්සේරු කළ පොලී ආදායම රඳවාගත් ඉපැයුම් යටතේ පෙර වසරේ නිවැරැදි කිරීමක් ලෙෂ සිදු කරන ලදි.

සටහන් 2

2015 වර්ෂයේ සිට "භාණ්ඩාගාරය ලැබීම්" හි විනිමය ලාභය හා පාඩු වල වාර්තාගත නොවන විචලතාව එම වසර තුළ නිවැරදි භාණ්ඩාගාර ලැබිය යුතු ශේෂය ඇතුළත් කිරීම මගින් පූර්ව වර්ෂ ගැලපුම ලෙස හදුනාගෙන ඇත

වරහන් තුළ අගයන් වලින් අඩුකිරීම් පෙන්නුම් කෙරේ
අංක 80 සිට 104 දක්වා පිටුව දක්වා ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසක් වශයන් සැලකිය යුතුයි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ප්‍රකාශ කිරීම ශ්‍රී ලංකා රුපියල්වලිනි

		2018	2017
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශ			
බදු පෙර ලාභය		39,346,123	127,804,541
ගැලපීම්			
ක්ෂයවීම්		51,122,638	50,069,487
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය		-	79,667
රාජ්‍ය ප්‍රදාන ක්‍රමක්ෂය		-	(2,889,117)
දේපල, පිරියත හා උපකරණ විකිණීමේ ලාභ/අලාභ		17,067	(601,448)
වෙළඳ ලැබිය යුතු දෑ සඳහා හානිකරණය		936,100	-
වර්ෂය සඳහා සේවක පාරිතෝෂික අයකිරීම්		(8,353,908)	11,001,717
පොළී ආදායම		(455,960,515)	(333,536,542)
පොළී වියදම		783,920	126,125
පෙර වර්ෂයේ ගැලපීම්		(237,265)	(7,699,299)
කාරක ප්‍රාග්ධන වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය		**(372,345,839)**	**(155,644,869)**
තොගය		(186,656,072)	(1,791,570,120)
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ		7,480,937,429	4,515,232,989
සේවක ණය හා අත්තිකාරම්		3,659,194	1,002,934
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ		1,107,508,686	(2,428,719,124)
තැන්පතු හා අත්තිකාරම් ලැබීම්		(4,875,673)	(4,130,665)
ගෙවියයුතු වියදම් හා වෙන්කිරීම්		24,498,129	(124,628,826)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		**8,052,725,854**	**11,542,320**
ගෙවූ සේවක පාරිතෝෂික		(7,988,549)	(5,839,307)
ගෙවූ පොළී		(783,920)	(126,125)
ගෙවූ බදු		(18,918,444)	(220,011,618)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**8,025,034,941**	**(214,434,731)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය			
දේපල, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම්		(5,309,853)	(14,082,872)
නොනිමි වැඩ		(355,378)	(23,276,640)
දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල්		-	637,948
භාණ්ඩාගාර බිල්පත් වල ශුද්ධ ආයෝජන විකිණීම්		(2,033,158,342)	(2,162,425,736)
අනෙකුත් මූල්‍ය වත්කම් ශුද්ධ ආයෝජන		888,960,871	1,317,159,252
ලද පොළී (ශුද්ධ බදු)		241,157,666	290,125,942
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		(908,705,035)	278,487,418
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය			
වර්ෂය තුළ ණය ගැණුම්		-	11,474,044,093
ලාභාංශ ගෙවීම්		(80,938,804)	-
වර්ෂය තුළ ණය පියවීම්		(7,548,028,800)	(10,639,739,262)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**(7,628,967,604)**	**834,304,831**
මුදල් හා මුදල් සමාන දෑ වර්ෂය තුළ සිදුවූ වෙනස්වීම්		**(512,637,697)**	**898,357,518**
වර්ෂ ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ		893,591,786	(4,765,733)
වර්ෂ අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ	**සටහන් 19**	**380,954,089**	**893,591,786**

වරහන් තුළ අගයන් වලින් අඩුකිරීම් පෙන්නුම් කෙරේ
අංක 80 සිට 104 දක්වා පිටුව දක්වා ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශවල සංකලික කොටසක් වශයෙන් සැලකිය යුතුය.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

1. ආයතනික තොරතුරු

1.1. සාමාන්‍ය

සීමාසහිත ලංකා පොහොර සමාගම ශ්‍රී ලංකාවේ ස්ථාපනය කරන ලද නිත්‍යවාසී හා සීමිත වගකීම් සහිත සියලුම අයිතීන් ශ්‍රී ලංකා රජය සතු සමාගමකි.

1.2. ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වභාවය

සමාගම ප්‍රධාන ක්‍රියාකාරකම ලෙස වී, තේ, පොල්, රබර් සහ අනෙකුත් අස්වනු සඳහා අවශ්‍ය පොහොර ආනයනය, මිශ්‍ර කිරීම හා අලෙවිකරණය සිදු කරයි.

1.3. මූල්‍ය වර්ෂය

සමාගමේ මූල්‍ය වාර්තාකරණ කාල සීමාව මාර්තු 31 දිනෙන් අවසන් වේ.

1.4. ලියාපදිංචි කාර්යාලය

සමාගම ලියාපදිංචි කාර්යාලය ලක්පොහොර ස්වර්ණ ජයන්ති මාවත, හුණුපිටිය, වත්තල. පිහිටා ඇත.

1.5. සේවක සංඛ්‍යාව

2018 මාර්තු 31 දිනට සමාගමේ සේවක සංඛ්‍යාව 408 කි. (2017- 420)

1.6. මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමත කිරීම.

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා වර්ෂ 2018 ක් වූ ඔක්තෝබර් 23 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවෙන් අනුමැතිය ලබා දී ඇත.

2. සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1. පිළියෙල කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලවය. වෙතිහාසික පිරිවැය සංකල්පය පදනම්ව පිළියෙල කර ඇති මෙම මූල්‍ය ප්‍රකාශන වල ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනයෙන් වෙනස් කර ඇත. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරන ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණයට නිශ්චිත තීරණාත්මක වන ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිතා කිරීමට සිදුවේ. එසේම ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීමේදී කළමනාකරණයේ මතයන් යොදා ගැනීමද අවශ්‍ය වේ. ඉහළ පරාසයක විමසුමක් හෝ සංකීර්ණතාවයක් හෝ නිගමනයන් ඇස්තමේන්තු හා සම්බන්ධ වන විශේෂිත අනාවරණයන් මෙම මූල්‍ය ප්‍රකාශන වල සටහන් 2.26 දක්වා ඇත.

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය පහත සඳහන් අයිතමයන් හැර වෙතිහාසික පිරිවැය පදනම මත සමාගමේ මූල්‍ය ප්‍රකාශය සකස් කර ඇත.

- අර්ථ ප්‍රතිලාභ වගකීමක් වර්ථමාන වටිනාකමක් ලෙස හඳුනා ගැනේ.
- සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණන ලද දිනය වන සාධාරණ අගය වන තක්සේරු ප්‍රමාණයක් දී අත්පත් කර ගැනීම හා ඊට පසුව කරන අවස්ථාවේ දී පිරිවැය මනිනු ලැබේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන හා මූල්‍ය ප්‍රතිපත්ති සටහන් සමන්විත වන්නේ පවත්නා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය විස්තීරණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවන් පරිදි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් වලට අනුකූල වන පරිදිය.

2.2. ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම්.

වෙනත් ආකාරයකට සඳහන් කර නොමැති අවස්ථා වලදී සමාගම විසින් පෙර මූල්‍ය වර්ෂ වලදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති ඒ ආකාරයෙන්ම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත මුල් වරට භාවිතා කළ මෙම වර්ෂයට අදාළ කරගෙන ඇත. වඩා හොඳ ඉදිරිපත් කිරීමක් හා වර්තමාන වර්ෂය සමඟ සැසඳීම සඳහා අවශ්‍ය අවස්ථා වලදී පෙර වර්ෂයේ මූල්‍ය වාර්තා වෙනස් කර ඇත.

2.3. විදේශ මුදල් ගණුදෙණු

2.3.1. මෙහෙයුම් හා ඉදිරිපත් කරන මුදල් ඒකකයන්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර, එය සමාගම මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන ප්‍රධාන මුදල් ඒකකය වේ.

2.3.2. ගණුදෙණු හා ශේෂයන්

තත්කාලීනව බලපවත්නා වූ අනුපාතිකය අනුව සියළුම විදේශ විනිමය ගණුදෙණු ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්ථනය කෙරේ. විදේශ වලංගු මුදල් වලින් දක්වා ඇති මූල්‍ය වත්කම් හා වගකීම් වර්ෂය

අවසානයේදී පැවති විදේශ විනිමය අනුපාතය අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්ථනය කෙරේ. ඒ අනුව ලබන්නා වූ ලාභය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ගිණුම්ගත කෙරේ. මූල්‍ය නොවන වත්කම් හා වෙතිහාසික පිරිවැය මත මනිනු ලබන අතර මුල් ගණුදෙණුව සිදුකළ දිනයේ දී පැවති විදේශ විනිමය අනුපාතිකයට අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කෙරේ.

2.4.1. දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ පිරිවැය ලෙස මූලික වශයෙන් ගැණුම් පිරිවැය හා වැඩ කළ හැකි හා භාවිතා කළ හැකි තැනට, තත්වයට පත් කිරීම සඳහා දරණ වියදම් වල චිකතුවෙන් වාර්තා කර ඇත.

සමාගමේ මූල්‍ය තත්වයෙහි දේපල, පිරියත හා උපකරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව වාර්තා කර ඇත. ඉඩම් හා ගොඩනැගිලි හැර අනෙකුත් දේපල, පිරයත හා උපකරණ පිරිවැය අගයෙන් වාර්තා කර ඇත. ඉඩම් හා ගොඩනැගිලි හැර අනෙකුත් දේපල, පිරයත හා උපකරණ සමුච්චිත ක්ෂය හෝ සමුච්චිත හානිකරණය පිරිවැයෙන් අඩුකොට වාර්තා කර ඇත. 2010 වර්ෂයේ සමාගම ඉඩම් හා ගොඩනැගිලි වල ප්‍රත්‍යාගණන අගය ගණනය කොට වත්කමේ සාධාරණ අගයේ සිදු වූ වෙනස්කම් ස්කන්ධ ප්‍රකාශනයට හදුනාගෙන ඇත.

දේපල, පිරියත හා උපකරණ අලුත්වැඩියාවේදී හා නඩත්තු කිරීමේදී මුල් තක්සේරු ක්‍රියාකාරී ප්‍රමිතියේදී බලාපොරොත්තු වූ ඉදිරි ආර්ථික ප්‍රතිලාභ නැවත ඇති කිරීමට දරණ වියදම් ප්‍රාග්ධනිත කරනු ලබන අතර අනෙකුත් වියදම් අදාළ වර්ෂයේදී විස්තීරණ ආදායම් ප්‍රකාශනයට ගලපනු ලබයි.

ඉඩම් හැර අනෙකුත් වත්කම් සරල මාර්ග ක්‍රමයට පිරිවැය හෝ ප්‍රත්‍යාගණන අගය මත වත්කමේ ප්‍රයෝජනවත් ජීවකාලය තුලදී පහත අනුපාතයන්ට ක්ෂය කරනු ලබයි.

ගොඩනැගිලි	අවුරුදු 40
යන්ත්‍රාගාර හා උපකරණ	අවුරුදු 15 - 10 දක්වා
මෝටර් රථ	අවුරුදු 05
පාපැදි	අවුරුදු 03
කාර්යාලීය ගෘහ භාණ්ඩ	අවුරුදු 03
කාර්යාලීය උපකරණ	අවුරුදු 03
වැඩපොල මෙවලම්	අවුරුදු 05
රසායනාගාර උපකරණ	අවුරුදු 03
වෙනත් උපකරණ	අවුරුදු 03
භෝජනාගාර උපකරණ	අවුරුදු 05
පරිෂණක උපංග	අවුරුදු 03

වත්කමක ධාරණ අගය එම වත්කමෙන් නැවත අගය කරගත හැකි අගයට වඩා අඩුවන විට ධාරණ අගය නැවත අගය කරගත හැකි අගය දක්වා ක්ෂය කරනු ලබයි.

2.4.2. අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කරගන්නා ලද පරිෂණක මෘදුකාංග හා මෙහෙයුම් පද්ධති අත්පත් කර ගැනීමට හා වැඩ කරගත හැකි තත්වයට පත්කිරීමට දරණු ලබන වියදම් ප්‍රාග්ධනිත කර ඇත. අස්පෘශ්‍ය වත්කම් ඒවායේ පිරිවැය අගයෙන් සමුච්චිත ක්‍රමක්ෂය හෝ සමුච්චිත හානිකරණයෙන් අඩුකොට වාර්තා කර ඇත. මෙම පිරිවැය පහත පරිදි වත්කමේ ඵලදායී ජීවිතකාලය පුරා ක්‍රමක්ෂය කරයි.

පරිෂණක මෘදුකාංග අවුරුදු 03

පරිෂණක මෘදුකාංග හා මෙහෙයුම් පද්ධති නඩත්තු කිරීම සඳහා දරණ වියදම් වියදමක් ලෙස හඳුනා ගැනේ.

2.4.3. මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සෑම වාර්තාකරණ දිනයකදීම වත්කම්, හානිකරණය වීමේ සංඥාවක් ඇත්දැයි සමාගම තක්සේරු කරයි. යම් වත්කමක් සඳහා එවැනි සංඥාවක් ඇත්නම් සමාගම වත්කමෙහි නැවත අයකරගත හැකි අගය ඇස්තමේන්තු කරයි. එකිනෙක වත්කමෙහි නැවත අයකරගත හැකි අගය ගණනය කිරීම අපහසු අවස්ථා වල සමාගම මුදල් උත්පාදන ඒකකයන් වල නැවත අගය කළ හැකි අගයන් ගණනය කරනු ලබයි.

වත්කම නැවත අයකරගත හැකි අගය එහි සාධාරණ අගයට හෝ වත්කම භාවිතයේ ප්‍රතාලාභයන්ට වඩා අඩුවන විට වත්කම නැවත අයකරගත හැකි අගය දක්වා ක්ෂය කරනු ලබයි.

වත්කම නැවත අයකරගත හැකි අගයට වඩා වත්කමේ සාධාරණ අගය වැඩිවන විට එම වත්කම නැවත අගව කළ හැකි වටිනාකම දක්වා විස්තීරණ ආදායම් ප්‍රකාශයට කපා හරිනු ලබයි.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

2.5. මූල්‍ය වත්කම්

2.5.1. සමාගම මූලික හඳුනා ගැනීමේදී තම මූල්‍ය වත්කම් පහත පරිදි වර්ගීකරණය කරයි.

අ) කල්පිරීම තෙක් පවත්වා ගන්නා මූල්‍ය වත්කම්
ආ) ණය සහ ලැබිය යුතු දෑ

(අ) කල්පිරීම තෙක් පවත්වා ගන්නා මූල්‍ය වත්කම්

සමාගම විසින් කල්පිරීම තෙක් රඳවා තබා ගැනීමේ අභිප්‍රායෙන් හා හැකියාවෙන් යුක්තව තබාගෙන ඇති නිශ්චිත හෝ ස්ථිර වූ ගෙවුම් වලින් සමන්විත ව්‍යුත්පන්න කල නොහැකි මූල්‍ය වත්කම් මේ නමින් හැඳින්වේ. කල්පිරීම තෙක් පවත්වා ගන්නා මූල්‍ය වත්කම් ජංගම වත්කම් යටතේ වර්ග කර ඇත.

(ආ) ණය හා ලැබිය යුතු දෑ

ව්‍යුත්පන්න කල නොහැකි මූල්‍ය වත්කම් වන ණය හා ලැබිය යුතු දෑ උපලබ්ධි වීමට නියමිත තක්සේරු කල වටිනාකම මත පදනම්ව වාර්තා කර ඇත.

ජංගම නොවන වත්කම් යටතේ දක්වා ඇති වාර්තා කරන දිනයේ සිට මාස 12 කට පසු උපලබ්ධි වීමට නියමිත ණය සහ ලැබිය යුතු දෑ හැර අනෙකුත් ණය හා ලැබිය යුතු දෑ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. සමාගමේ ණය හා ලැබිය යුතු දෑ, ලැබිය යුතු සහනාධාර, වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ ප්‍රතිමිලදී ගන්නා රාජ්‍ය බැඳුම්කර, ස්ථාවර තැන්පතු, පෙර ගෙවීම්, අත්තිකාරම්, තැන්පතු, සේවක ණය සහ වාර්තාකරණ දිනට මුදල් හා මුදල් සමාන දෑ වලින් සමන්විත වේ.

2.5.2. හඳුනාගැනීම හා මූලික මැනීම

සමාගමේ ණය හා ලැබිය යුතු දෑ සහ තැන්පතු ඒවා ඇතිවූ දිනට මූලික වශයෙන් හඳුනාගැනේ. අනෙකුත් මූල්‍ය වත්කම් මුල්වරට හදුනා ගැනීමේදී වෙළඳාම් සිදු වූ දිනට එනම්, සමාගම මූල්‍ය උපකරණයන්හි ගිවිසුම්ගත බැඳීමේ පාර්ශවයන් බවට පත් වූ දිනට හදුනාගත යුතු මූල්‍ය වත්කමක් වශයෙන් අගය කරනුයේ සාධාරණ අගයට ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගය යන වර්ගීකරණයට අයත් නොවන්නා වූ අයිතමයන්ට අදාළ අත්පත් කර ගැනීමට හෝ නිකුත් කිරීමට අදාළ කරගත හැකි ගණුදෙණු වල පිරිවැයට එකතුකල අගයයි. සමාගම විසින් එහි මූල්‍ය වත්කම් හඳුනා ගැනීම නවතා දමනුයේ මූල්‍ය වත්කම් තුළින් මුදල් ලැබීමට ඇති ගිවිසුම්ගත බැඳීම කල්පිරීමකදී හෝ එම මූල්‍ය වත්කම් වලට අදාළ සියලු අවධානම් හා පුතිලාභයන් වෙනත් පාර්ශවයක් වෙත පරිවර්තය කරන අවස්ථාවකදීය.

2.5.3. පසුකාලීන මැනීම

(අ) කල්පිරීම තෙක් පවත්වා ගන්නා මූල්‍ය වත්කම්

කල්පිරීම තෙක් පවත්වා ගන්නා මූල්‍ය වත්කම් සඵල පොළී අනුපාතිකය භාවිතා කර ක්ෂය වූ පිරිවැයෙන් හානිකරණයන් අඩු කළපසු අගයට අගය කරනු ලැබේ. අත්පත් කර ගැනීමේ වත්කම් හෝ අධිභාරයන් සහ ගණුදෙණු පිරිවැය මූල්‍ය වත්කමේ ක්‍රමක් ක්ෂය පිරිවැය ගණනයේ දී සලකා බලයි.

(ආ) ණය හා ලැබිය යුතු දෑ

මුල්වරට අගය කිරීමෙන් පසුව ණය හා අනෙකුත් ලැබිය යුතු දෑ සඵල පොළී අනුපාතිකය භාවිතා කර ක්‍රමක් ක්ෂය වූ පිරිවැයෙන් හානි කරණයෙන් අඩුකළ පසු අගයට වාර්තා කරයි.

2.5.4. මූල්‍ය වත්කම් හානිකරණය

ක්‍රමක් ක්ෂය පිරිවැයට පවත්වාගෙන යනු ලබන වත්කම්

සමාගම සෑම ගිණුම් වර්ෂයක් අවසානයේදී තම මූල්‍ය වත්කම් හානිකරණයට ලක් වී ඇති බවට සාක්ෂි තිබේද නැද්ද යන්න පිළිබඳව විමසා බැලිය යුතුය. මූල්‍ය වත්කමක් හානිකරණය කිරීම සහ එම හානිකරණ අලාභය දැරිය යුත්තේ මුල්වරට හදුනා ගැනීමෙන් පසුව ඇති වූ එක් හේතුවක් (සිදුවීමක්) හෝ හේතු කිහිපයක් නිසා වූ බවට සාක්ෂි ඇත්නම් හා එම අලාභ සිදුවීමෙන් අනාගත මූල්‍ය ප්‍රවාහයන් මත ඇති වන්නා වූ බලපෑම විශ්වාසනීය ලෙස ආගණනය කළ හැකිනම් පමණි. ක්‍රමක් ක්ෂය වූ පිරවැය මත පවත්වාගෙන යනු ලබන ණය හා ලැබිය යුතු දෑ වල හානිකරණ අලාභ හදුනාගත යුත්තේ වත්කම් පවත්වාගෙන යන අගය හා එම වත්කමේ අනාගත මුදල් ප්‍රවාහයන් සඵලදායී පොළී අනුපාතය මත වට්ටම් කළ පසු අගය අතර ඇති වෙනසයි. (අනාගත මුදල් ප්‍රවාහයන් සැලකීමේදී දරණු නොලබන අනාගත අපේක්ෂිත අලාභ ඉවත් කරයි.) වත්කමේ පවත්වාගෙන යනු ලබන අගය හා කපාහල යුතු අගය අතර අලාභය විස්තීරණ ආදායම් ප්‍රකාශනය සඳහා හඳුනාගත යුතුය.

යම් හෙයකින් පසු කාල පරිච්ඡේදයේදී හානිකරණ අලාභය අඩු වුවහොත් එම අඩුවීම හානිකරණය හඳුනා ගැනීමෙන් පසු ඇති වූ කිසියම් සිදුවීමකට අදාළ කළ හැකි නම් පමණක් කලින් හඳුනාගත් හානිකරණ අලාභය ප්‍රත්‍යාවර්ථනය කළ හැකිය.

2.6. තොගය

තොගය (සෘජු හා මිශ්‍ර පොහොර) පිරිවැය අගයෙන් සහනාධාර අඩුකර දක්වා ඇත. පිරිවැය ගණනය කරනු ලබන්නේ පළමු ලබාගත් තොග පළමු බැහැර කිරීමේ ක්‍රමයටය. මිශ්‍ර පොහොර තොග පිරිවැය අමුද්‍රව්‍ය, සෘජු වේතන, අනෙකුත් සෘජු පිරිවැයන් හා නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයන්ගෙන් සමන්විත වේ. දේශීයව මිලදී ගත් පොහොර පිරිවැයට වාර්තා කර ඇත. සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී විකිණීමට බලාපොරොත්තු වන මිලෙන් එයට අදාළ වියදම් අඩු කිරීමෙන් ශුද්ධ උපලබ්ධි අගය ගණනය කර තිබේ.

පාරිභෝගික ද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය ඊට අදාළ පිරිවැය යටතේ දක්වා ඇත.

2.7. වෙළඳ ලැබිය යුතු දෑ

සාමාන්‍ය ව්‍යාපාර චක්‍රය තුළ භාණ්ඩ විකිණීමෙන් ලැබිය යුතු මුදල් වෙළඳ ලැබිය යුතු දෑ වේ. ණය වකතු කිරීම සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාවලිය තුලදී බලාපොරොත්තු වන අතර, ඒවා ජංගම වත්කම් ලෙස වර්ග කර ඇත. පළමු හඳුනාගැනීමෙදී වෙළඳ ලැබිය යුතු ඉන්වොයිස් වටිනාකම වන සාධාරණ අගයට හඳුනාගැනේ. පසුව ඉන්වොයිස් අගයෙන් හානිකරණයන් අඩුකිරීමෙන් හඳුනාගැනේ.

සමාගම සෑම ගිණුම් කාල පරිච්ඡේදයක් අවසානයේදීම තම වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණයට ලක් වී තිබේද නැද්ද යන්න පිළිබඳ විමසා බලයි. සමාගමේ ණය වකතු කිරීම පිළිබඳ අතීත පුරුද්ද, ගෙවීම් ප්‍රමාද වීමේ දින ගණන උපරිමය දින 90ට වැඩිවීම යනාදිය හානිකරණය ගණනයේ දී සලකා බලයි. වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය හා එම හානිකරණ අලාභය දැරිය යුත්තේ එම හානිකරණය පිළිබඳ සාක්ෂි ඇත්නම් පමණි. සියලුම වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය සඳහා තනි තනිව සලකා බලයි.

වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය නිර්ණය කිරීමේ පදනම හා ආකෘතිය පහත පරිදි වේ.

තනි තනිව ඇගයීමේ ක්‍රමයට හානිකරණය ගණනය කිරීම සඳහා පහත දැක්වෙන වෙළඳ ලැබිය යුතු දෑ තනි තනිව ආගණනය කර ඇත.

I. විවිධ සේවා සමූපකාර සමිති

II. ගොවිජන සේවා මධ්‍යස්ථාන

III. බලයලත් නියෝජිතයින්

IV. රාජ්‍ය ආයතන හා දෙපාර්තමේන්තු

2.8. මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දී අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු, අනෙකුත් මාස 03 අඩු කාලයකින් කල් පිරෙන ඉහළ ද්‍රවශීලතාවයකින් යුත් ආයෝජන, මුදල් හා මුදල් සමාන දෑ ලෙස වර්ගීකරණය කෙරේ.

2.9. ප්‍රකාශිත ප්‍රාග්ධනය

ශ්‍රී ලංකා රජයට නිකුත් කරන ලද සාමාන්‍ය කොටස් හිමිකම ලෙස වර්ගීකරණය කරයි.

2.10. මූල්‍ය වත්කම්

සමාගම මූල්‍ය වගකීම් අනෙකුත් මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත. සමාගමේ අනෙකුත් මූල්‍ය වගකීම් ලෙස ණය, වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ සහ බැංකු අයිරා ඇතුලත් වේ. අනෙකුත් මූල්‍ය වගකීම් මූලිකවම සෘජුව වෙන්කර හැකි අනෙකුත් වියදම් සමග සාධාරණ අගයට හඳුනා ගනී. පසුව සඵල පොළී අනුපාතිකය භාවිතා කරමින් හානිකරණ පිරිවැය මත පදනම්ව හඳුනාගනී. සමාගම ගිවිසුම් ප්‍රකාරව බැඳීම් ඉවත් කිරීමේදී, අවලංගු කිරීමකදී හෝ කල් ඉකුත්වීමකදී මූල්‍ය වගකීම් හඳුනා ගැනීම නවතා දමයි.

2.11. වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ

සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී භාණ්ඩ හා සේවා අත්පත් කර ගැනීම නිසා ඒවාට ගෙවීමට ඇති වූ බැඳියාව වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ලෙස වර්ග කරයි. ව්‍යාපාරයේ සාමාන්‍ය කටයුතු වලින් වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරයි.

වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ මූලිකව ඒවායේ ගණුදෙණු වටිනාකම වන සාධාරණ අගයට හඳුනා ගනී. පසුව මුදලෙහි කාලීන වටිනාකම වැදගත් නොවන විට සහ කෙටිකාලීනව ගෙවීමට බලාපොරොත්තු වන විට ඒවායේ නියමිත ඉන්වොයිස් වටිනාකමට හඳුනා ගනී.

2.12. ණය ගැණුම්

ණය ගැණුම් මූලිකව වාර්තා කළ ශුද්ධ ගණුදෙණු වටිනාකමට, සාධාරණ අගයට හඳුනා ගනී. පසුව

සුළු පොළී අනුපාතිකය භාවිතා කරමින් ක්‍රමක්ෂය වූ වටිනාකමට හඳුනා ගනී.

2.13. ණය ගැණුම් පිරිවැය

වර්ෂය තුළ ණය ගැණුම් පිරිවැය විස්තීරණ ආදායම් ප්‍රකාශනයෙන් ගලපා ඇත.

2.14. රාජ්‍ය ප්‍රදාන

රාජ්‍ය ප්‍රදානයන් ලැබෙන බවට සෑහීමකට පත්විය හැකි තහවුරුවක් ලැබීමත්, සමාගම විසින් අදාළ කොන්දේසි සපුරන්නේ නම් රාජ්‍ය ප්‍රදාන ඒවායේ සාධාරණ අගයට හඳුනාගනී.

ආනයන වියදම් පියවීම සඳහා ලැබෙන සහනාධාර වලට අදාළ වියදම් එම වියදම් දරනු ලබන්නා වූ කාල පරිච්ඡේදයේදී විස්තීරණ ආදායම් ප්‍රකාශයට හඳුනාගැනේ. දැනටමත් දරා ඇති ආනයන වියදම් සඳහා ලැබෙන සහනාධාර ඒවා ලැබීම පිළිබඳ සෑහීමකට පත්විය හැකි තහවුරුවක් ලැබේ නම් ලැබිය යුතු සහනාධාර ලෙස හඳුනාගැනේ.

දේපල, පිරියත හා උපකරණ සඳහා ලැබුනු රාජ්‍ය ප්‍රදාන විලම්භිත රාජ්‍ය ප්‍රදාන ලෙස ජංගම නොවන වගකීම් වලට ඇතුලත් කර ඇත. ඒවා වත්කමේ අපේක්ෂිත ආයු කාලය තුළ සරල මාර්ග ක්‍රමයට විස්තීරණ ආදායම් ප්‍රකාශනයට හඳුනා ගනී.

2.15. වර්තමාන හා විලම්භිත බදු

කාල පරිච්ඡේදය සඳහා අදාළ බදු වියදම වර්තමාන බදු වියදම හා විලම්භිත බදු වියදමෙන් සමන්විත වේ. බදු වියදම විස්තීරණ ආදායම් ප්‍රකාශනයට හඳුනාගනු ලබන්නේ ඒවා අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ අයිතමයන් ලෙස හඳුනාගත් ප්‍රමාණය දක්වා පමණි.

වර්තමාන වසර සඳහා ආදායම් බදු වගකීම දේශීය ආදායම් පනතේ විධිවිධානයන්ට අනුකූලව ආදායම් බදු අධිකාරිය වෙත ගෙවීමට අපේක්ෂිත ප්‍රමාණය දක්වා හඳුනාගනු ලැබේ.

මූල්‍ය වාරතා වල වත්කම් හා වගකීම් වල ධාරණ අගයේ සහ බදු පදනම අනුව වත්කම් හා වගකීම් වල ධාරණ අගයේ ඇති වෙනස්වීම් මත විලම්භිත ආදායම් බදු හඳුනාගැනේ.

බදු සඳහා හඳුනාගත් සියලුම තාවකාලික වෙනස්වීම් මත විලම්භිත ආදායම් බදු වගකීම හඳුන්වා දී ඇත. එසේ නොවන්නේ ව්‍යාපාර සංයෝජනයක් නොවන ගණුදෙණුවකදී හා ගණුදෙණුව කරන අවස්ථාවේ දී ගිණුම්කරණ ලාභයට හෝ බද්ධට යටත් ලාභයට හෝ පාඩුවට බලනොපාන මූලිකව වත්කමක් හෝ වගකීමක් හෝ විලම්භිත බදු වගකීම සිදුවන අවස්ථාවේ දීය. වත්කම උපලබ්ධි වූ විට එකී වසර සඳහා බලපැවැත්වෙන්නා වූ බදු අනුපාතය පදනම් කරගෙන හා ප්‍රඥප්ති කල හෝ පසුව මූල්‍ය තත්ව ප්‍රකාශන දිනය වන විට බලපැවැත්වෙන බදු නීති මත විලම්භිත ආදායම් බදු වගකීම හෝ වත්කම හඳුනාගනී.

ප්‍රවර්ථන ආදායම් බදු වගකීම් වලට වෙරෙහිව ප්‍රවර්ථන බදු වත්කම් හිලව් කිරීමට නෛතිකව පැනවූ අයිතියක් ඇත්නම් ද විලම්භිත ආදායම් බදු එකම අඩු බදු අයකරන ඒකකයට හෝ එකම බදු අධිකාරියට සම්බන්ධ නම්ද විලම්භිත ආදායම් බදු වත්කම් හා විලම්භිත ආදායම් බදු වගකීම් හිලව් කරනු ලැබේ.

2.16. සේවක ප්‍රතිලාභ

සමාගම අර්ථ ප්‍රතිලාභය හා නිර්වචනය කරන ලද දායක සැලසුම් දෙකම ඇත.

(අ) නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත දායකත්ව සැලසුම් පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් වන අතර, සමාගම විසින් ස්ථාවර දායකත්වයක් වෙනත් ආයතනයකට ඒ වෙනුවෙන් සපයයි. සමාගමට මෙම දායකත්වයන් සම්බන්ධයෙන් හා ඒවා ගෙවීම සම්බන්ධයෙන් තවදුරටත් නීතිමය හෝ වෙනත් ආකාරයක බැඳීමක් නොමැත.

සමාගම සේවක භාරකාර අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙනුවෙන් පිළිවෙලින් 15% හා 3% ප්‍රමාණයන් සේවක දළ වැටුපට අනුව ගෙවයි.

(ආ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යනු පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුමකි. නිශ්චිත දායකත්ව සැලසුම් ගණයට අයත් නොවන මූල්‍ය තත්ව ප්‍රකාශ දිනයට මූල්‍ය ප්‍රකාශනයන් තුළ නිශ්චිත ප්‍රතිලාභ සම්බන්ධයෙන් දක්වා ඇති වගකීම් හඳුනාගෙන ඇත්තේ එම නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වගකීමෙහි වර්තමාන අගයයි. මූල්‍ය තත්ව ප්‍රකාශ දිනට නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වගකීම සුදුසුකමුලත් ජීවගණවරයෙකු ලවා පුරෝකතනය කරන ලද ඒකක බැර ක්‍රමය භාවිතා කරමින් තක්සේරු කර ඇත. ජීව ගණන තක්සේරු ක්‍රමය තුළ වට්ටම් අනුපාතිකය

සම්බන්ධව සිදුකරන උපකල්පනයන් සේවක වැටුප් වර්ධක අනුපාතිකයන් හා සේවකයන්ගේ ඉතිරි සේවා කාලය යන දෑ අන්තර්ගත වේ. මෙම සැලසුමෙහි පවත්නා දිගුකාලීන ස්වභාවය හේතු කොටගෙන තක්සේරු අගයන් තුළ සැලකිය යුතු අවිනිශ්චිතතාවයන් අන්තර්ගත වන අතර ඒවා වාර්තා වූ කාල පරිච්ඡේදයේ විස්තීරණ ආදායම් ප්‍රකාශයට හඳුනා ගැනේ.

එම වගකීම බාහිරව ආයෝජනය කර නොමැත.

(ඇ) කෙටිකාලීන සේවක ප්‍රතිලාභ

සේවකයන් විසින් සපයනු ලබන සේවයට ගෙවීමට බලාපොරොත්තු වන වටිනාකම වට්ටම් නොකර වාර්තා කරයි.

2.17. වෙන්කිරීම් හා අසම්භාව්‍ය වගකීම්

පසුගිය සිද්ධීන් නිසා ආර්ථික ප්‍රතිලාභ ගලා යාමක් හෝ එම ප්‍රමාණය ගැන සෑහීමකට පත්විය හැකි අකාරයෙන් ගණනය කළහැකි විට එම වගකීම පියවීම සඳහා නීතිමය හෝ වෙනත් ආකාරයක බැඳීමක් ඇත්නම් ඒවා මෙහෙයුම් වියදම් ලෙස හඳුනාගැනේ.

වාර්තා කරන දිනයේදී වෙන්කිරීමක් පියවීම සඳහා ඇති වර්තමාන බැඳීම නිවැරදිව සෑහීමකට පත්විය හැකි සාධක මත පදනම්ව අවධානම හා අසම්භාව්‍යතාවයන් ඇතුලත්ව වෙන්කිරීම සඳහා ගැනේ.

සියළුම අසම්භාව්‍ය වගකීම් මූල්‍ය වාර්තා සඳහා වන සටහන් තුළ දක්වා වාර්තා කර ඇති අතර ඒවා පියවීම සඳහා අවශ්‍ය වන ආර්ථික ප්‍රතිලාභයන් හෝ ප්‍රමාණය නිශ්චිත හෝ විශ්වාසදායක ලෙස මැන දැක්වීමක් කළ නොහැකි අසම්භාව්‍ය වගකීම් මූල්‍ය වාර්තා තුළ හඳුනා නොගන්නා අතර හෙලිදරව් කිරීමක් පමණක් සිදු කරනු ලබයි.

2.18. ආදායම් හඳුනා ගැනීම

ලැබිය යුතු හා ලැබුණු සහනාධාර වටිනාකම සහ භාණ්ඩ විකිණීමෙන් පෙන්නුම් කරන ලැබිය යුතු ප්‍රමාණයන්ය. විකතු කළ අගය මත බද්ධ (වි. අ. බ.) හා ජාතිය ගොඩනැගීමේ බද්ධ (ජා. ගො. බ.) අඩු කිරීමෙන් ආදායම් හඳුනා ගනී. අනාගත ආර්ථික ප්‍රතිලාභයන්ගේ ප්‍රමාණය නිශ්චිත හෝ විශ්වාස දායක ලෙස මැන දැක්වීමෙන් කළ හැකි වීම සමාගම ආදායම් හඳුනාගනී.

ආදායම හඳුනා ගැනීමේ ප්‍රධාන ආකාරයන් පහත පරිදි වේ.

(අ) පොහොර විකිණීම

සමාගම සෘජු සහ මිශ්‍ර පොහොර ආනයනය කර තොග හා සිල්ලර වශයෙන් විකිණීම කරයි. භාණ්ඩ සම්බන්ධ ප්‍රධාන අවදානම් සහ ප්‍රතිලාභ පාරිභෝගිකයාට මාරුවෙන අවස්ථාවේදී එනම්, ගබඩාවෙන් භාණ්ඩ නිකුත් කරනු ලබන අවස්ථාවේදී ආදායම හඳුනා ගනී.

(ආ) පොළී ආදායම

සඵල පොළී අනුපාතිකය භාවිතා කර පොළී අවදානම හඳුනා ගනී.

(ඇ) කුලී ආදායම

කල්බදු ගිවිසුමට අනුව උපචිත පදනමට කුලී ආදායම හඳුනා ගනී.

(ඈ) දේපල, පිරියත හා උපකරණ ඉවත් කිරීමේ ලාභ හා පාඩු

දේපල, පිරියත හා උපකරණ වල ධාරණ අගවන් ඉවත් කිරීමෙන් ලැබෙන වටිනාකමත් සන්සන්දනය කර විස්තීරණ ආදායම් ප්‍රකාශයට ලාභය හෝ පාඩුව හඳුනා ගනී.

(ඉ) අනෙකුත් ආදායම්

අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

2.19. වියදම්

වාර්තා කරන කාල පරිච්ඡේදයේ ලාභය ගණනය කිරීමේදී මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා දායක වූ සියළුම වියදම් සලකා බලයි.

2.20. ශේෂ පත්‍ර දිනයෙන් පසු වියදම්

ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදු වූ සියළුම වැදගත් සිද්ධීන් සලකා බලා අවශ්‍ය අවස්ථා වල කරන ලද ගැලපීම් හෝ අනාවරණයන් මෙම ප්‍රකාශනය සඳහා වන සටහන් වල දක්වා ඇත.

2.21. වගකීම්

වාර්තාකරණ දිනය මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගත යුතු හා ගැලපිය යුතු සියලුම වගකීම් මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් තුළ දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

2.22. වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු හා උපකල්පන

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකාරිත්වය විසින් වත්කම්, වගකීම්, ආදායම්, වියදම් මැනීම සඳහා පවතින තොරතුරු විනිශ්චය කිරීම, ඇස්තමේන්තු සකස් කිරීම සහ උපකල්පනයන් සිදු කරයි.

2.22.1. පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගමනය කිරීමේ දී විශේෂ විනිශ්චයන් කරනු ලබන අතර ඒවා මූල්‍ය වාර්තා වලට විශේෂිත බලපෑමක් ඇති කරයි.

(අ) විලම්භිත බදු වත්කම් හඳුනා ගැනීම

විලම්භිත බදු වත්කම් භාවිතා කළ හැකි අනාගත බදුවන ආදායමේ තක්සේරුව මත විලම්භිත බදු වත්කම් ප්‍රමාණය තීරණය වේ.

2.22.2. වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් හඳුනා ගැනීමේදී සහ මැණීමේදී විශේෂිත බලපෑමක් කරන ඇස්තමේන්තු සහ නිගමනයන් පහත පරිදි වේ.

(අ) ක්ෂය කළ හැකි වත්කම් ඵලදායී ජීව කාලය

අපේක්ෂිත භාවිතය මත කළමනාකාරිත්වය විසින් සෑම වාර්තාකරණ දිනයකටම ක්ෂය කලහැකි වත්කම් වල ඵලදායී ජීවකාලය පිළිබඳව වන ඇස්තමේන්තු නැවත විමසා බලයි. තාක්ෂණික යල්පැනීම් හේතුකොට ගෙන ඇස්තමේන්තු වල සිදුවන අවිනිශ්චිතතාවයන් නිසා මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණ වල ඵලදායී ජීවකාලය පිළිබඳ වෙනස් වීම් සිදුවිය හැක.

(ආ) විශ්චිත ප්‍රතිලාභ සැලසුම්

ආයු ගණක පදනම මත භාවිතා කළ සාධක රාශියකගේ නිගමනයන් මත නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල වර්තමාන අගය රඳා පවතී. මෙම උපකල්පනයන් සහ වට්ටම් අනුපාතය භාවිතා කරමින් ශුද්ධ පිරිවැය හා බැඳීම තීරණය කරයි.

2.23. නිකුත් කර ඇතිමුත් ක්‍රියාත්මක නොවූ ප්‍රමිත

